කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

கமத்தொழில், கிராமிய பொருளாதார அலுவல்கள், கால்நடை அபிவிருத்தி, நீர்ப்பாசனம், மீன்பிடி மற்றும் நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு

**Ministry of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries & Aquatic Resources Development**



# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயற்திறன் அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

## වාරිමාර්ග අංශය
## நீர்ப்பாசனப் பிரிவு
## Irrigation Sector

# 2018

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග
සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

වාරිමාර්ග අංශය

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper
using  wood free pulp which is made from 100% post consumer waste paper
(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)

Recycling one ton of paper saves
17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

We encourage you to recycle this Document after use.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | දැක්ම | 01 |
| 2. | මෙහෙවර | 01 |
| 3. | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් | 01 |
| 4. | අමාත්‍යාංශය ශීර්ෂ 198 හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශීර්ෂ 282 යටතේ වියදම් සම්බන්ධ පුරෝකථන අගයට එරෙහි සත්‍ය අගය | 02 - 16 |
| 5. | විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් කාර්යසාධනය | |
| අ. | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) | 17 - 26 |
| ආ. | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය | 27 |
| ඉ. | පහළ මල්වතු ඔය බහුකාර්යය ජලාශ ව්‍යාපෘතිය | 28 - 30 |
| ඊ. | කළුගඟ වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (කින්නියා කන්තලේ) | 31 |
| උ. | භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය | 32 |
| ඌ. | ඵලදායීතාවය ඉහළ නැංවීමේ හා වාරිමාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP) | 33 - 35 |
| එ. | ශක්‍යතා අධ්‍යයන | 36 - 38 |
| 6. | ක්‍රියාත්මක කරනු ලබන ආයතන යටතේ ව්‍යාපෘති/වැඩසටහන් වල කාර්යසාධනය | |
| අ. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 39 - 75 |
| ආ. | වාරිමාර්ග කළමනාකරණ අංශය | 76 - 94 |
| ඉ. | ජල සම්පත් මණ්ඩලය | 95 - 102 |
| 7. | අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රගතිය | 103 - 104 |

## 1. අමාත්‍යාංශයේ දැක්ම

තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුලින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම

## 2. අමාත්‍යාංශයේ මෙහෙවර

ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුලින් බහුවිධ අවශ්‍යතා ඉටු කරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවත්ම සැලසීම

## 3. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම, සමාලෝචනය හා ඇගයිම.
2. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය
3. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුලු ව වාරිමාර්ග පද්ධති හා ගංගා ද්‍රෝණි කළමනාකරණය
4. ජල මුලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරිම.
5. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන් කිරිම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරීම.
6. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැලැක්වීමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරිම සඳහා උපායමාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම.
7. ගොඩබිමට කරදිය ගලා ඒම වැලැක්විමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම.
8. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.
9. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.
10. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.
11. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.
12. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

## 4. අමාත්‍යාංශය ශීර්ෂ 198 හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශීර්ෂ 282 යටතේ වියදම් සම්බන්ධ පුරෝකථන අගයට එරෙහි සත්‍ය අගය

| | | | |
|---|---|---|---|
| ආකෘතිය | A | විසර්ජන ගිණුම | ශීර්ෂ 198 |
| ආකෘතිය | B | ආදායම් ගිණුම | ශීර්ෂ 282 |
| ආකෘතිය | C | අත්තිකාරම් ගිණුම | |

**CATEGORY : APROPRIATION ACCOUNT Head 198 Form - A**

| Description | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | Budgeted | Actual | | Budget | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| **Programme Title and No.** | | | | | | | | | | | | |
| Operational Activities 01 | | | | | | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Minister office 01 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 4,433 | 4,433 | 11,590 | 0 | 391 | | | | | | | |
| Other Recurrent | 10,245 | 9,974 | 13,158 | 271 | 1,347 | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Administration & Establishment Services 02 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 64,383 | 63,757 | 87,195 | 626 | 1,255 | | | | | | | |
| Other Recurrent | 227,027 | 225,227 | 239,867 | 1,800 | 3,553 | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| State Minister's Office 11 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 12,600 | 11,313 | 11,893 | 1,287 | 775 | | | | | | | |
| Other Recurrent | 11,210 | 10,663 | 10,505 | 547 | 1,147 | | | | | | | |
| | | | | | | | | | | | | |
| **Total** | **329,898** | **325,367** | **374,208** | **4,531** | **8,468** | | | | | | | |

**CATEGORY : APROPRIATION ACCOUNT** **Head 198** **Form - A**

| Description | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | Budgeted | Actual | | Budget | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| **Programme Title and No.** | | | | | | | | | | | | |
| Development Activities 02 | | | | | | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Inter provincial irrigation Development Programmes 03 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 129,500 | 123,729 | 124,622 | 5,771 | 1,062 | | | | | | | |
| Other Recurrent | 29,470 | 23,298 | 25,421 | 6,172 | 1,087 | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Irrigation Institutions & Development Programmes 04 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 18,800 | 18,444 | | | | | | | | | | |
| Other Recurrent | 4,900 | 4,419 | | | | | | | | | | |
| | **182,670** | **169,890** | **150,043** | **11,943** | **2,149** | | | | | | | |

CATEGORY : APROPRIATION ACCOUNT 198 Form - A

| Description | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | Budgeted | Actual | | Budget | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| **Capital Expenditure** | | | | | | | | | | | | |
| Operational Activities 01 | | | | | | | | | | | | |
| Minister office 01 | 2,500 | 1,356 | 42,849 | 1,144 | 2,830 | | | | | | | |
| Administration & Establishment Services 02 | 40,763 | 27,258 | 62,088 | 13,505 | 6,260 | | | | | | | |
| State Ministers Office 11 | 2,500 | 1,697 | 43,059 | 803 | 2,824 | | | | | | | |
| Development Activities 02 | | | | | | | | | | | | |
| Inter provincial irrigation Development Programmes 03 | 13,415,896 | 7,305,978 | 5,176,678 | 6,109,918 | 4,335,835 | | | | | | | |
| Development programme of irrigation institutions 04 | | | | | 34,002 | | | | | | | |
| | | | | | | | | | | | | |
| **Total Expenditure** | **13,461,659** | **7,336,289** | **5,324,314** | **6,125,370** | **4,381,751** | | | | | | | |

**CATEGORY : APPROPRIATION ACCOUNT** **FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Programme 01 - Operational Activities Project 01 – Minister's Office** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 4,433 | 4,433 | 11,590 | 0 | 391 | | | | | | | |
| Other Recurrent | 19,111 | 18,840 | 13,158 | 271 | 1347 | | | | | | | |
| **Total** | **23,544** | **23,273** | **24,748** | | **1,738** | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 250,000 | 0 | 250 | 250,000 | 0 | (a) | | | | | | |
| 2002 | 100,000 | 91,549 | 50 | 61,549 | 50 | (b) | | | | | | |
| 2003 | 1,150,000 | 1,086,037 | 1,150 | 63,963 | 0 | (c) | | | | | | |
| 2101 | 0 | 0 | 40,219.67 | 0 | 2,781 | (d) | | | | | | |
| 2102 | 500,000 | 91,417 | 679 | 408,583 | 0 | (e) | | | | | | |
| 2103 | 500,000 | 87,490 | 500 | 412,510 | 0 | | | | | | | |
| **Total** | **2,500,000** | **1,356,493** | **42,848.67** | **1,196,605** | **2,831** | | | | | | | |

(a) Rehabilitation & Improvements of Building & structures

(b) Rehabilitation & Improvements of Plant Machinery & Equipment

(d) Acquisition of Furniture & office equipment

(e) Acquisition of Building & structures

**CATEGORY : APPROPRIATION ACCOUNT** **FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variations Over | | Output Service/Goods | | Current Year Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02 - Development Activities Project 02 – Administration & Institutional Service** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 64,383 | 63,757 | 87,196 | 626 | 1,254 | | | | | | | |
| Other Recurrent | 227,027 | 225,227 | 239,867 | 1,800 | 3,553 | | | | | | | |
| **Total** | **291,410** | **28898,4** | **327,062** | **2,426** | **4,807** | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 3,000,000 | 1,741,399 | 18,637 | 1,258,601 | 136 | (a) | | | | | | |
| 2002 | 300,000 | 300,000 | 405 | 0 | 0 | (b) | | | | | | |
| 2003 | 1,300,000 | 1,227,579 | 2,950 | 72,421 | 1,200 | (c) | | | | | | |
| 2106 | 1,000,000 | 253,862 | 148 | 746,138 | 352 | (d) | | | | | | |
| 2102 | 1,200,000 | 1,115,639 | 4,365 | 84,361 | 118 | (e) | | | | | | |
| 2103 | 500,000 | 492,250 | 1,789 | 7,750 | 498 | (f) | | | | | | |
| 2401 | 3,463,000 | 3,298,016 | 1,669 | 164,984 | 1,331 | (g) | | | | | | |
| 2401-1 | 0 | 0 | 4,087 | | 63 | | | | | | | |
| **Total Expenditure** | **10,763,000** | **8,428,745** | **34,050** | **2,334,255** | **3,698** | | | | | | | |

(a) Rehabilitation & Improvements of Building & Structures

(b) Rep. to plant machinery & equipment

(c) Repairs to vehicles

(e) Acquisition of Furniture & office equipment

(f) Acquisition of plant machinery & equipment

(g) Staff Training

**CATEGORY : APPROPRIATION ACCOUNT** **FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | Actual 2017 | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Development Activities** | | | | | | | | | | | | |
| **Project 03 – Inter-provincial Irrigation development Programme** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 129,500 | 123,792 | 124,622 | 5,708 | 1,062 | | | | | | | |
| Other Recurrent | 29,470 | 23,298 | 25,421 | 6,172 | 1,087 | | | | | | | |
| **Total** | **158,970** | **14,7090** | **150,043** | **11,880** | **2,149** | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | | | | | | | | | | | | |
| 2002 | | | | | | | | | | | | |
| 2003 | | | | | | | | | | | | |
| 2102 | | | | | | | | | | | | |
| 2104 | | | | | | | | | | | | |
| 2105 | | | | | | | | | | | | |
| 2401 | | | | | | | | | | | | |
| 2502-14-(11) | | | | | | | | | | | | |
| 2502-16-(12) | | | | | | | | | | | | |
| 2502-16-(17) | | | | | | | | | | | | |
| 2502-18-(11) | | | | | | | | | | | | |
| 2105-8-(11) | | | | | | | | | | | | |
| 2502-11-(11) | | | | | | | | | | | | |
| 2502-8-(11) | | | | | | | | | | | | |
| 2502-9-(11 | | | | | | | | | | | | |
| **Total Expenditure** | | | | | | | | | | | | |

| CATEGORY : APPROPRIATION ACCOUNT | | | | | | | | | | | | | FORM : A |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | | |
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual | |
| **Programme 01- Operation Activities Project 11 – State Minister's Office** | | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | | |
| Personnel Emoluments | 12600 | 11313 | 11,893 | 1287 | 775 | | | | | | | | |
| Other Recurrent | 11210 | 10663 | 10,505 | 547 | 1,147 | | | | | | | | |
| **Total** | **23810** | **21976** | **22,398** | 1834 | 1922 | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | | |
| 2001 | 250,000 | | 622 | 250,000 | 11 | | | | | | | | |
| 2002 | 100,000 | 17,500 | 95 | 82,500 | 5 | | | | | | | | |
| 2003 | 1,150,000 | 1,140,362 | 1,121 | 9,638 | 29 | | | | | | | | |
| 2101 | 0 | 0 | 40,219 | 0 | 2,781 | | | | | | | | |
| 2102 | 500,000 | 96,232 | 500 | 403,768 | 0 | | | | | | | | |
| 2103 | 500,000 | 443,050 | 500 | 56,950 | 0 | | | | | | | | |
| **Total Expenditure** | **2,500,000** | **1,697,144** | **43,057** | **802,856** | **2,826** | | | | | | | | |

**CATEGORY : REVENUE ACCOUNTS HEAD 198 Form - B**

| Description | Financial Performance (Rs.In '000) | | | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Arears of Revenue As At 01.01.2014 | Current Year 2018 | | Previous Year Actual 2017 | Variation Over | | Arears of Revenue As At 01.01.200* | Output (Service /Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | | Budgeted | Actual | | Budget | Previous Year Actual | | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| Revenue Codes | | | | | | | No | | | | | | | |
| 20.02.01.01 | | 400 | 230 | 449 | 170 | 1,824 | | | | | | | | |
| 20.02.02.99 | | 800 | 224 | 373 | 576 | 1,023 | | | | | | | | |
| 20.03.99.00 | | 60 | 446 | 4,847 | -386 | 8,959 | | | | | | | | |
| 2003.04.00 | | | | | | - | | | | | | | | |
| 2004.01.00 | | | | | | 4,405 | | | | | | | | |
| **Total Revenue** | | **1,260** | **900** | **5,669** | **360** | **15,605** | | | | | | | | |

**CATEGORY : ADVANCE ACCOUNTS HEAD 198** **Form - C**

| Description | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year 2018 | | Previous Year Actual 2017 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | Prescribed | Actual | | Prescribed | Previous Year Actual | Type/Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| Type: | | | | | | | | | | | | |
| **Account Title & No:** | | | | | | | | | | | | |
| Advances to Public Officers | | | | | | | | | | | | |
| 198011 | | | | | | | | | | | | |
| Maximum Expenditure Limit | 28,000 | 13,525 | 20,948 | 14,475 | 8,474 | | | | | | | |
| Minimum Receipt Limit | 10,000 | 15,382 | 11,224 | 5,382 | 6,964 | | | | | | | |
| Maximum Debit Limit | 67,000 | 32,613 | 34,470 | 34,387 | 24,746 | | | | | | | |
| Maximum Liability | | | | | | | | | | | | |
| Financial Results | | | | | | | | | | | | |

**CATEGORY : APPROPRIATION ACCOUNT 282** **FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Programme 01- Operational Activities** | | | | | | | | | | | | |
| Project 01 – | | | | | | | | | | | | |
| **Administration & Establishment Services** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 546,690 | 539,049 | 520,017 | -510 | 19,032 | | % | 100 | 98.60 | 94.86 | -1.40 | 3.74 |
| Other Recurrent | 113,270 | 108,192 | 111,603 | 218,207 | -3,411 | | % | 100 | 95.52 | 98.67 | -4.48 | -3.15 |
| **Total** | 659,960 | 647,241 | 631,620 | 217,697 | 15,621 | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 30,500 | 25,911 | 29,664 | 500 | -3,752 | (a) | % | 100 | 84.96 | 98.88 | -15.04 | -13.92 |
| 2002 | 1,000 | 970 | 1,000 | 0 | -30 | (b) | % | 100 | 97.00 | 100.00 | -3.00 | -3.00 |
| 2003 | 5,800 | 5,677 | 5,271 | 202 | 407 | (c) | % | 100 | 97.88 | 94.16 | -2.12 | 3.72 |
| 2102 | 5,500 | 4,562 | 4,926 | 251 | -365 | (d) | % | 100 | 82.94 | 93.85 | -17.06 | -10.91 |
| 2104 | 0 | 0 | 0 | 0 | 0 | (e) | % | 0 | 0 | 0 | 0 | 0 |
| 2401 | 4,200 | 4,198 | 3,893 | 200 | 305 | (f) | % | 100 | 99.94 | 97.33 | -0.06 | 2.61 |
| **Total** | 47,000 | 41,318 | 44,753 | 1,153 | -3,435 | | | | | | | |

(a) Rehabilitation & Improvements of Building & Structures
(b) Rehabilitation & Improvements of Plant Machinery & Equipment
(c) Rehabilitation & Improvements of Vehicles
(d) Acquisition of Furniture & office equipment
(e) Acquisition of Building & structures
(f) Training & capacity Building

| CATEGORY : APPROPRIATION ACCOUNT | | | | | | FORM : A | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Year Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Programme 02- Development Activities** | | | | | | | | | | | | |
| **Project 02 –** | | | | | | | | | | | | |
| **Administration & Maintenance of Irrigation Schemes** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 2,312,772 | 2,045,010 | 2,065,561 | 2,467,937 | -20,552 | | | 100 | 88.42 | 83.70 | -11.58 | 4.72 |
| Other Recurrent | 142,938 | 139,130 | 132,781 | 150,810 | 6,350 | | | 100 | 97.34 | 88.05 | -2.66 | 9.29 |
| **Total** | 2,455,710 | 2,184,140 | 2,198,342 | 2,618,747 | -14,202 | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 2,245,000 | 1,971,363 | 1,785,636 | 1,755,771 | 185,726 | (a) | % | 100 | 87.81 | 92.64 | -12.19 | -4.83 |
| 2002 | 80,000 | 77,370 | 82,372 | -3,625 | -5,001 | (b) | % | 100 | 96.71 | 98.50 | -3.29 | -1.79 |
| 2003 | 35,000 | 31,075 | 34,940 | -1,319 | -3,865 | (c) | % | 100 | 88.78 | 96.20 | -11.22 | -7.42 |
| 2101 | 0 | 0 | 0 | 0 | 0 | (d) | % | 0 | 0 | 0 | 0.00 | 0 |
| 2102 | 15,000 | 6,711 | 18,411 | -3,853 | -11,699 | (e) | % | 100 | 44.74 | 97.66 | -55.26 | -52.92 |
| 2103 | 350,000 | 141,922 | 241,423 | 93,151 | -99,501 | (f) | % | 100 | 40.55 | 93.99 | -59.45 | -53.44 |
| 2104 | 52,000 | 43,206 | 36,338 | 44 | 6,869 | (g) | % | 100 | 83.09 | 69.94 | -16.91 | 13.15 |
| 2401 | 35,000 | 32,844 | 29,615 | 5,000 | 3,229 | (h) | % | 100 | 93.84 | 98.72 | -6.16 | -4.88 |
| 2502 | 0 | 0 | 0 | 0 | 0 | (i) | % | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2503 | 6,500 | 5,118 | 3,453 | 100 | 1,665 | (j) | % | 100 | 78.74 | 53.12 | -21.26 | 25.62 |
| 2505 | 6,000 | 5,367 | 3,779 | -3,098 | 1,588 | (k) | % | 100 | 89.45 | 64.05 | -10.55 | 25.40 |
| 2507 | 170,000 | 139,700 | 151,388 | | -11,688 | (l) | % | 100 | 82.18 | 87.46 | -17.82 | -5.28 |
| **Total Expenditure** | 2,994,500 | 2,454,677 | 2,387,355 | 1,842,173 | 67,322 | | | | | | | |

(a) Rehabilitation & Improvements of Building & Structures
(b) Rep. to plant machinery & equipment
(c) Repairs to vehicles
(d) Acquisition of vehicles
(e) Acquisition of Furniture & office equipment
(f) Acquisition of plant machinery & equipment
(g) Acquisition of Building & structure
(h) Staff training
(i) Other Investment
(j) Contingency services
(k) Procurement preparedness
(l) Research Development

| CATEGORY : APPROPRIATION ACCOUNT | FORM : A | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance (Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02 - Development Activities** | | | | | | | | | | | | |
| **Project 03 – Major Irrigation schemes** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| personnel Emoluments | | | | | | | | | | | | |
| Other Recurrent | | | | | | | | | | | | |
| **Total** | | | | | | | | | | | | |
| Capital Expenditure 2105 | 7,878,700 | 5,373,685 | 6,904,276 | -747,454 | -1,530,591 | (a) | % | 100 | 68.21 | 80.04 | -31.79 | -11.83 |
| **Total Expenditure** | 7,878,700 | 5,373,685 | 6,904,276 | -747,454 | -1,530,591 | | | | | | | |

**(a) Major Irrigation Scheme**

**CATEGORY : APPROPRIATION ACCOUNT** | **FORM : A**

| DESCRIPTION | Financial Performance (Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Development Activities** | | | | | | | | | | | | |
| Project 04 – | | | | | | | | | | | | |
| **Medium Irrigation schemes** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| personal Emoluments | - | - | - | - | - | | | | | | | |
| Other Recurrent | - | - | - | - | - | | | | | | | |
| **Total** | - | - | - | - | - | | | | | | | |
| Capital Expenditure 2105 | 555,000 | 393,445 | 262,428 | 188,533 | 131,017 | (a) | % | 100 | 70.89 | 71.61 | -29.11 | -0.72 |
| **Total Expenditure** | 555,000 | 393,445 | 262,428 | 188,533 | 131,017 | | | | | | | |

**(a) Medium Irrigation Scheme**

| CATEGORY : ADVANCE ACCOUNT | | | | | | FORM : C | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION : Public Officer's Advance Account | Financial Performance (Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output Actual | Variations over | |
| | Prescribe | Actual | | Prescribe | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Type** | | | | | | | | | | | | |
| **Account Tile & No.** | | | | | | | | | | | | |
| **282011** | | | | | | | | | | | | |
| Maximum expenditure | | | | | | | | | | | | |
| Limit | 260,000 | 236,330 | 208,971 | 50,000 | 27,359 | | % | 100 | 90.90 | 99.51 | -9.10 | -9 |
| Minimum Receipt Limit | 165,000 | 149,955 | 140,951 | 25,000 | 9,004 | | % | 100 | 90.88 | 100.68 | -9.12 | -9.80 |
| Maximum Debit Limit | 600,000 | 518,296 | 433,923 | 0 | 84,373 | | % | 100 | 86.38 | 72.32 | -13.62 | 14.06 |
| Maximum Liability | - | - | - | - | - | | | - | - | - | - | - |
| Financial results | - | - | - | - | - | | | - | - | - | - | - |

CATEGORY : REVENUE ACCOUNT

FORM : B

| DESCRIPTION : Public Officer's Advance Account | Financial Performance (Rs, in'000') | | | | | | | Physical Performance | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Arrears of Revenue as at 01-01-2018 | Current Year | | Previous Year Actual | Variations Over | | Arrears of Revenue as at 31-12-2018 | Output Service/Goods | | Current Years Output | | Previous Year Output Actual | Variations | |
| | | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | P |
| **Revenue codes** | | | | | | | | | | | | | | |
| **20.02.01.01** Rent on Government Buildings | - | 0 | 15,940 | 13,866 | -12,000 | 2,074 | | | % | 100 | 0.00 | 115.55 | 0.00 | |
| **20.02.02.99** Interest - Other | - | 17,000 | 19,284 | 16,529 | 2,500 | 2,755 | | | % | 100 | 113.44 | 110.06 | 13.44 | |
| **20.03.02.99** | - | 0 | 0 | 0 | -16,530 | 0 | | | % | 0 | 0 | 0 | 0 | |
| **20.03.04.00** | - | 0 | 0 | -45 | 0 | 45 | | | % | 0 | 0 | 0 | 0 | |
| **20.03.99.00** Other Receipts | - | 12,000 | 51,215 | 63,255 | -38,000 | -12,040 | | | % | 100 | 426.79 | 421.70 | 326.79 | |
| **20.04.01.00** | - | 0 | 106,565 | 92,379 | | 14,187 | | | % | 0 | 0 | 0 | 0 | |
| **20.03.01.00** | | 0 | 4 | | | 4 | | | % | 0 | 0 | 0 | 0 | |
| **20.03.03.02** | | 0 | 4,081 | | | 4,081 | | | % | 0 | 0 | 0 | 0 | |
| **20.06.02.01** | | 5,500 | 16,113 | | 5,500 | 16,113 | | | % | 0 | 0 | 0 | 0 | |
| **20.06.02.02** | | 0 | 428 | | | 428 | | | % | 0 | 0 | 0 | 0 | |
| **Total** | | **34,500** | **213,631** | **185,984** | **-58,530** | **27,647** | | | | | | | | |

# විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් කාර්යසාධනය

## අ. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP)

### 1. ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු

දේශගුණික විපර්යාස නිසා අනතුරට ලක් වී ඇති මිනිස් ජීවිත හා දේපල වල අවදානම අවම කිරීම සහ ව්‍යසනයන්ට සාර්ථකව මුහුණ දීමට රජයේ හැකියාව ශක්තිමත් කිරීම.

### 2. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම භාරව කටයුතු කරන්නේ වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයයි. ව්‍යාපෘතියේ ක්‍රියකාරකම් වාරිමාර්ග දෙපාර්තුමේන්තුව, මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වේ.

### 3. ව්‍යාපෘති මූල්‍ය ආයෝජනය

ව්‍යාපෘතිය සඳහා පූර්ණ මූල්‍ය දායකත්වය ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය විසින් දරනු ලබන අතර, මූලික ව්‍යාපෘතිය සඳහා ආයෝජන මුදල රුපියල් මිලියන 15,421ක් වන අතර අතිරේක ආයෝජනය සඳහා වූ මුදල රුපියල් මිලියන 6,880කි. ශ්‍රී ලංකා රජය විසින් රුපියල් මිලියන 270ක (ඇ.ඩො මිලියන 1.8) මුදලක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහභාගී වන ආයතන වල නිලධාරීන්ගේ දිරි දීමනා ගෙවීම සඳහා වෙන්කර ඇත. ව්‍යාපෘතියේ මුළු ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 152කි. (රු.මිලියන 21,102)

### 4. ව්‍යාපෘතියේ සංරචකයන්

මේ අනුව, ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති සංරචකය 4ක් යටතේ මූල්‍ය ආයෝජනය කරනු ලබයි.

#### 4.1. ව්‍යාපෘති සංරචක 01 - ජල ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කිරීම

මෙම සංරචකය යටතේ ව්‍යාපෘතිය තෝරාගත් ජලද්‍රෝණි 10ක විස්තීරණ ආයෝජන සැලසුම් සකස් කිරීම සඳහා ගංවතුර හා නියං තත්වයන්ගේ අවදානම් විශ්ලේෂණය කොට අනුකල්පිත සිදුවීම් වලට අනුකූලව ආදර්ශ මොඩලයන් සකස් කර ආයෝජන සැලසුම් සකස් කිරීමට ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.

මේ යටතේ සිදු කරනු ලබන විශ්ලේෂණ ක්‍රියාවලිය තුළින් අනාගතයේ දේශගුණික බලපෑම් වලට ඔරොත්තු දීමට හැකි ආයෝජන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය මූලික පදනම සකස් වෙනු ඇත. ඒ අනුව, ගංවතුර හා නියං තත්වයන් වල අවදානම අවම කරගැනීමටත්, ඒවා මැඩපැවැත්වීමටත් අවශ්‍ය තාක්ෂණික හැකියාව වැඩිදියුණු කරගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇති ආයතන වලට හැකිවේ.

#### 4.2. ව්‍යාපෘති සංරචක 02 - දේශගුණික විපර්යාස වලට ඔරොත්තු දෙන ජල ආශ්‍රිත යටිතල පද්ධති ඇති කිරීම

මෙම සංරචකය යටතේ ක්ෂණිකව වැඩිදියුණු කලයුතු දේශගුණික බලපෑම නිසා තර්ජනයට ලක්වී ඇති ප්‍රමුඛතාවයෙන් ඉහල;

1. වාරි පද්ධති වල ඇල වල්, ඉවුරු, ජල පාලක මෙවලම්, ගංවතුර පාලනය කරන වේලි සහ ජලය බෙදාහරින නිර්මිත පිළිසකර කිරීම සහ වැඩිදියුණු කිරීම,
2. ජල ගැලීම් නිසා සිදුවිය හැකි අනතුරුදායක මාර්ග පද්ධතීන් වල පාලම් සහ බෝක්කු වැඩිදියුණු කිරීම සහ එම මාර්ග වල අවදානමට ලක්ව ඇති බැවුම් ස්ථායීකරණය කිරීම,
3. නායයෑමේ තර්ජනයට ලක්වී ඇති පාසල් වල බෑවුම් ස්ථායිකරණය කිරීම සහ NBROහි තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම යනා දී සංරචයකන් සඳහා මූල්‍ය දායකත්වය ලබාදීම සිදු කෙරේ.

2014 වර්ෂයේ ඇති වූ අධික වර්ෂාපතනය නිසා සිදු වූ ජල ගැලීම් හා නායයාම් නිසා ව්‍යාපෘතිය යටතේ පිළිසකර කිරීම් සඳහා තෝරාගෙන තිබූ සමහර නිර්මිතයන් තව දුරටත් බාදනයට ලක්විය. තව ද, ඌව පළාත් සභාව යටතේ ඇති පාරවල් වල සමහර ස්ථාන නායයාමේ තර්ජනයට ලක්විය. එම නිසා ශ්‍රී ලංකා රජය හා ලෝක බැංකුව එක්ව සාකච්ඡා කර පිළිසකර කිරීමේ අවශ්‍යතාවය පුළුල් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබා දීමට ලෝක බැංකුව එකඟ විය. ඒ අනුව ඌව පළාත් සභාව යටතේ නායයාම් වලට තර්ජනය වී ඇති බැවුම් සහ වාරිමාර්ග දෙපාර්තුමේන්තුව සහ මහවැලි අධිකාරිය යටතේ අවශ්‍යතා පුළුල් වූ පිළිසකර කිරීම් සඳහා ඇ.ඩො මිලියන 42ක අතිරේක ණය මුදලක් ව්‍යාපෘතියට ලබා දෙන ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ මුළු ආයෝජනය රු.මිලියන 152 කි. (රු මිලියන 20,262)

### 4.3. ව්‍යාපෘති සංරචක 03 - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් හා ඇගයීම්

මෙම සංරචකය යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇති ආයතන අතර සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, තාක්ෂණික සේවය සැපයීම, ප්‍රසම්පාදන කටයුතු සඳහා පහසුකම් සැපයීම, මූල්‍ය කළමනාකරණය කිරීම හා සමස්ථ ව්‍යාපෘතියේ මෙහෙයවීම හා ඇගයීම සිදු කරනු ලබයි.

### 4.4. ව්‍යාපෘති සංරචක 04 - හදිසි අවිනිශ්චිත තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම

මෙම සංරචකය යටතේ 2017 මැයි මස සිදු වූ අධික ගංවතුර තත්ත්වය නිසා හානියට පත් වූ කළුතර, ගාල්ල, හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්ක 4හි තෝරා ගත් මාර්ග වල අබලන්ව ඇති කොටස් තිබූ තත්ත්වයට වඩා වැඩිදියුණු කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා ඇ.ඩො මිලියන 3ක් (රු.මිලියන 534)ක් පමණ ආයෝජනය කරනු ලබයි.

## 5. ව්‍යාපෘතියේ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද්දේ 2014 අගෝස්තු මස 05 වන දින වන අතර එතැන් සිට 2019 ජනවාරි 31 වන දින දක්වා මූලික ව්‍යාපෘතිය රු.මිලියන 9,735.5ක මුදලක්, මුළු ආයෝජනය වූ රු.මිලියන 15,427ක මුදලින් වැයකර ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය, මූලික ව්‍යාපෘතියේ මුළු ආයෝජනයට සාපේක්ෂව 63%ක් වන අතර භෞතික ප්‍රගතිය 74%කි. මෙයට අමතරව ව්‍යාපෘතියේ අතිරේක ප්‍රතිපාදන යටතේ මුළු මුදල වූ රු.මිලියන 6,880න් රු.මිලියන 2,357.5ක් වැයකර ඇත. එය ප්‍රතිශතයක් ලෙස 34%කි. එහි භෞතික ප්‍රගතිය 58%කි. මෙම මුදල් මූලික වශයෙන් වැයකර ඇත්තේ පිලිසකර කිරීමේ කොන්ත්‍රාත්කරුවන් නිමකල පිළිසකර කිරීම් සඳහා ගෙවීමට සහ ක්‍රියාත්මක කරන ආයතන වල හැකියාව වර්ධනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර, වාහන, පරිගණක යන්ත්‍ර සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමට වේ.

මේ වනවිට සමස්ථ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇති පිළිසකර කිරීමේ කොන්ත්‍රාත්තු 580න් කොන්ත්‍රාත්තු 562ක් ප්‍රදානය කර ඇති අතර, ඒවායේ වටිනාකම රු.මිලියන 15,593කි. එම කොන්ත්‍රාත්තු සඳහා රු.මිලියන 9382 (60%) ක් Mobilization Advance සහ කොටස් වශයෙන් නිමකල වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් සඳහා නිදහස් කර ඇත. මෙම කොන්ත්‍රාත්තු අතරින් 179ක් ගොවි සංවිධාන මගින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත්තු (CP) වන අතර ඒවායේ වටිනාකම රු.මිලියන 244කි. තවත් කොන්ත්‍රාත්තු 352 ජාතික තරගකාරී ක්‍රමය (NCB) අනුව රු.මිලියන 14631 කොන්ත්‍රාත්තු වේ. ඉතිරිය කොන්ත්‍රාත් රු.මිලියන 42ක් වටිනා ජාතික මිලදී ගැනීමේ ක්‍රමය යටතේ (NS) ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු වේ.

තව ද හදිසි අවිනිශ්චිත තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට අනුව 2017 ගංවතුරෙන් හානි වූ කළුතර, ගාල්ල, රත්නපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල කොටස් අලුත්වැඩියාව සඳහා හඳුනා ගත් පැකේජ 29න් 18ක් රු.මිලියන 303.5කට ප්‍රදානය කර ඇති අතර, මේ වනවිට පැකේජ 4ක් අවසන් කර ඇත. ඒවායේ වටිනාකම රු.මිලියන 74.84කි.



ලෝක බැංකුවෙහි නියෝජිතයින් සමඟ ව්‍යාපෘතියේ ප්‍රගතිය විශ්ලේෂණය කිරීමේ සාකච්ඡාව

# 6. ව්‍යාපෘති ප්‍රගතිය

## 6.1 ජල ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කිරීමේ ප්‍රගතිය

දේශගුණික විපර්යාස නිසා සිදුවන ගංවතුර සහ නියඟයන්ගේ අවදානම විසඳීම සඳහා දීර්ඝකාලීන විසඳුම් ලෙස තෝරාගත් ජලද්‍රෝණි 10 සඳහා ආයෝජන සැලසුම් සකස් කිරීම බ්‍රිතාන්‍යයේ ඇට්කින්ස් ආයතනයේ විශේෂඥවරුන් දේශීය කාර්ය මණ්ඩල සමඟ එක්ව සැලසුම් සකස් කිරීම සිදුකරනු ලබයි.

විදේශීය විශේෂඥ කණ්ඩායම විසින් ජලද්‍රෝණි 6 ක් සඳහා ආයෝජන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලියට අනුව ඒකාබද්ධ ගංවතුර සහ නියං අවදානම හඳුනා ගැනීම, ඒවා කළමනාකරණය කිරීමේ සැලස්ම සහ ශක්‍යතා වාර්තා (Pre- Feasibility) සකස් කිරීම, රේඛීය ආයතන වලින් නිදහස් කළ නිලධාරීන් සමඟ එක්ව කොන්ත්‍රාත්තුවේ පළමු අදියර යටතේ සිදුකරනු ලබයි. ඉතිරි ජලද්‍රෝණි 4 සඳහා ආයෝජන සැලසුම් සකස් කිරීම දේශීය නිලධාරීන් විසින් ඇට්කින්ස් ආයතනයේ විශේෂඥ කණ්ඩායමේ අධීක්ෂණය යටතේ පිළියෙල කරනු ලබයි. ද්‍රෝණි 10 සඳහාම පිළියෙළ කරන ලද පෙර ශක්‍යතා වාර්තා පදනම් කරගෙන තෝරාගත් යෝජනාවන් 8ක් සඳහා අවශ්‍ය ශක්‍යතා වාර්තා සකස් කිරීම සිදුකල යුතු වේ.

මේ සඳහා ඇට්කින්ස් ආයතනයේ සේවාව ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ දෙවන අදියර ආරම්භ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත්තත් ඔවුන්ගේ පළමු අදියරේ සිදු කිරීමට එකඟ වූ කාර්යන් නිසි වේලාවට අවසන් කිරීමට අපොහොසත් වීම නිසා මෙම අධ්‍යනයන්ගෙන් 3ක් පමණක් ඔවුන් සමග සිදු කිරීමටත්, ඉතිරිය තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් විශේෂඥ සේවාව ලබා ගැනීම සඳහා වෙනත් අමාත්‍ය මණ්ඩල දැනුවත් කිරීමේ සටහන් යොමු කර ඇත. ඉහත සඳහන් අධ්‍යනයන් 3 සඳහා ඇට්කින්ස් ආයතනයේ විශේෂඥ සේවාව ලබාගැනීම සඳහා කොන්දේසි සහ අවශ්‍යතා හඳුනා ගැනීමේ සාකච්ඡා සිදුකරමින් පවතී. මෙම අධ්‍යයනයන් ඔවුන්ගේ කොන්ත්‍රාත්තුවේ අදියර දෙක යටතේ සිදුකිරීමට යෝජිතය.

### ව්‍යාපෘති සංරචක 01 හි ප්‍රගතිය

ද්‍රෝණි 10ක් සඳහා සැලසුම් සකස් කිරීම පළමු අදියර යටතේ එංගලන්තයේ ඇට්කින්ස් ආයතනය විසින් දේශීය නිලධාරින් සමග එක්ව, පූර්ව ශක්‍යතා වාර්තා කැළණි, අත්තනගලු, මහවැලි, මල්වතු ඔය, ගිං සහ නිල්වලා ද්‍රෝණි සඳහා සකස් කරමින් පවතී. මේ යටතේ පරිගණක රාමුව (Computational Framework) කැළණි, අත්තනගලු, ගිං, නිල්වලා, මහවැලි සහ මල්වතු ඔය ජල ද්‍රෝණි සඳහා අවසන් කර ඇත. තව ද, ගංවතුර සහ නියං විශ්ලේෂණය කිරීමේ වාර්තා පිළියෙල කිරීම කැළණි, අත්තනගලු, ගිං සහ නිල්වලා ද්‍රෝණි සඳහා අවසන් කර ඇත. මෙම වාර්තා පිළියෙළ කිරීම මල්වතු ඔය සඳහා 98%ක් අවසන් කර ඇත. පෙර ශක්‍යතා අධ්‍යන වාර්තා කැළණි සහ මුන්දෙනිඅරු සඳහා 80%ක් අවසන් කර ඇති අතර ගිං සහ නිල්වලා සඳහා 50%ක් අවසන් කර ඇත.

කැළණි, අත්තනගලු, මහවැලි සහ මුන්දෙනිආරු සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් සහ උපාය මාර්ගික සමාජ ඇගයීම සිදුකිරීම යටතේ කැළණි හා මුන්දෙනි ආරු සඳහා එම වාර්තා අවසන් කර ඇත.

2016දී ඇතිවූ ගංවතුර නිසා විශාල වශයෙන් හානි සිදුවූ කැළණි ගංවතුර අවම කිරීමට ප්‍රමුඛතාවය ලබාදීමට රජයෙන් කල ඉල්ලීමට අනුව පෙර ශක්‍යතා වාර්තා පදනම් කර ගනිමින් කැළණි පහල ගංගා නිම්නය සඳහා ගංවතුර වැළක්වීමේ යෝජනා යටතේ ගඟ දෙපස ගංවතුර පාලන බැම් මෝදර සිට හංවැල්ල දක්වා ඉදිකිරීමටත් ඉහල ජල පෝෂක ප්‍රදේශයේ ජලාශ 2ක් ඉදිකර වැසි ජලය එම ජලාශ වල ගබඩා කිරීමටත් යෝජනා වී ඇත. මෙය ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ සිදු කෙරේ. ව්‍යාපෘතියේ දෙවන අදියර පියවර 2ක් යටතේ සිදු වේ. මේ සඳහා රජය සහ ලෝක බැංකුව එකඟතාවයකට පැමිණ ඇත. පළමු පියවර හංවැල්ලේ සිට කඩුවෙල දක්වා ක්‍රියාත්මක කෙරේ.

කැළණි ද්‍රෝණියේ පහල නිම්නයේ ගංවතුර පාලනයට සහ ඉන් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා ඇට්කින්ස් විශේෂඥ කණ්ඩායම විසින් මූලික ශක්‍යතා වාර්තාවක් සකස් කර ඒ සඳහා සියලුම රේඛීය ආයතන වල, පාර්ශවකරුවන්ගේ සහ ප්‍රජාවගේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව අවසන් වාර්තාව පිළියෙළ කරමින් පවතී.

කැළණි පහල ගංගා ද්‍රෝණියේ ගංවතුර පාලනය සඳහා පහල කැළණි ජල ද්‍රෝණියේ හංවැල්ලේ සිට මෝදර දක්වා ගංවතුර පාලන බැම් ඉදිකිරීමටත්, ඉහල ජල ධාරා ප්‍රදේශයේ බහුකාර්ය ජලාශ 2ක් වී ඔය සහ රුකාසල් යන ස්ථානවල ඉදිකිරීමටත් යෝජනා කර ඇත. මෙයට අමතරව මුන්දෙනිආරු ජල ද්‍රෝණියේ සිදුවන ගංවතුර තර්ජනය අවම කිරීම සඳහා ගංවතුර පාලන බැම් ඉදි කිරීම සඳහා ලෝක බැංකුවේ මූල්‍ය දායකත්වය ලබා දීමට එකඟ වී ඇත. එම නිසා ව්‍යාපෘති යෝජනාව සකස් කිරීමට අවශ්‍ය මූලික අධ්‍යනයන් සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම විදේශ සම්පත් දෙපාර්තුමේන්තුවේ සහ ලෝක බැංකුවේ උපදෙස් මත ක්‍රියාත්මක කරන ලදී.

## 6.2. ව්‍යාපෘතියේ දෙවන අදියර CRIP II සඳහා පෙර සූදානම් වීමේ ප්‍රගතිය

මේ සඳහා අවශ්‍ය මූලික අධ්‍යනයන් යටතේ පහත සඳහන් කාර්යන් සිදුකරමින් පවතී.

A. පෙර ශක්‍යතා වාර්තාව පදනම් කර ගනිමින් කැළණි පහල ගංගා නිම්නය සඳහා යෝජනා කර ඇති ගඟ දෙපස ගංවතුර පාලන බැම් හංවැල්ල සිට කඩුවෙල දක්වා ඉදිකිරිමට අවශ්‍ය සවිස්තරාත්මක සැලසුම් (detailed design) සකස් කිරීම සඳහා අවශ්‍ය භූවිද්‍යාත්මක සමීක්‍ෂණ (Geological investigation) ඇට්කින්ස් විශේෂඥවරුන්ගේ අධීක්ෂණය යටතේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිලධාරීන් විසින් ගඟ දෙපස මිහිවිහිදුම් (Borehole) ස්ථාන 30ක සිදුකර අවසන් කර ඇත.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම නිසා බලපෑමට ලක්වන ගඟ දෙපස සිටින ජනතාව සහ දේපල පිළිබඳ සමාජ ආර්ථික බලපෑම පිලිබඳ සමීක්‍ෂණයක් සිදුකර අවසන් කර ඇති අතර, නැවත පදිංචි කිරීමේ සමීක්ෂණය කොළඹ විශ්ව විද්‍යාලය මගින් හංවැල්ලේ සිට කඩුවෙල දක්වා කොටසේ බලපෑමට ලක්වන සියලුම පවුල් සහ දේපල පිළිබඳව අධ්‍යනයන් පදනම් කරගනිමින් නැවත පදිංචි කිරීමේ සැලැස්ම සකස් කර ලෝක බැංකුවට ඉදිරිපත් කර ඇත. මෙම දත්ත පදනම් කරගනිමින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම (RAP) හංවැල්ල සහ කඩුවෙල අතර කොටස සඳහා සකස් කරනු ලැබේ.

ඒ අනුව සුදුසුකම් සඳහා හිමිකම් පෑමේ අවසාන දිනය ලෙස 2018 සැප්තැම්බර් මස 24 වන දින ප්‍රකාශයට පත්කර ඇත.

ව්‍යාපෘතියේ දෙවන අදියර හෙවත් දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන (ResMp) යටතේ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික අධ්‍යනයන් ව්‍යාපෘතිය විසින් මේ වන විටත් සිදුකරමින් පවතී. ව්‍යාපෘතියේ දෙවන අදියර හෙවත් ResMp අදියර 3ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහි පළමු අදියර යටතේ ගංවතුර පාලන බැම් හංවැල්ලේ සිට කඩුවෙල දක්වා ඉදිකිරීමටත් ඒ හා සමගාමීව අතු ගංගා ප්‍රධාන ගඟට සම්බන්ධවන ස්ථානවල පොම්පාගාර ඉදිකිරීමටත්, අඹතලේ පොම්පාගාරයට ජලය සැපයීම සඳහා ඉදිකර ඇති කරදිය බැම්ම (Salinity Barrier) ඉදිකිරීමටත් කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තුමේන්තුව කාලගුණික පුරෝකථන මධ්‍යස්ථාන 2ක් ඉදිකිරීමටත්, ඉහල ජල ධාරා ප්‍රදේශයේ ඉදි කරන ජලාශ 2 සඳහා සැලසුම් සකස් කිරීමත් සිදුකරනු ලබයි.

## 6.3. තොරතුරු සැපයීම, අධ්‍යනය සහ සන්නිවේදන(IEC) ක්‍රියාත්මක කිරීම

තොරතුරු සැපයීම අධ්‍යනය සහ සන්නිවේදන කිරීම සඳහා වූ වැඩසටහන ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සිටින සියලුම දේශපාලන අධිකාරිය, ප්‍රතිපත්ති සම්පාදකයින්, පරිපාලන නිලධාරීන්, බලපෑමට ලක්වන ජනතාව සහ ප්‍රතිලාභීන් දැනුවත් කිරීමට සහ ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය ලබා ගැනීමට විවිධ සන්නිවේදන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.මේ සඳහා අවශ්‍ය පොත් පිංචවල්,පත්‍රිකා සහ කාලින සගරාවක් ලෙස බැදි පවුර සඟරාව බෙදාහරිමින් දැනුම සහ අවබෝධය දෙනු ලබයි. තව ද "රකිමු ගංවතුරෙන් කැළණි ගඟේ පහල නිම්නය" නමින් කෙටි චිත්‍රපටි නිෂ්පාදනය කර එය දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන වැඩමුළුවල දී භාවිතා කරමින් විද්වතුන් සහ බලපෑමට ලක්වන ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමට සහ ඒවාට විසඳුම් ලබාදීම සඳහා සොබා සුරක්ෂා නැමති ප්‍රචාරාත්මක ගුවන්විදුලි වැඩසටහන් 24ක් ඉරිදා දිනවල නෙත් එෆ් එම් නාලිකාවේ 2018 ජූලි සිට දෙසැම්බර් දක්වා ප්‍රචාරය කරන ලදී. එයට අමතරව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වැඩමුළු 24ක් ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පවත්වන ලදී.

දැනුවත් කිරීමේ ක්‍රියාවලිය යටතේ මේ වන විට ජාතික මට්ටමේ වැඩමුළුවක් ටාජ් සමුද්‍රා හෝටලයේදී සහ දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු 2ක් ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ගම්පහ ලේකම් කාර්යාලයේ දී සහ වැල්ලවත්ත සපයාර් හෝටලයේදී පිලිවෙලින් පවත්වන ලදී.

ඉන් අනතුරුව ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු හංවැල්ල, හෝමාගම, කඩුවෙල, දොම්පේ, බියගම යනාදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලදී.





බියගම පැවති ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන්

ප්‍රාදේශීය මට්ටමේ දේශපාලඥයින් දැනුවත් කිරීමේ වැඩමුළුව





හංවැල්ලේ සිට කඩුවෙල දක්වා කැලණි ගංවතුර පාලන බැම් ඉදි කිරීමට අවශ්‍ය භූ විද්‍යාත්මක සමීක්ෂණයට අනුව සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීමට මිහිවිහිදුම් සිදුකරන ආකාරය

## 6.4. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිපද්ධතිවල භෞතික වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය

වාරිමාර්ග දෙපාර්තුමේන්තුව මූලික ව්‍යාපෘතිය සහ අතිරේක ආයෝජනය යටතේ පැකේජ 429ක් රු මිලියන 7979.9ක් වැය කර පිළිසකර කිරීමට කටයුතු කරමින් පවතී. මෙයින් බොහොමයක ඉදිකිරීම් අවසන් කර ඇත.




දැනට ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්තු බෙහොමයක් යටතේ ඇළවල් වල ඉවුරු පිළිසකර කිරීම, බස්නාවන් පවිත්‍ර කර පුළුල් කිරීම, ඇලවල් පුළුල් කිරීම, ජල පාලන ගේට්ටු පිලිසකර කිරීම සහ අනෙකුත් මෙවලම් අලුත්වැඩියා කිරීම යනාදී කාර්යන් සිදුකරනු ලබයි. මේ වන විට රු.මිලියන 4,837ක වටිනාකමින් යුත් පැකේජ 121ක් ක්‍රියාත්මක තත්වයේ ඇති අතර රු.මිලියන 3,143ක වටිනාකමින් යුත් පැකේජ 297ක වැඩ අවසන් කර ඇත.

මෙම පැකේජයන් යටතේ 2010 සිට 2014 දක්වා ඇති වූ ගංවතුර සහ නියඟයන්ගේ බලපෑම් නිසා විනාශ වූ ඇල පද්ධතීන්, මෙවලම්, කෘෂිමාර්ග ගංවතුර පාලන බැම්, අපවහන ඇලවල් සහ අමුණු සහ ගේට්ටු පිළිසකර කිරීම සිදු කරනු ලබයි.








ඉලුක්වැව අමුණ සඳහා ගියර් මගින් ක්‍රියාත්මක වන රේඩියල් ගේට්ටු ස්ථාපනය කිරීම 3ක්



මුතුකණ්ඩිය හල්මුල්ලපිල්ලෑව ප්‍රධාන ඇල ආස්තරණය කිරීම

## 6.5. මහවැලි අධිකාරියේ වාරි පද්ධතිවල භෞතික වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය

මහවැලි අධිකාරිය යටතේ ඉදිරියේ ඇති වන ගංවතුර හා නියං තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා පැකේජයන් 77 ක් හඳුනා ගන්නා ලදී. මෙම පැකේජ 77 සඳහාම කොන්ත්‍රාත්තු ප්‍රදානය කර ඇති අතර එහි වටිනාකම රු.මිලියන 2,217කි. එයින් රු. මිලියන 1,269 ක් වටිනා පැකේජ 66ක වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘතියේ අතිරේක ප්‍රතිපාදන යටතේ පැකේජ 17 ක් ප්‍රදානය කර ඇති අතර, ඉන් 8ක වැඩ අවසන් කර ඇත. ඉතිරි පැකේජ 9 ක්‍රියාත්මකව පවතින අතර ඒවායේ ප්‍රගතිය විවිධ මට්ටම් වල පවතී.









බෝවතැන්න සිට දඹුලු ඔය සහ කන්දලම දක්වා පෝෂක ඇළෙහි ඇල ආස්තරණය කිරීම



කලා වැව ප්‍රධාන ඇළෙහි අලුතින් ගේට්ටු 79ක් ස්ථාපනය කිරීම

## 6.6. තර්ජනයට ලක් වූ මාර්ග වල බෑවුම් සහ පාලම් වැඩිදියුණු කිරීම තුලින් ප්‍රවාහන සේවයේ අඛණ්ඩ සේවාව තහවුරු කිරීමේ ප්‍රගතිය

ගංවතුර සහ නාය යාම් නිසා අඛණ්ඩ ප්‍රවාහන සේවාවක් පවත්වා ගැනීමට ඇති අපහසුතා මගහරවා ගමනාගමන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය (ම.ස.අ) විසින් තර්ජනයට ලක් වූ බෑවුම් ස්ථායීකරණය සඳහා පැකේජ 10 ක් ද ගංවතුර තත්වයන්ට හේතුවන පාලම්/බෝක්කු 18 ක් වැඩිදියුණු කිරීම සඳහා පැකේජ 12 ක් ද හඳුනාගෙන ඇත. මෙම පැකේජ 22 හි මුළු ඇස්තමේන්තු මුදල රු.මිලියන 3,743.8 කි. මේ වනවිට රු.මිලියන 2,266 ක් වටිනා පාලම් වැඩි දියුණු කිරීම සඳහා NCB පැකේජ 11 ක් ප්‍රදානය කර ඇති අතර, එයින් පැකේජ 06 ක වැඩ අවසන් කර ඇත.

පාලම්/ බෝක්කු වැඩිදියුණු කිරීමේ පැකේජ 12 යටතේ නැදිමාල-බොරලැස්ගමුව මාර්ගයේ පාලම 100% ක් ද, පොලොන්නරුව-සෝමාවතිය මාර්ගයේ පාලම් 4 ක් 100% ක් ද, ත්‍රිකුණාමලය-මඩකලපුව මාර්ගයේ පාලම 72% ක් ද, කතරගම-සෙල්ලකතරගම මාර්ගයේ පාලම 100% ක් ද, ගංගොඩවිල-බොරලැස්ගමුව මාර්ගයේ කටු ඇල පාලම් 2ක් සහ බෝක්කුවක් 100% ක් ද, රත්නපුර-වැල්ලවාය මාර්ගයේ පාලම් 2ක් 100% ක් ද,බෝගහවත්ත-පුල්මුඩෙයි මාර්ගයේ පාලම 100%ක් ද, මාකඳුර-බඩල්ගම මාර්ගයේ පාලම 45% ක් ද, වරකාපොල-රුවන්වැල්ල මාර්ගයේ පාලම 33% ක් ද සහ උඩප්පුව-ආන්ඩිමලේ මාර්ගයේ පාලම 50% ක් ද වැඩ අවසන් කර ඇත.




තව ද ත්‍රිකුණාමලය-මඩකලපුව මාර්ගයේ පාලම 79% ක් ද, අල්ලෙයි-කන්තලේ මාර්ගයේ පාලම 70% ක් ද සහ කොළඹ-රත්නපුර-වැල්ලවාය මාර්ගයේ පාලම් 2 හි වැඩ 29% ක් ද අවසන් කර ඇත. මෙයට අමතර රු.මිලියන 1,334.5ක් වටිනා පැකේජ 9ක් නායයාම් අවදානම් වලට ලක්වූ මාර්ග දෙපස බෑවුම් ස්ථායීකරණය කිරීම සඳහා ප්‍රදානය කර ඇත. එම පැකේජ අතුරින් 4ක් මහනුවර - මහියංගනය මාර්ගයේ අස්ථායි බෑවුම් 16 ක් ස්ථායිකරණය සඳහා ප්‍රදානය කර ඇත. එයින් පැකේජ 3ක වැඩ අවසන් කර ඇත. එයට අමතරව හක්ගල, බෙරගල සහ ගිනිගත්හේන ප්‍රදේශවල පවතින අස්ථායී නායයාමේ තර්ජනයට ලක්ව ඇති බෑවුම් ස්ථායිකරණය සඳහා තවත් පැකේජ 3 ප්‍රදානය කරන ලදී. මේ අතුරින් බෙරගල පැකේජය අවසන් කර ඇත. ගිණිගත්හේන පැකේජයේ වැඩ 98%ක් අවසන් කර ඇත. ඉතිරි පැකේජයේ වැඩ 69%ක් අවසන් කර ඇත.

ප්‍රදානය කිරීමට ඉතිරිව ඇති පැකේජ 2න් මහනුවර-මහියංගන මාර්ගයේ ගල් වැටීමේ අවදානම් සහිත ස්ථාන එම අවදානමින් මුදවා ගැනීම සඳහා ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තොර ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේ.



හක්ගල පේරාදෙණිය වෙන්කලඩි මාර්ගයේ හක්ගල උද්භිත උද්‍යානය අසල නායයාමට ලක්වූ ස්ථානය ස්ථායිකරණය කිරීම



අවිස්සාවේල්ල - හැටන් මාර්ගයේ අනාරක්ෂිත බෑවුම ස්ථායිකරණය කිරීම

## 6.7. පාසල් භූමි වල ආරක්ෂාව සඳහා නාය යාම් තර්ජන අවම කිරීමේ ප්‍රගතිය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (ජා.ගො.ප.අ) විසින් මහනුවර දිස්ත්‍රික්කයේ නායයාම් තර්ජනයට ලක් වූ පාසල් 18ක බෑවුම් ස්ථායීකරණය කිරීම සඳහා පැකේජ 12ක් හඳුනා ගන්නා ලදී. මේ යටතේ රු.මිලියන 687ක් වටිනා පැකේජ 12ක් ප්‍රදානය කරන ලදී. ඉන් එක් පැකේජ 10ක වැඩ අවසන් කර ඇත. අවසන් කර ඇති පැකේජ යටතේ පාසල් 16ක වැඩ අවසන් කර ඇත. එනම් මහනුවර ධර්මරාජ විද්‍යාලය, මහමායා විද්‍යාලය, හිල්වුඩ් විද්‍යාලය, ගෝතමී බාලිකා විද්‍යාලය, ගල්කන්ද කණිෂ්ඨ විද්‍යාලය, සිරිමල්වත්ත නවෝද්‍යා විද්‍යාල, ගම්පොල ශාන්ත ජෝශප් විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, බෝතොට මහා විද්‍යාලය, හල්ලොලුව නවෝද්‍යා විද්‍යාලය, කුරුකුත්තාල විද්‍යාලය, කසාවත්ත මුස්ලිම් විද්‍යාලය, රම්බකේ ඇල මුස්ලිම් විද්‍යාලය, මොලගොඩ ශ්‍රී පියදස්සි විද්‍යාලය, ගම්පොල බෞද්ධ විද්‍යාලය සහ ගම්පොල ජිනරාජ විද්‍යාලය යන පාසල් වල වැඩ අවසන් කර ඇත. මෙයට අමතරව ප්‍රදානය කර ඇති ඉතිරි පැකේජ 2 යටතේ වත්තේ ගෙදර මධ්‍ය මහා විද්‍යාලයේ වැඩ 99%ක් සහ විද්‍යාර්ථ විද්‍යාලයේ වැඩ 99%ක් අවසන් කර ඇත.






කුරුකුත්තල මුස්ලිම් විද්‍යාලයේ අනාරක්ෂිත බෑවුම ස්ථායිකරණය කිරීම




රඹුකේ ඇල මුස්ලිම් විද්‍යාලයේ අනාරක්ෂිත බෑවුම ස්ථායිකරණය කිරීම

## 6.8. ඌව පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති අවදානම් සහිත බෑවුම් ස්ථායිකරණය කිරීමේ ප්‍රගතිය

ව්‍යාපෘතියේ අතිරේක ප්‍රතිපාදන යටතේ ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පිහිට වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් අස්ථායි බෑවුම් ස්ථායිකරණය සඳහා පැකේජ 15ක් හඳුනා ගෙන ඇත. එයින් ඌව මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ හඳුනාගත් පැකේජ 7ම මේ වන විට ප්‍රදානය කර ඇත. එහි වටිනාකම රු . මිලියන 833.2 කි. මේ වන විට රු. මිලියන 364ක මුදලක් කොන්ත්‍රාත්තුකරුවන් විසින් නිමකළ වැඩ සඳහා ගෙවීම් සිදුකර ඇත. පැකේජ 3ක් සම්පුර්ණයෙන්ම අවසන් කර ඇත.




ඉතිරි පැකේජ 8 ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ තාක්ෂණික මැදිහත්වීම සහ අධීක්ෂණය යටතේ ටෙන්ඩර් කැඳවීම පැකේජ 4ක් සඳහා අවසන් කර ඇත. ඉතිරි පැකේජ 4 සඳහා මේ වන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත එකතු කිරීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදුකරමින් පවතී.

## 6.9. හදිසි අවිනිශ්චිත තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම

මූලික ව්‍යාපෘති යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක වෙමින් පවතින පැකේජවල භෞතික ප්‍රගතිය




ව්‍යාපෘතියේ 4වන සංරචකය යටතේ 2017 සිදු වූ ගංවතුර සහ නායයාම් වලින් හානිවූ කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්ක වල පිහිටි ප්‍රාදේශීය සහ පළාත් මාර්ග වලින් තෝරාගත් මාර්ග වල අලුත්වැඩියාවන් සඳහා රු.මිලියන 534 (US $ 3 million) ව්‍යාපෘතියෙන් වෙන් කරන ලදී. මෙම සංරචකය ක්‍රියත්මක කරනු ලබන්නේ දිස්ත්‍රික් 4හි දිස්ත්‍රික් ලේකම්වරුන් යටතේ වන අතර අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම ව්‍යාපෘති කාර්යාලය විසින් සිදුකරනු ලබයි.

හදිසි අවිනිශ්චිත තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට අනුව 2017දී සිදු වූ ගංවතුර හානිය නිසා කළුතර, ගාල්ල, රත්නපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලට අයත් මාර්ගවල අබලන් කොටස් පෙර තිබූ තත්ත්වයට සාපේක්ෂව ගංවතුරට ඔරොත්තු දෙන ආකාරයට වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 534ක් වටිනා පැකේජ 29ක් හඳුනාගෙන ඇත. මෙයින් රු.මිලියන 303ක් වටිනා පැකේජ 18ක් ප්‍රදානය කර අවසන් කර ඇත. ඉන් පැකේජ 2ක් (රු.මිලියන 60.87) හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවසන් කර ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ එක් පැකේජයක් (රු.මිලියන 12.19) අවසන් කර ඇත. කළුතර දිස්ත්‍රික්කයේ රු.මිලියන 1.78ක් වටිනා පැකේජයක වැඩ අවසන් කර ඇත.ඉතිරි පැකේජ 14න්, රු.මිලියන 59.66ක් වටිනා පැකේජ 5ක් කළුතර දිස්ත්‍රික්කයේ ද, රු.මිලියන 93.29ක් වටිනා පැකේජ 7ක් ගාලු දිස්ත්‍රික්කයේ ද , රු.මිලියන 76.36ක් වටිනා පැකේජ 2ක් රත්නපුර දිස්ත්‍රික්කයේ ද ක්‍රියාත්මක වේ.

ඉතිරි පැකේජ 11 අතුරින් පැකේජ 4ක් ප්‍රදානය කිරීමට සුදුසු මට්ටමේ ද, 4ක් ටෙන්ඩර් ඇගයීමේ මට්ටමේ ද, 2ක් සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර 2ක් ටෙන්ඩර් වාර්තා පිළියෙළ කිරීමේ මට්ටමේ ඇත. දැනට ක්‍රියාත්මක වන පැකේජ අතුරින් 7ක් 2019 අප්‍රේල් මස අවසන් වන විටත්, ප්‍රදානය කිරීමට ඇති පැකේජ 11ම අප්‍රේල් මස අවසන් වනවිට අවසන් කිරීමට හැකිවේ. සියලුම පැකේජ 2019 ඔක්තෝම්බර් මස අවසන් වනවිට අවසන් කිරීමට හැකිවේ.

තවත් පැකේජ 16ක ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර, කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට කටයුතු කරමින් පවතී. ඉතිරි පැකේජ 9න් 3ක සැලසුම් සකස් කරමින් පවතින අතර 6ක් ටෙන්ඩර් කැඳවීමට යෝජිතය.



ව්‍යාපෘති කාර්ය මණ්ඩලය (PMU), රත්නපුර දිස්ත්‍රික් සැලසුම් අංශයේ සහ සබරගමුව ප්‍රාදේශීය මාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අමුවල මාර්ගයේ වැඩිදියුණු කිරීම් පිළිබඳ නිරීක්ෂණය සිදුකරනු ලැබූ ක්ෂේත්‍ර චාරිකාව

**ගාල්ල**



බද්දේගම කොටගොඩ කන්ද මාර්ගයේ වැඩිදියුණු කිරීම්



නැබඩ පාලමේ සිට සුනන්දාරාමය පන්සල දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම

## කළුතර



මිල්ලනියේ දොඹගොඩ සීලරතන මාර්ගයේ කුඩා පාලම සහ රුඳවුම් තාප්පය ඉදිකිරීම



මිල්ලනිය වෙනිවැල් -පිටිය මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම

## රත්නපුර



කොටාමුල්ල - අමුවල මාර්ගය වැඩිදියුණු කිරීම



තිරිවානකැටිය - අගලවත්ත මාර්ගයේ රුඳවුම් තාප්පය ඉදිකිරීම

## 7. ව්‍යාපෘතියේ ආයෝජනය තුලින් 2019 ජනවාරි 31 මේ වන විට ලබා කරගෙන ඇති ප්‍රතිලාභ :

- හෙක්ටයාර 50,000 භූමි ප්‍රදේශයක වගාකරන වගාවන් නියගයෙන් සහ ජල ගැලීම් වලින් සිදුවිය හැකි විපත් වලින් ආරක්ෂා කර ඇත.
- ව්‍යාපෘතිය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති දිස්ත්‍රික්ක 11ක සහ මහවැලි අධිකාරියේ B,C,H,L හුරුළුවැව, වලවේ, සෙවනගල සහ බෝවතැන්න කලාප වල කි.මී 395ක් දිග වාරි ජලය බෙදා හැරීමේ ඇළ පද්ධතිය වැඩි දියුණු කර ඇත.
- කි.මී.6 දිගැති ගංවතුර පාලන බැම් ශක්තිමත් කර ඇත.
- කි.මී 88 දිගැති ජල බස්නාවන් වැඩිදියුණු කර ඇත.
- කෘෂි මාර්ගවල සහ වාරි පද්ධතීන් නඩත්තු මාර්ගවල බෝක්කු සහ කුඩා පාලම් 235ක් ඉදිකර ඇත.
- සම්බන්ධ මාර්ග (link road) කි.මී 26ක් අවසන් කර ඇත.
- ජලාශ වල පිටාර ජලය ගෙන යන ඇලවල් කි.මී 24ක් අවසන් කර ඇත.
- වාරි ජලය බෙදාහරින ඇලමාර්ගවල ජලය පාලනය කරන නිර්මිතයන් 4529ක් ඉදිකර අවසන් කර ඇත.
- ධර්මරාජ විද්‍යාලය, මහමායා විද්‍යාලය, ගෝතමී විද්‍යාලය, හිල්වුඩ් විද්‍යාලය, ගල්කන්ද කණිෂ්ඨ විද්‍යාලය, කුරුකුත්තල විද්‍යාලය, සිරිමල්වත්ත නවෝද්‍යා විද්‍යාලය, ගම්පොල ශාන්ත ජෝශප් විද්‍යාලය, ගම්පොල බෞද්ධ විද්‍යාලය, ගම්පොල ජිනරාජ බාලිකා විද්‍යාලය, බෝතොට මහා විද්‍යාලය, හල්ලොලුව නවෝද්‍යා විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, කසාවත්ත මුස්ලිම් විද්‍යාලය, රම්බලේ ඇල මුස්ලිම් විද්‍යාලය සහ මොලගොඩ ශ්‍රී පියදස්සි විද්‍යාලය යන විද්‍යාල වල පැවති අවදානම් සහිත බෑවුම් ස්ථායිකරණය කිරීම නිසා එම පාසල් ළමුන් 20,000 කගේ ජීවිත ආරක්ෂාව තහවුරු කර ඇත.
- නායයාම් තර්ජනය සහ ගංවතුර තර්ජනය නිසා අඛණ්ඩ ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාමට අපහසු වූ මාර්ග වල අඛණ්ඩ ප්‍රවාහන සේවාවක් තහවුරු කරන ලදී. මේ යටතේ පහත මාර්ගවල අඛණ්ඩ ප්‍රවාහන සේවයක් තහවුරු කර ඇත.

  මහනුවර - මහියංගන මාර්ගයේ 100% ක් ද, දෙහිවල - නැදිමාල මාර්ගයේ 100% ක් ද, පොලොන්නරුව - සෝමාවතිය මාර්ගයේ 100% ක් ද, ගංගොඩවිල - බොරලැස්ගමුව මාර්ගයේ 100% ක් ද, බෝගහවැව - පුල්මුඩෙයි මාර්ගයේ 100% ක් ද, අවිස්සාවේල්ල - හැටන් මාර්ගයේ 100% ක් ද, කතරගම - සෙල්ල කතරගම මාර්ගයේ 100% ක් ද වශයෙනි.

## ආ. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

තල්පිටිගල ජලාශය උමාඔය හරහා දැනට පවතින බත්මැඩිල්ල අමුණ පිහිටි ස්ථානයට කි.මී. 3ක් පමණ ඉහළින් හුණුකැටිය (දෙමටපැලැස්ස) ග්‍රාමය ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිතය. උමා ඔය ජලය පාලනය කර බත්මැඩිල්ල අමුණ යටතේ ඇති වගාබිම් වල ජල අවශ්‍යතාව සැපිරීමත්, පාරිසරික අවශ්‍යතා හා මිනිපේ අමුණ සඳහා අවශ්‍ය විට ජලය මුදා හැරීමත් මෙම ජලාශය ඉදිකිරීමේ අරමුණ වේ. මෙම ස්ථානයේ මීටර 46ක් උස වේල්ලක් ඉදිකිරීම මඟින් ඝන මීටර් මිලියන 15.56 ක ධාරිතාවකින් යුතු ජලාශය ඉදිකරනු ලබන අතර පහළ නිම්න කෘෂිකර්මාන්තය සඳහා ඝන මීටර මිලියන 40 ක ජල ධාරිතාවයක් මුදාහැරීමටත් එමඟින් පවතින වී වගා බිම් හෙක්ටයාර් 810 ක වාරි පහසුකම් දියුණු කිරීමත් සැලසුම් කර ඇත. ඊට අමතරව ව්‍යාපෘතිය මඟින් ගිගාවෝට් පැය 51.3 ක විදුලි බල ජනනයක්ද අපේක්ෂිතය. ව්‍යාපෘති ක්‍රියාත්මක ඒකකය මඟින් නව බිම් හෙක්ටයාර 400 සඳහා වාරි පහසුකම් ප්‍රගුණවත් කිරීම මඟින් පහළ නිම්න වගාව වැඩි දියුණු කිරීමට මේ වනවිටත් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 174 ක් වන අතර, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා චීනයේ Sino Hydro Corporation Limited සමඟ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට එම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන නිම කර ඇති අතර, පාරිසරික අධ්‍යයන වාර්තාව සඳහා අනුමැතිය ලැබී ඇත. ව්‍යාපෘති කාලය වසර 4 කි. තව ද ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය හා චීනයේ EXIM බැංකුව අතර 2017 දෙසැම්බර් මස ණය ගිවිසුම අත්සන් කරන ලදි. 2019 වර්ෂයේ පළවන කාර්තුවේදී පමණ ස්ථානගත වීමේ අත්තිකාරම් මුදල Sino Hydro Corporation Limited වෙත ගෙවා ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී ආරම්භ කිරීම සඳහා මුලින් සැලසුම් සකස් කර තිබූ නමුත් කොන්ත්‍රාත්කාර සමාගම විසින් අදාල අත්තිකාරම් ගෙවුම් සුරක්ෂණය සහ කාර්ය සාධන සුරක්ෂණය ලබාදීමේදී සිදු වූ ප්‍රමාදයන් සහ චීන EXIM බැංකුව විසින් ණය ගිවිසුම සක්‍රීය කිරීම ප්‍රමාද වීම යන කාරණා නිසා ව්‍යාපෘතිය සැලසුම් කල පරිදි 2018 වර්ෂයේදී ඇරඹීම ප්‍රමාද විය.

මේ වනවිට වැඩබිමේ හා ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම්, මැනුම් කටයුතු, ප්‍රදේශයේ මූලික යටිතල පහසුකම් දියුණු කිරීමේ කටයුතු සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම ආදී වැඩ කටයුතු ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරීන් විසින් සිදු කරමින් පවතී.

2018 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල වැඩ වල 2018.12.31 දිනට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| අත්පත් කරගැනීමට නියමිත ඉඩම් සහ ජලාශයට යටවන ඉඩම් වල මිනුම් කටයුතු | 100% |
| ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ නිල නිවාසය ඉදිකිරීම | 100% |
| වාරිමාර්ග නිල නිවාසය අංක 1 සංචාරක බංගලාවක් ලෙස නවීකරණය කිරීම | 30% |
| වාසනාගම ක්ෂේත්‍ර කාර්යාලය ඉදිකිරීම | 35% |
| තාවකාලික ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම | 100% |
| ගෘහභාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම | 85% |
| ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු | 55% |
| පිවිසුම් මාර්ග ඉදිකිරීම | 50% |

## ඉ. පහළ මල්වතු ඔය බහු කාර්යය ජලාශ ව්‍යාපෘතිය

### 1. හැඳින්වීම

1960 වර්ෂයේ දී යෝජිත පහළ මල්වතු ඔය ජලාශය ඝන මීටර් මිලියන 348ක (අක්කර අඩි 282,000) ධාරිතාවයකින් ද 57.10 m msl ක (187.3 ft msl) පූර්ණ සැපයුම් මට්ටමකින් ද යුක්ත විය. කෙසේ වුව ද, ජලාශය නිසා යටවන භූමි ප්‍රමාණය අක්කර 16,652 සිට අක්කර 10,720 දක්වා අඩු කර විශේෂයෙන්ම ඉහල පෝෂක ප්‍රදේශයේ වනාන්තර එළි කිරීම අඩු කිරීම සඳහා දැනට යෝජිත ජලාශයෙහි ධාරිතාව ඝන මීටර් මිලියන 209කට හා එහි පූර්ණ සැපයුම් මට්ටම 54.10 m msl කට (අඩි 177.5) අඩු කර තිබේ. කෙසේ වුව ද, 1960 වර්ෂයේ දී යෝධවැව හා අකතිමුරිප්පු වැව යටතේ අක්කර 20,000ක භූමි ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට තිබූ අතර, යෝජිත මල්වතු ඔය ජලාශයේ පහළ ප්‍රදේශයේ තවත් අක්කර 12,000ක නව භූමි ප්‍රමාණයක් ද සංවර්ධනය කිරීමට යෝජනා විය. වර්තමානයේ දී යෝධවැව හා අකතිමුරිප්පු වැව යටතේ හෙක්ටයාර් 12,425ක භූමි ප්‍රදේශයක් සංවර්ධනය කර ඇති අතර, ජලාශය ඉදිකිරීමේ දී අවතැන්භාවයට පත්වන ජනතාව නැවත පදිංචි කරවීම සඳහා ප්‍රධාන වශයෙන්ම ජලාශයේ පහල නිම්නයෙහි තවත් හෙක්ටයාර් 810ක නව භූමි ප්‍රදේශයක් ද සංවර්ධනය කෙරෙනු ඇත. මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතියට අයත් වන්නේ (අ) තන්තිරිමලේ ප්‍රදේශයේ දී මල්වතු ඔය හරහා මීටර් 3,590ක් දිග පස් වේල්ලක් ඉදිකිරීම (ආ) මෙගාවොට් 1.0ක බලාගාරයක් සමඟ සංස්ථාපිත කරන ලද උස මීටර් 7x පළල මීටර් 7 ක අරීය ගේට්ටු සහිත වාන් දොරටු 12 කින් යුත් සහිත පිටවාන ඉදිකිරීම, ගංගාවට ජලය නිදහස් කිරීමේ නිර්මිතයන් හා ඝන මීටර 1ක වම් ඉවුරු සොරොව්ව ඉදිකිරීම (ඇ) ධාරිතාව ඝන මීටර 1ක් වන දකුණු ඉවුරු සොරොව්ව ඉදිකිරීම (ඈ) කි.මී. 4ක් දිග වම් ඉවුරු ප්‍රධාන ඇල ඉදි කිරීම (ඉ) කි.මී. 4ක් දිග දකුණු ඉවුරු ප්‍රධාන ඇල ඉදිකිරීම (ඊ) යෝජිත ජලාශයේ පහල ප්‍රදේශයේ ඉවුරු දෙකෙහිම හෙක්ටයාර් 284ක භූමියක් සඳහා ද්විතික හා තෘතියික වාරිමාර්ග යටිතල පහසුකම් ඉදිකිරීම (උ) වාණිජ කෘෂි කර්මාන්තය යටතේ පළතුරු වගාව සඳහා යෝජිත ජලාශයේ පහල ප්‍රදේශයේ ඉවුරු දෙකෙහිම හෙක්ටයාර් 527ක නව භූමි ප්‍රදේශයකට උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම (ඌ) තෙක්කම් අමුණෙහි පවතින වාරි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (එ) තම මුල් ඉඩම් වලින් අවතැන් වූ ජනතාව ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සමාජීය යටිතල පහසුකම් ඉදිකිරීම යනාදියයි.

### 2. ව්‍යාපෘති ප්‍රතිලාභ

නව වාරි යටිතල පහසුකම් සංවර්ධනය යටතේ හෙක්ටයාර් 284ක භූමි ප්‍රදේශයක් කුඹුරු හා අනෙකුත් අතිරේක භෝගයන් සඳහා ද වාණිජ කෘෂිකර්මාන්තය යටතේ උස්සාන වාරිමාර්ග පහසුකම් ද සමඟින් තවත් හෙක්ටයාර් 527ක භූමි ප්‍රදේශයක් පළතුරු වගාව සඳහා ද සපයා දීමට යෝජනා කර තිබේ. ඊට අමතරව යෝධ වැව හා අකතිමුරිප්පු වැව යටතේ දැනට වගා කර ඇති හෙක්ටයාර් 12,425ක වාරි ප්‍රදේශයේ වගා තීව්‍රතාවය 1.00 සිට 1.7ක් දක්වා ප්‍රමාණයකින් වැඩිවනු ඇත. එබැවින් හෙක්ටයාර් 284ක නව භූමි ප්‍රදේශය හා හෙක්ටයාර් 12,425ක පවතින භූමි ප්‍රදේශය මඟින් වී මෙට්‍රික් ටොන් 24,450ක් නිෂ්පාදනය කෙරෙනු ඇත. තව ද කලාපයේ දැනට පවතින නිෂ්පාදන මට්ටමට වඩා වැඩියෙන් වාර්ෂිකව බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 16,750ක් ද, මුං ඇට මෙට්‍රින් ටොන් 360ක් ද, සෝයාබෝංචි මෙට්‍රික් ටොන් 2,340ක් ද නිෂ්පාදනය කෙරෙනු ඇත. කෘෂිකාර්මික අංශයේ ප්‍රතිලාභයන්ට අමතරව වෙඩිඩිකුලම් හා තන්තිරිමලේ නගරයන්ට මෙන්ම අනුරාධපුර හා වව්නියා දිස්ත්‍රික්ක වල නව පදිංචි ප්‍රදේශ වලට හා අනෙකුත් ප්‍රදේශ වලට ජලාශය මඟින් ගෘහස්ථ පරිභෝජනය උදෙසා ඝන මීටර් මිලියන 5 ක ජල ධාරිතාවයක් සැපයෙනු ඇත. පහල මල්වතු ඔය මඟින් තෙක්කම් අමුණට නිදහස් කෙරෙන වාරි ජලය භාවිතයෙන් මෙගාවොට් 1ක බලාගාරයක් හරහා වාර්ෂිකව ගිගාවොට් පැය 4.6 (GWh) ක ජල විදුලි බලය උත්පාදනය කිරීම සඳහා ද මෙම ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර තිබේ.

සෘජු ප්‍රතිලාභයන්ට අමතරව, අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ කෘෂිකර්මය හා පශු සම්පත් සංවර්ධනය සඳහා සිදු කෙරෙන ආයෝජනයන් හේතු කොටගෙන ගොවි පවුල් වල ජීවන තත්වය ඉහල නංවන ආකාරයේ වක්‍ර ප්‍රතිලාභ හිමිවනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී විශේෂයෙන්ම අනෙකුත් යටිතල පහසුකම් සඳහා සිදු කෙරෙන ආයෝජනය හේතුවෙන් කලාපය තුල දියුණු කෘෂිකාර්මික නිෂ්පාදනයකට මඟ පාදමින් පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව සැලසීම, වෙළඳපල ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම, කෘෂි තාක්ෂණය දියුණු කිරීම, ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුකම් වැඩිදියුණු කිරීමට අවකාශ සැලසේ.

## අ. ව්‍යාපෘතියෙහි වත්මන් තත්ත්වය

### i) ජලාශයේ ඉහළ ගංවතුර මට්ටමට අදාලව මායිම් ගල් සවි කිරීම

යෝජිත ජලාශයේ ඉහල ගංවතුර මට්ටම සලකුණු කිරීම අවසන් කර ඇති අතර, කි.මී. 92ක දුර ප්‍රමාණයක් සඳහා සෑම මීටර් 500ක අන්තරයක් සඳහාම මායිම් ගල් සවි කර තිබේ.

### ii) ජලාශයට යටවන ප්‍රදේශයේ මැණුම් කටයුතු සිදු කිරීම

ජලාශයට යටවන ප්‍රදේශයේ මැනුම් කටයුතු සිදු කිරීම හා පෙරටු අනුරේඛන (advance tracing) සකස් කිරීම ආදි වශයෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන අවශ්‍යතාවයන් පහතින් දැක්වෙන ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශයන් තුළ සම්පූර්ණ කර තිබේ.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | භූමි සමීක්ෂණය සිදු කරන ලද අක්කර ප්‍රමාණය |
|---|---|---|
| අනුරාධපුරය | මහවිලච්චිය | 4381 |
| | නුවරගම්පළාත - මධ්‍යම | 4483 |
| | මැදවච්චිය | 930 |
| වව්නියාව | සෙට්ටිකුලම් | 3555 |

### iii) පාරිසරික බලපෑම් අධ්‍යයනය වාර්තාව

සම්පූර්ණ කරන ලද පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දුන් අතර පාරිසරික බලපෑම් අධ්‍යයනය (EIA) කණ්ඩායම විසින් 2018 ජුලි මස 16 හා 17 යන දිනයන්හිදී ස්ථානීය පරීක්ෂාවන් සිදු කරන ලදී. 2018.07.11 දින සිට 2018.07.24 දින දක්වා කාලයේ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය පිළිබඳව මහජන විරෝධතා හා අදහස් විමසා සිටි අතර, 2018.08.15 දින මධ්‍යම පරිසර අධිකාරියේ පැවති රැස්වීමක දී එම මහජන අදහස් සාකච්ඡාවට ලක් කෙරිණි.

විල්පත්තු ජාතික වනෝද්‍යානයට යාබද බිම් ප්‍රදේශ කුඹුරු සඳහා යොදා ගැනීම පිළිබඳ වනජීවි දෙපාර්තමේන්තුව එකඟ නොවූ අතර මේ වන විට ඒ සඳහා විකල්ප භූමි ප්‍රදේශ හඳුනාගෙන ඇති අතර, පාරිසාරික බලපෑම් අධ්‍යයන වාර්තාවට අතිරේකයක් සකස් කිරීම මේ වන විට සිදු කෙරෙමින් පවතී.

### iv) ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ කාර්යාලය ඉදිකිරීම

පහළ මල්වතුඔය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය තන්තිරිමලේ ප්‍රදේශයේ ඉදිකිරීම අවසන් කර තිබේ.

### v) මූලික සමාජ - ආර්ථික සමීක්ෂණ

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් මූලික සමාජ - ආර්ථික සමීක්ෂණය අවසන් කර තිබේ. මෙමඟින් ජලාශයෙන් බලපෑමට ලක්වන පවුල් සංඛ්‍යාව හා භූමි ප්‍රමාණය, නැවත පදිංචි කරවීම සඳහා වන ඉඩම් අවශ්‍යතාවය ජලාශයට යටවන නිවාස සංඛ්‍යාව ආදී වැදගත් තොරතුරු සඳහා දායක වේ.

### vi) ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය

මහවිලච්චිය, නුවරගම්පළාත - මධ්‍යම, මැදවච්චිය හා සෙට්ටිකුලම් යන ප්‍රදේශයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ජලාශයට යටවන භූමිය සඳහා සකස් කරන ලද පෙරටු අනුරේඛන ඉඩම් අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

### vii) ව්‍යාපෘති කළමනාකරණ කමිටු පිහිටුවීම

නැවත පදිංචි කර වූ පුද්ගලයන්ගේ ගැටළු හඳුනා ගැනීමටත් නිළධාරීන් හා නැවත පදිංචිකරුවන් අතර, වඩා යහපත් අවබෝධයක් ඇති කරවීමටත් ව්‍යාපෘති කළමනාකරණ කමිටු 09ක් පිහිටුවන ලදී.

## ආ. වර්ෂය සඳහා ප්‍රගතිය

2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 50.0ක මුදලක් වෙන්කර තිබුණු අතර 2018 වර්ෂයේ භෞතික ප්‍රගතිය 100%ක් ද, බැරකම් රහිතව මූල්‍ය ප්‍රගතිය 80%ක් ද, බැරකම් සහිතව 100%ක් ද වශයෙන් වේ.

## ඊ. කළුගඟ වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (කින්නියා කන්තලේ)

කන්තලේ කින්නියා ප්‍රදේශයන්හි ජීවත් වන ගොවි ජනතාව නිරන්තරයෙන්ම ගංවතුර හා නියඟය නිසා පීඩාවට පත්වන අතර ඔවුන්ගේ ආදායම් තත්වය ඉතා පහළ මට්ටමක පවතී. මෙම ගැටළුව විසඳීම සඳහා ඝන සෙන්ටිමීටර 15 ක ධාරිතාවයකින් යුත් කළුගඟ ජලාශය ඉදි කිරීමටත් කන්තලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සිංහ වැව, සූරිය වැව, කාන්ති වැව හා ජනරංජන වැව මෙන්ම කින්නියා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කුරන්කුපංචන්, වෙල්ලන්කුලම් හා පට්ටියන් නූතු යන වැව් දියුණු කිරීමටත් යෝජනා වී තිබේ. කන්තලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තීනරිවේලි ප්‍රදේශයේ වගා භූමි අක්කර 3,000ක් සඳහා වාරි ජල පහසුකම් ලබාදීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය මඟින් කින්නියා ප්‍රදේශයේ ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය ජලය සැපයීමටත් ප්‍රදේශයේ යටිතල පහසුකම් හා ජන ජීවිතය දියුණු කිරීමටත් අපේක්ෂිතය. ව්‍යාපෘතිය මඟින් දළ වශයෙන් ගොවි පවුල් 2,600කට ප්‍රතිලාභ සැලසෙනු ඇත.

සංවර්ධනය සඳහා ඇ.ඩො.මි. 45ක් යටතේ මෙම ව්‍යාපෘතිය වර්ෂ 3ක් තුළ දී නිම කිරීමට සවුදි අරමුදල සමඟ එකඟතාවයකට පැමිණ තිබේ.

2018 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 120ක් වැය කර තිබුණි.

2018 වර්ෂය අවසාන වන විට තීනරිවේලි ප්‍රදේශයේ මැණුම් හා මට්ටම් කිරීමේ කටයුතු අවසන් කර තිබෙන අතර, පාරිසරික ඇගයීම් අධ්‍යයන වාර්තාවේ අවසන් කෙටුම්පත ද මේ වන විට සකස් කෙරෙමින් පවතින අතර, වාන හා සොරොව්ව සැලසුම් කිරීමේ කටයුතු අවසන් කර තිබේ.

## උ. භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ ඔක්තෝබර් මස 03 වන දින අමාත්‍යාංශ ලේකම්වරයා හා නෙදර්ලන්තයේ M/S Royal Eijkelkamp සමාගම අතර ගිවිසුමක් අත්සන් තබන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2017 නොවැම්බර් මස 30 වන දින නෙදර්ලන්තයේ Rabo Bank සමඟ ණය ගිවිසුමකට එළඹෙන ලදී.

කොන්ත්‍රාත් ගිවිසුමේ 5 වන ඡේදයේ සඳහන් කොන්දේසි වලට අනුව, මෙම ව්‍යාපෘතියේ ආරම්භක දිනය ලෙස 2018 මාර්තු 27 වන දින සඳහන් වී ඇත.

ව්‍යාපෘතියේ වත්මන් තත්වය පහතින් සාරාංශ ගත කර ඇත.

1. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපනය කර ඇත.
2. 2018 පෙබරවාරි මස 15 වන දින කාර්යසාධන සුරක්ෂණය හා අත්තිකාරම් ගෙවුම් සුරක්ෂණය ඉදිරිපත් කර ඇත.
3. 2018 මාර්තු මස 10 වන දින කොන්ත්‍රාත් මුදලෙන් 15% ක් අත්තිකාරම් මුදල් ලෙස කොන්ත්‍රාත්කරු වෙත මුදා හරින ලදි.
4. 2018 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු වෙත අතුරු ගෙවීම් 3කට අදාල මුදා හැරීම් කර ඇත.
5. BOQ හි අංක 24 දරණ අයිතමය අනුව, කොන්ත්‍රාත්කරු විසින් ජල සම්පත් මණ්ඩලයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඩබල් කැබ් රථ 04 හා වෑන් රථයක් ඇතුළුව වාහන 05ක් සපයා දී ඇති අතර ඒවා පවරා දී ඇත්තේ පහත දැක්වෙන පරිද්දෙනි.
   - එක් ඩබල් කැබ් රථයක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට පවරා දී ඇත.
   - ද්‍රෝණි 3ක වැඩ බිම් තෝරා ගැනීමේ හා ක්ෂේත්‍ර කටයුතු සඳහා ඩබල් කැබ් රථ 3ක් වෙන් කර දී ඇත.
   - භූ භෞතික විමර්ශන අධීක්ෂණය සඳහා මෙන්ම වැඩ බිම් තෝරා ගැනීම සඳහා කණ්ඩායම් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් මගී වෑන් රථය භාවිතා කරනු ලබයි.
6. කොන්ත්‍රාත්කරු විසින් ජල සම්පත් මණ්ඩලයේ ජල භූ විද්‍යාඥයන්ගේ ද සහාය ඇතිව ගංගා ද්‍රෝණි 3ක අධීක්ෂණය සඳහා විභවයන් සහිත කලාප (Potential Monitoring Zones) හඳුනාගැනීමේ මූලික අධ්‍යයනය අවසන් කරන ලදී.
7. දළ වශයෙන් අධීක්ෂණ ළිං (Monitoring Wells) 70ක් පමණ ස්ථාපනය කෙරෙනු ලබන මල්වතු ඔය ගංගා ද්‍රෝණියේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ද්‍රෝණිය තුළ විභව ස්ථාන 40ක් දැනටමත් හඳුනාගෙන තිබේ.
8. තෝරාගත් ස්ථාන 15ක භූ භෞතික විමර්ශනයන් අවසන් කර ඇත.
9. අධීක්ෂණ ළිං කැණීම හා ස්ථාපනය සඳහා අවශ්‍ය වන්නා වූ යන්ත්‍ර සූත්‍ර, උපකරණ, පාරිභෝගික භාණ්ඩ හා අමුද්‍රව්‍ය නිෂ්පාදනය හා සූදානම් කිරීමේ කටයුතු වලින් 90% ක් කොන්ත්‍රාත්කරු විසින් නිම කර තිබෙන අතර 2019 පෙබරවාරි මාසයේ දී නැව්ගත කිරීමට නියමිතය.
10. වර්ෂය තුළ දී මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී.
11. 2018 වර්ෂය සඳහා ඉලක්ක කරන ලද සමුච්චිත භෞතික ප්‍රගතිය වූ 37% හමුවේ 34.5%ක එම ප්‍රගතියක් අත්කර ගැනීමට ව්‍යාපෘතියට හැකියාව ලැබිණි.

## උ৭. ඵලදායීතාවය ඉහළ නැංවීමේ හා වාරිමාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP)

හෙක්ටෙයාර් 72,882ක සමස්ථ ප්‍රදේශයක් පුරා පැතිර පවතින මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 40ක හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 40ක වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ හා ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණෙන් අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (අන්තර් පළාත්/ පළාත්), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග කළමනාකරණ අංශය යන ක්‍රියාත්මක ආයතන හතර හා සම්බන්ධ වෙමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි.

ඵලදායිතාව වැඩි දියුණු කිරීම මඟින් ගොවි ප්‍රජාවේ ආදායම ඉහළ නැංවීමත් එමඟින් ව්‍යාපෘති ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් ව්‍යාපෘතියේ අවසන් අරමුණ වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 18,500ක් වන අතර ව්‍යාපෘතිය 2017 වසරේ සිට වසර 5ක් තුළ දේශීය අරමුදල් යටතේ නිම කිරීමට නියමිතය. ව්‍යාපෘතිය මඟින් පරිපාලන දිස්ත්‍රික්ක 15කට අයත් ගොවි පවුල් 97,832ක් සඳහා ප්‍රතිලාභ හිමි වනු ඇත. මෙය DAC ආකෘතිය යටතේ සැලසුම් කරන ලද ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් වේ.

**ව්‍යාපෘති සංරචක**

1. වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපන සංරචකය (IIRC)
2. ගොවිපල සංවර්ධන සංරචකය (OFDC)
3. කෘෂිකර්මික ඵලදායිතාව ඉහළ නැංවීමේ සංරචකය (APIC)
4. වාරි කළමනාකරණය සඳහා හැකියාවන් හා ධාරිතාවන් වැඩි කිරීම (ICIMC)

යන ව්‍යාපෘති සංරචක 04 ඔස්සේ භූමිය ජලය හා බෝග ඵලදායීතාවය ඉහළ නැංවීම ව්‍යාපෘති විෂය පථයට අයත් වේ.

2017 වර්ෂයේ රුපියල් මිලියන 300ක අයවැය ප්‍රතිපාදන යටතේ වාරි යෝජනා ක්‍රම 18කින් ආරම්භ කර 2018 වර්ෂයේ දී රුපියල් මිලියන 500ක අයවැය ප්‍රතිපාදනයක් යටතේ එම ව්‍යාපෘති කටයුතු වාරි යෝජනා ක්‍රම 51ක් දක්වා ව්‍යාප්ත කරන ලද අතර, සියළුම ව්‍යාපෘති කටයුතු සහභාගිත්ව ප්‍රවේශය ඔස්සේ ගොවීන් හා ගොවි සංවිධාන සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කෙරේ.

ඒකාබද්ධ ක්‍රියාකාරි සැලැස්ම (JAP) සකස් කිරීම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන කාර්යයන් වන අතර එමඟින් ප්‍රතිලාභ ලබන්නන්ගේ අවශ්‍යතා මෙන්ම සැබෑ ව්‍යාපෘති මැදිහත්වීම් හඳුනා ගැනීම උදෙසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නා වූ නියෝජිතායතනයන්ට පහසුකම් සපයනු ලබයි. ව්‍යාපෘති ක්‍රියාකාරකම්හි ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත පරිදි දැක්විය හැකිය.

1. ගරා වැටීමට ලක්ව ඇති වාරි ඇළ පද්ධති වල, විශේෂයෙන් ම කල්ගතවීම හා ගංවතුර තත්ත්වයන් නිසා හානියට පත් ගොවිපල මට්ටමේ කෙත් ඇළ හා බෙදුම් ඇළ මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම.

2. අහිතකර දේශගුණික විපර්යාසයන්හි බලපෑම් අවම කිරීම සඳහා ගොවිපල මට්ටමේ ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම.
3. ප්‍රවාහ මිණුම් ජාල (flow measurement network) ස්ථාපනය කිරීම හා මෙහෙයුම් හා නඩත්තු කටයුතු ශක්තිමත් කිරීම.
4. වාරි ව්‍යාපාර ප්‍රවේශ මාර්ග කරා සම්බන්ධ කරමින් කෘෂි මාර්ග වැඩිදියුණු කිරීම.
5. බෝග කළමනාකරණ ක්‍රමෝපායන්, බෝග විවිධාංගීකරණය, ගොවිපල ජල කළමනාකරණය, ගබඩා හා අලෙවි පහසුකම් වැඩි දියුණු කිරීම.
6. නියමු ආදර්ශන යටතේ ඉඩම් ඒකාබද්ධ කිරීම මඟින් පිරිවැය ඵලදායී ගොවිපල යාන්ත්‍රිකරණය හඳුන්වාදීම.
7. භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හා දුරස්ථ සංවේදන තාක්ෂණය හඳුන්වාදීම මඟින් වාරි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම.
8. වාරි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායීතාව ඉහල නැංවීම සඳහා වාරිමාර්ග පද්ධති මෙහෙයුම්, නඩත්තු කටයුතු හා කළමනාකරණ ධාරිතාවන් ශක්තිමත් කිරීම වෙනුවෙන් ගොවි ප්‍රජාව බල ගැන්වීම.
9. වටිනාකම් දාම (value chain) හා සැපයුම් දාම (supply chain) අවස්ථාවන් පිළිබඳ නව දැනුම හඳුන්වා දෙමින් තරුණ කණ්ඩායම් අතර කෘෂි ව්‍යාපාර ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම.

### වත්මන් තත්ත්වය

ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් ආරම්භ කෙරුණු කටයුතු වලින් 2017 වර්ෂය අවසන් වන විට 50%ක මූල්‍ය ප්‍රගතියක් ද 65%ක භෞතික ප්‍රගතියක් ද අත්පත් කර ගැනීමට හැකිවිය.

නියඟයේ බලපෑමට ලක්වීම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘති වැඩබිම් වල විශේෂයෙන්ම කෘෂිකාර්මික ඵලදායිතා ඉහළ නැංවීමේ සංරචකය (APIC) හා ගොවිපල සංවර්ධන සංරචකය (OFDC) යටතේ යම් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී බාධා ඇතිවිය. කෙසේ වුව ද, වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපන සංරචකය (IIRC) යටතේ භෞතික යටිතල පහසුකම් පුනරුත්ථාපනය සිදු කෙරිණි. එනමුදු නියඟයේ බලපෑමට ලක් වූ ප්‍රදේශ වල ගොවීන් කම්කරු රැකියා සඳහා නගරයට සංක්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ ඇති වූ ප්‍රමාදය නිසා IIRC සංරචකයට ද බලපෑම් ඇති විය.

2018 වර්ෂයේ අග භාගයේ දී කොන්ත්‍රාත් පදනම මත පූර්ණ කාලීනව ව්‍යාපෘති කාර්යයන්හි නියැලීම සඳහා නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගන්නා ලදී. ඔවුන්ට දිවයින පුරා ව්‍යාපෘති ක්‍රියාකාරකම් පවරන ලදී.

2018 වර්ෂයේ දී වාරිමාර්ග ව්‍යාපාර 51ක මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හැකි වූ අතර, වර්ෂය අවසානයේ දී භෞතික ප්‍රගතිය 90%ක් ද, මූල්‍ය ප්‍රගතිය 93.28%ක් ද වශයෙන් විය. වසරේ ප්‍රධානම බෝග වගාවන්ගෙන් තොර කාලය (off season) අතරතුරදී (එනම් සැප්තැම්බර් හා ඔක්තෝබර්) වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපන සංරචකය යටතේ ප්‍රගතිය වේගවත් විය.

ඒ අතරම, කෘෂිකාර්මික ඵලදායිතා ඉහළ නැංවීමේ සංරචකය (APIC) හා ගොවිපල සංවර්ධන සංරචකය (OFDC) යටතේ 2018 – 2019 මහ කන්නයේ දී ප්‍රගතිය වේගවත් විය. 2019 වර්ෂයේ දී වාරි ව්‍යාපාර 80 නිම ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. ව්‍යාපෘති මැදිහත්වීම් ආදර්ශනය කිරීම සඳහා තෝරාගත් වාරි ව්‍යාපාර වල ජල කළමනාකරණ වැඩසටහන්, භෝග විවිධාංගිකරණ වැඩසටහන් හා GIS දත්ත පද්ධති සකස් කිරීම ආදිය ආරම්භ කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත.

ව්‍යාපෘති සංරචක 4 යටතේ විවිධ වාරිමාර්ග ව්‍යාපාරයන්හි සිදු කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් පහත ඡායාරූප මඟින් පෙන්නුම් කෙරේ.

මොණරාගල දිස්ත්‍රික්කයේ හිඟුරු ආර ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසංස්කරණ වලින් පසු වී වගාව





හුරුළුවැව ව්‍යාපාරය වැඩිදියුණු කිරීම - අනුරාධපුර දිස්ත්‍රික්කය





පැරෂුට් තැටි බෙදාදීම (Parachute Trays) හා ඒවා කුඹුරු වල තැබීම නුවර දිස්ත්‍රික්කය





ලුණුගම්වෙහෙර ඇල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම - හම්බන්තොට දිස්ත්‍රික්කය





කෘෂිකර්ම ඵලදායීතා ඉහළ නැංවීමේ සංරචකය (APIC) යටතේ දේවහුව ව්‍යාපාරයේ බීජ වී නිෂ්පාදනය





## එ. ශක්‍යතා අධ්‍යයන

වාරිමාර්ග ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ 2018 වර්ෂය තුළ දී පහත සඳහන් ශක්‍යතා අධ්‍යයන සිදු කරන ලදී. 2018 වර්ෂය තුළ දී ශක්‍යතා අධ්‍යයන සඳහා වෙන් කරන ලද සමස්ථ මුදල **රුපියල් මිලියන 80** ක් වූ අතර එයින් භාවිතයට ගන්නා ලද්දේ **රුපියල් මිලියන 57.77** කි.

- වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධනය ක්ෂේත්‍රයට අදාල නීති සම්පාදන, රෙගුලාසි හා ප්‍රතිපත්ති අධ්‍යයන කිරීම හා යාවත්කාලීන කිරීම වෙනුවෙන් උපදේශකවරුන්ගේ සේවය ලබා ගැනීම සඳහා (මේ යටතේ උපදේශකවරුන් 4 දෙනෙකු යොදවා ඇත)
- ජල සම්පත් සංවර්ධනයේ හා වාරිමාර්ග සංවර්ධනයේ උපායමාර්ගික පාරිසරික තක්සේරු අධ්‍යයන
- ගිං - නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය - පාරිසරික බලපෑම් අධ්‍යයනය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලයේ මෙහෙයුම් පිරිවැය
- පහළ මල්වතු ඔය - පාරිසරික බලපෑම් අධ්‍යයනය
- භූගත ජල කළමනාකරණ විභව අවබෝධය සහ සංරක්ෂණය - යාපනය අර්ධද්වීපය - අදියර 1
- යාන් ඔය වාරිමාර්ග ව්‍යාපාර වලට සම්බන්ධ නොගැඹුරු ජලධර පද්ධති වල භූගත ජල මට්ටමේ හා ජලයේ ගුණාත්මකභාවයෙහි සිදුවන වෙනස්කම් අධීක්ෂණය කිරීම
- මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපාර වලට සම්බන්ධ නොගැඹුරු ජලධර පද්ධති වල භූගත ජල මට්ටමේ හා ජලයේ ගුණාත්මකභාවයෙහි සිදුවන වෙනස්කම් අධීක්ෂණය කිරීම
- වාරිමාර්ග ජල ඵලදායිතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

1. වාරිමාර්ග වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයට අදාල නීති සම්පාදන, රෙගුලාසි හා ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම හා යාවත්කාලීන කිරීම වෙනුවෙන් උපදේශකවරුන්ගේ සේවය ලබා ගැනීම සඳහා

   a) කුඩා විලච්චිය වැව ප්‍රතිස්ථාපනය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකස් කිරීම හා පලාගල කෝට්ටේ ඇල ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම හා එම ව්‍යාපෘති දෙකෙහි මූලස්ථායී වැඩ සංඝටක නිර්ණය කිරීම සහා ඉංජිනේරුමය හා නිර්මාණ සැලසුම් සඳහා දායකත්වය ලබාදීම.

      i) කුඩා විලච්චිය වැව සඳහා ශක්‍යතා වාර්තාව සකස් කරීම

      2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව වේල්ල අක්ෂය (dam axis) දිගේ කැණීම සිදු කිරීම. භූ විද්‍යා වාර්තාව කෙටුම්පත් කිරීම, ශක්‍යතා අධ්‍යයනයන් සඳහා ඉංජිනේරු ද්‍රව්‍ය විමර්ශනය, සංකල්පමය නිර්මාණ ක්‍රියාවලිය, පාරිසරික බලපෑම් අධ්‍යයනයේ ප්‍රගතිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීම හා කැමැත්ත ලබා ගැනීම, පැරණි බැම්මෙහි තත්වය පරීක්ෂා කිරීම, යෝජිත ප්‍රදේශය වෙනුවට ආර්ථික වශයෙන් වඩාත් ඵලදායි වාන් ප්‍රදේශ පරීක්ෂා කිරීම, රාජාංගනයෙන් ඉවත් කෙරුණු අරීය ගේට්ටු (Radial gates) භාවිතා කිරීමේ ඇති හැකියාව පිළිබඳ පරීක්ෂා කිරීම යනාදිය මෙහි අපේක්ෂිත ඉලක්කයන්ට ඇතුළත් වේ. 2018 වර්ෂයේදී මෙම අපේක්ෂිත ක්‍රියාකාරකම් වලින් ළඟා කරගත් ප්‍රගතිය 80%ක් විය.

      ii) පලාගල කෝට්ටේ ඇළ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති වාර්තාව

      2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව මැණුම් කටයුතු, වැවේ මූලික සමීක්ෂණය, ඉංජිනේරු ද්‍රව්‍ය විමර්ශනය කිරීම, භූ විද්‍යාත්මක විමර්ශන හා කෙටුම්පත් වාර්තාව, සංකල්පමය සැලසුම් කටයුතු, වනජීවී දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කැමැත්ත ලබා ගැනීම, පළමු 2Km සඳහා සැපයුම් ඇළ අනුරේඛන, ඇළ සැලසුම් කිරීම හා භූමියේ අනුරේඛන ප්‍රකාශයට පත් කිරීම, අත්පත් කර ගැනීමට නියමිත දේපල හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක සමාජ ආර්ථික සමීක්ෂණය, ඉවත්කරන ලද රාජාංගන රේඩියල් ගේට්ටු භාවිතා කිරීමේ ඇති හැකියාව පරීක්ෂා කිරීම සහ පාරිසරික බලපෑම් අධ්‍යයන ආරම්භ කිරීම සහ වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වල කැමැත්ත ලබා ගැනීම යනාදිය මෙහි අපේක්ෂිත ඉලක්කයන්ට ඇතුළත් වේ. 2018 වර්ෂයේදී මෙම අපේක්ෂිත ක්‍රියාකාරකම් වලින් ළඟා කරගත් ප්‍රගතිය 80% විය.

b) ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව ආරම්භක වාර්තාව ඉදිරිපත් කිරීම - පැවරුමේ පසුබිම හා ප්‍රතිඵල, අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා ජල ප්‍රතිපත්ති කෙටුම්පත හා අවශ්‍යය කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීම යනාදිය ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ දී මෙම අපේක්ෂිත ඉලක්කය සාර්ථක ලෙස ළඟා කරගෙන තිබේ.

c) ශ්‍රී ලංකාව තුළ වේලි ආරක්ෂණ විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම හා යාන්ත්‍රණය සුදුසු ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂි යෝජනා

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව වේලි අයිතිකාර සමාගම් වල ප්‍රතිපෝෂණය (feedback) ලබා ගැනීම සහ ආපදා කළමනාකරණය, පළාත් සභා උපදේශනය, අවසන් කෙටුම්පත ඉදිරිපත් කිරීම හා අනෙකුත් වේලි අයිතිකරුවන්ගේ නිර්දේශයන් තහවුරු කිරීම යනාදිය ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ දී මෙම අපේක්ෂිත ඉලක්කයන් සාර්ථක ලෙස ළඟා කරගෙන තිබේ.

d) කළු ගඟ වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, බස්නාගොඩ ජලාශ ව්‍යාපෘති ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත්තුව හා රාජාංගන උස්සාන වාරි ව්‍යාපාරයේ පුනරුත්ථාපනය සඳහා සැලසුම් හා ඉදිකිරීම් වෙනුවෙන් උපදේශන ප්‍රසම්පාදනය

i) කළු ගඟ වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශන ප්‍රසම්පාදනය

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව SFD වෙත ඉදිරිපත් කිරීම සඳහා RFP ලේඛන සකස් කිරීම, නිකුත් කිරීමට නියමිත ප්‍රසම්පාදන හා RFP ලේඛන කෙටි ලැයිස්තුගත කිරීම යනාදිය ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ දී මෙම අපේක්ෂිත ඉලක්කයන් සාර්ථක ලෙස ළඟා කරගෙන තිබේ.

ii) තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියේ උපදේශන ප්‍රසම්පාදනය

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් Synohydro Corporation Ltd සමඟ EPC කොන්ත්‍රාත්තුවකට එළඹීම, CECB වෙතින් ලබා ගත යුතු උපදේශන සේවාවන්, CECB සඳහා කාර්ය නිශ්චය කිරීමේ උපදෙස් (TOR), සාකච්ඡා පැවැත්වීම, CECB වෙතින් තාක්ෂණික හා මූල්‍ය යෝජනා ලබා ගැනීම යනාදිය ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ දී අපේක්ෂිත ඉලක්කයන් සාර්ථක ලෙස ළඟා කරගෙන තිබේ.

iii) බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතියේ EPC කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන ප්‍රසම්පාදනය

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව අභිලාෂ ප්‍රකාශන (EOI) කැඳවීම, ලංසුකරුවන් තෝරා ගැනීම, යෝජනා එක් රැස් කිරීම, ඇගයුම් ක්‍රියාවලිය, CAPC මඟින් නිර්දේශ කිරීම යනාදිය මෙයට ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ දී අපේක්ෂිත ඉලක්කයන් සාර්ථක ලෙස ළඟා කරගෙන තිබේ.

iv) රාජාංගන උස්සාන වාරි ව්‍යාපාරය පුනරුත්ථාපනය සඳහා සැලසුම් හා ඉදිකිරීම් වෙනුවෙන් උපදේශන ප්‍රසම්පාදනය

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම, සංකල්පීය වාර්තාව හා නියමිත විවේචන සමාලෝචනය යනාදිය ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ දී අපේක්ෂිත ඉලක්කයන් සාර්ථක ලෙස ළඟා කරගෙන තිබේ.

2. ජල සම්පත් සංවර්ධනයේ හා වාරිමාර්ග සංවර්ධනයේ උපායමාර්ගික පාරිසරික තක්සේරු අධ්‍යයන

ශ්‍රී ලංකාවේ ජල සම්පත් හා වාරි සංවර්ධනය සැලසුම් කිරීමේ අවශ්‍යතාවන් වශයෙන් ජල සම්පත් හා වාරිමාර්ග සංවර්ධනය පිළිබඳ උපාය මාර්ගික පාරිසරික අධ්‍යයනයන් සිදු කිරීමට අමාත්‍යාංශය විසින් තීරණය කරන ලදී. මෙම අධ්‍යයනයේ පුළුල් පරමාර්ථය වන්නේ යෝජිත ජල හා වාරිමාර්ග ව්‍යාපෘතිය මඟින් සමාජ, භෞතික හා ජෛව විද්‍යාත්මක පරිසරයක් කෙරෙහි ඇතිවන සමුච්චිත බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් එය වළක්වා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව නිර්දේශ සකස් කිරීමත්ය. ආරම්භයේදී මෙම ඇගැයුම රට පුරා ක්‍රියාත්මක වන ජල හා වාරි සංවර්ධන ව්‍යාපෘති 67 කින් ආරම්භ වුවද පසුව එය 80 ක් කරා ළඟා වූ අතර ඒවා අධ්‍යයන කරනු ලබන්නේ උපදේශකවරුන් විසිනි. මෙම කාර්යය සඳහා උපදේශන ආයතන ලෙස තෝරා ගනු ලැබුයේ මහවැලි උපදේශන කාර්යාංශ පෞද්ගලික සමාගමයි.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අමාත්‍ය මණ්ඩල උපදේශාත්මක ප්‍රසම්පාදන කමිටුව පත් කරන ලදී. මෙම අධ්‍යයනය සමීප ලෙස අධීක්ෂණය හා සමාලෝචනය කිරීම සඳහා සමාලෝචන කමිටුව පිහිටුවන ලදී. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ දී සමාලෝචන කමිටු රැස්වීම් කිහිපයක් සංවිධානය කර පවත්වන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලය සාකච්ඡා කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම් හා ප්‍රාදේශීය මට්ටමේ වැඩමුළු පවත්වා තිබුණි. අවසන් වාර්තාව වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත භාර දෙන ලද අතර සමාලෝචන කමිටු රැස්වීම් සංවිධානය කර තිබූ අතර පසුගිය රැස්වීම් වල දී මතු කෙරුණු විවේචන පිළිබඳව සලකා බලා ඇති ද යන්න සාකච්ඡා කෙරුණි. ද්‍රව්‍යය සංශෝධිත වාර්තාව අමාත්‍යාංශය වෙත භාර දෙන ලද අතර එය සමාලෝචන කමිටු සාමාජිකයන්ගේ එකඟතාවය සහිතව එම වාර්තාව හා සංශෝධිත අවසන් වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී ඇත.

3. ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය - පාරිසරික බලපෑම් අධ්‍යයනය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලයේ මෙහෙයුම් පිරිවැය

කාර්යය නිශ්චය කිරීමේ උපදෙස් (TOR) පරිදි පාරිසරික බලපෑම් අධ්‍යයනයන් සිදුකරන ලදී. EIA සඳහා ආරම්භක වාර්තාව සම්පූර්ණ කර භාර දෙන ලදී. 2018 අග භාගය වන තෙක් යාවත්කාලීන කරන ලද TOR නොලැබුණි. එබැවින් EIA අධ්‍යයනයේ ඉදිරි අධ්‍යයනය හා විමර්ශන කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වී තිබේ.

4. පහළ මල්වතු ඔය - පාරිසරික බලපෑම් අධ්‍යයනය

ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇති අතර වාර්තාව භාර දී තිබේ.

5. භූගත ජල කළමනාකරණය හා යාපන අර්ධද්වීපය සංරක්ෂණය - අදියර 1 පිළිබඳ විභව අවබෝධය

2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලසුම් අනුව අදාල නිලධාරීන් සමඟ රැස්වීම් හා වැඩමුළු පැවැත්වීම, ළිං පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා අධීක්ෂණය කිරීම, (විශ්ව විද්‍යාල සිසුන් හා පාසල් සිසුන්ගේ උදව් සහිතව අධීක්ෂණ කටයුතු සිදු කෙරෙනු ඇත) අතේ ගෙන යා හැකි EC මීටර් හා DGPS මට්ටම් කිරීමේ උපකරණ පිළිබඳ ප්‍රසම්පාදනය, එක් එක් ග්‍රාම නිලධාරි බල ප්‍රදේශ නියෝජනය කරමින් මූලික සිතියම් සකස් කිරීම හා දත්ත සම්පූර්ණ කිරීම මෙයට වාර්තා සකස් කිරීම යනාදිය මෙයට අයත් වේ. ඉලක්කගත ක්‍රියාකාරකම් වලින් 2018 වර්ෂය තුළදී ළඟා කරගත් ප්‍රගතිය 55% ක් විය.

6. යාන්ඔය වාරිමාර්ග ව්‍යාපාර වලට සම්බන්ධ නොගැඹුරු ජලධර පද්ධති වල භූගත ජල මට්ටම් හා ජලයේ ගුණාත්මකභාවයෙහි සිදුවන වෙනස්කම් අධීක්ෂණය කිරීම

2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව ජල නියැදි දත්ත එකතු කිරීම, භූ භෞතික විමර්ෂණ පැවැත්වීම, පරීක්ෂණ/ නිරීක්ෂණ මිහිවිදුමන් ඉදි කිරීම, පොම්ප කිරීමේ පරීක්ෂණ පැවැත්වීම, මට්ටම් කටයුතු, නියැදි වල රසායනික විශ්ලේෂණය, ජල මට්ටම් වාර්තා හා PH මීටර් වල ප්‍රසම්පාදනය හා දැනුවත්භාවය ගොඩනැගීම හා දත්ත අර්ථකථනය, වාර්තා සකස් කිරීම යනාදිය මෙහි ඉලක්කගත අරමුණු වේ. ඉලක්කගත ක්‍රියාකාරකම් වලින් 2018 වර්ෂය තුළ දී අත්කරගත් ප්‍රගතිය 74% ක් විය.

7. මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපාර වලට සම්බන්ධ නොගැඹුරු ජලධර පද්ධති වල භූගත ජල මට්ටම් හා ජලයේ ගුණාත්මක භාවයෙහි සිදුවන වෙනස්කම් අධීක්ෂණය කිරීම

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුව දත්ත එක්රැස් කිරීම, භූ භෞතික විමර්ෂණ සිදු කිරීම, පරීක්ෂණ/ නිරීක්ෂණ මිහිවිදුමන් ඉදි කිරීම, පොම්ප පරීක්ෂණ පැවැත්වීම, මට්ටම් කිරීමේ කටයුතු, නියැදි රසායනික විශ්ලේෂණ, ජල මට්ටම් වාර්තා ප්‍රසම්පාදනය, දැනුවත්භාවය ගොඩනැගීම දත්ත අර්ථකථනය හා වාර්තා සකස් කිරීම යනාදිය මෙහි ඉලක්කගත අරමුණු වේ. ඉලක්කගත ක්‍රියාකාරකම් වලින් 2018 වර්ෂය තුළ දී අත්කරගත් ප්‍රගතිය 74% ක් විය.

8. වාරි ජල ඵලදායිතා ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

ඉහත දක්වන ලද ව්‍යාපෘතිය ඌව හා වයඹ පළාත් වල සිදු කරන ලදී. පෝෂක ඇළ, ගං පතුල, වැව් බැම්ම, අතු ගංඟා, හරස් මාර්ග, එල්ලංගා (Cascade) පද්ධති හා වාරි ව්‍යාපාර වල මිණුම් කටයුතු, මට්ටම් කිරීම හා විමර්ෂණ කටයුතු යනාදිය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ. දැනුවත් කිරීමේ වැඩසටහන හා ක්ෂේත්‍ර චාරිකාව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සූදානම් කර තිබුණි.

# අ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## 1.0 හැඳින්වීම

වසර 110 කට පෙර ආරම්භ කරන ලද අධි ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගේ මග පෙන්වීම යටතේ එහි කාර්යයන් මෙහෙයවන අතර, මෙම දෙපාර්තමේන්තුව වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර දිවයින තුල ඇති ජලය යාමකව පාලනය කරන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වේ.

## 1.1 දැක්ම

"අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු" යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරය ද සුරැකමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා රටේ ජල සම්පත් වලින් ලබාගත හැකි ප්‍රයෝජන ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

## 1.2 මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරිසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභය ලබාදීම.

## 1.3 අරමුණු

අ. වාරි කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව ආදිය සඳහා පරිසරයට හිතකාමී ලෙස ජල සම්පත් සහ ඉඩම් සංවර්ධනය.

ආ. වාරි හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා වාරි ජල අපවහනය පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.

ඇ. ගංවතුර අවධානම ඇති ඉඩම්වලට ගංවතුර ආරක්ෂන හා ජල අපවහනය පද්ධතීන් සැපයීම.

ඈ. ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුලින් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශ වල දිළිඳුකම තුරන් කිරීම.

ඉ. තිරසාර කෘෂිකර්මය සඳහා ජල කළමනාකරණය.

ඊ. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.

උ. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

### 1.4 කාර්යයන්

අ. ගංගා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

ආ. වාරිමාර්ග ජල විදුලිය, ගංවතුර පාලනය සඳහා නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

ඇ. නව හා පවතින ගොවිතැන් කල හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම.

ඈ. ජලාපවහන ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීම ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අනතුරකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම.

ඉ. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ ගුරුත්ව, අපවහන සහ උස්සාන වාරි ව්‍යාපෘතීන් හි මෙහෙයුම්, නඩත්තු කිරීම්, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපනය කිරීම සහ ජල කළමනාකරණය කිරීම.

ඊ. ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණයන්හි පර්යේෂණ ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා යොදවා ගැනීම.

උ. මානව සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

ඌ. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

එ. ජල සම්පත් වැඩි දියුණු කිරීම, ඉංජිනේරුමය මූලික දැනුම, පස් වැඩ වල සහ කොන්ක්‍රීට් වැඩ වල ගුණාත්මකභාවය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සෑදීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබා දීම.

## 2.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වගා කාර්ය සාධනය

### 2.1 ජල කළමනාකරණ අංශය

#### 2.1.1 පරමාර්ථයන්

ජල කළමනාකරණ අංශයේ පරමාර්ථ වන්නේ,

I. ජලය උපරිම කාර්යක්ෂමව ඵලදායීතාවයෙන් හා නැවත භාවිතයට ගනිමින් ඒකක භූමියකින් උපරිම අස්වැන්නක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.

II. ගොවීන්ගේ ආදායම් මාර්ග වර්ධනය කිරීමට පවතින සම්පත් උපරිම අයුරින්ප්‍රයෝජනයට ගැනීම.

ඉහත පරමාර්ථ ඉටුකිරීමට පහත කරුණු එකිනෙක උපයෝගී කරගෙන ඇත.

1) ගංගා ද්‍රෝණි වල ජලය කළමනාකරණය කිරීම සඳහා එහි ප්‍රයෝජන ලබන්නන් සමග කටයුතු කිරීම.
2) ජල කළමනාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම.
3) ක්ෂේත්‍ර ජල කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීම් ක්‍රියාත්මක කිරීම.
4) ජල ධාරා ප්‍රදේශ කළමනාකරණය හා ජලයේ ගුණාත්මක භාවය සඳහා දැනුවත් කිරීම් ක්‍රියාත්මක කිරීම.
5) මනා ජල කළමනාකරණයක් සඳහා පුනුරුත්ථාපන හා සංවර්ධනය කිරීමේ කටයුතු
6) කාළගුණික විපර්යාස නිසා සිදුවන බලපෑම් අවම කිරීමට යෝජනා සකස් කිරීම.

### 2.1.2 ජල කළමනාකරණය

ශ්‍රී ලංකාවට සාමාන්‍යයෙන් වර්ෂාව ලැබෙන කාල සීමාවන් පහත පරිදි වේ.

| මෝසම | කාල සීමාව | වර්ෂාව ලැබෙන ප්‍රතිශතය |
|---|---|---|
| පළමු අන්තර් මෝසම | මාර්තු සිට අප්‍රේල් දක්වා | 14% |
| නිරිත දිග මෝසම | මැයි සිට සැප්තැම්බර් දක්වා | 30% |
| දෙවන අන්තර් මෝසම | ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වා | 30% |
| ඊසාන දිග මෝසම | දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා | 26% |

මෙම වර්ෂාවන් ශ්‍රී ලංකාව පුරාවටම ඒකාකාරී ලෙස නොලැබෙන නිසා කුඩා වපසරියක් සහිත රටක් වුවද විශාල විවිධත්වයකින් යුත් කෘෂි පාරිසරික වටපිටාවක් මෙහි දක්නට ඇත. ප්‍රධාන වශයෙන් නිරිත දිග මෝසම් වැසි ලැබෙන්නේ දිවයිනේ නිරිත දිග කලාපයටය. මුල දී මෙම වැසි නිරිත දිග පහත් බිම් ප්‍රදේශ වෙත ලැබෙන අතර සුළගේ බලපෑමෙන් රට අභ්‍යන්තරයේ ද වැසි ඇති වී ජූනි සිට අගෝස්තු දක්වා මධ්‍යම කඳුකර ප්‍රදේශයේ සැලකිය යුතු ඉහළ වර්ෂාපතනයක් ලබා දේ. ඊසාන දිග මෝසම් වැසි සමයේදී දිවයිනේ නැගෙනහිර ප්‍රදේශ වෙත මිලිමීටර 200 සිට මිලිමීටර 1200 අතර වූ වර්ෂාපතනයක් ලැබේ. මෙම මෝසම් හතර අතරින් කාලානුක්‍රමික වර්ෂා කාල දෙකක් එකට ගෙන මහ හා යල ලෙස ශ්‍රී ලංකාවේ වගා කන්න හඳුන්වා දී ඇත.

සාමාන්‍යයෙන් යල කන්නය පළමු අන්තර් මෝසම හා නිරිත දිග මෝසම මත රඳා පවතී. කෙසේ වුවද නිරිත දිග මෝසම වියළි කලාපයට එතරම් බලපෑම් නොකරන අතර මාර්තු මැද සිට මැයි මුල් කාලය තුල පළමු අන්තර් මෝසම නිසා යල කන්නයට වර්ෂාව ලැබේ. යල කන්නය මුලදී පමණක් සැලකිය යුතු වර්ෂාවක් ලැබෙන නිසා වියළි කලාපයේ වගාව අඩු මට්ටමක පවතී.

විශාල කුඹුරු ප්‍රමාණයක් අස්වද්දන මහ කන්නය මුලදී ලැබෙන දෙවන අන්තර් මෝසම සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාස වල මැදදී පටන්ගෙන ඊසාන දිග මෝසමත් සමග ජනවාරි/ පෙබරවාරි දක්වා ක්‍රියාත්මක වේ.

ජල කළමනාකරණය යටතේ ජල ධාරිතා හැරවුම් ප්‍රවාහ ගලායම නියාමනය මැනීම අවශය අවස්ථාවේදී අවශ්‍ය ප්‍රමාණය භාවිතය සහ බෙදා දීම වැඩි ජලය ඉවත් කිරීම වැඩි දියුණු කිරීම ආදී ක්‍රම භාවිතයෙන් අස්වැන්න වැඩි කිරීම සිදු කරයි. මෙම අරමුණු සාර්ථක කර ගැනීමට ජල කළමනාකරණ අංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රම සැලසුම් උප කොටස යටතේ ක්‍රියාත්මක වේ.

ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය මගින් මධ්‍යම හා විශාල ව්‍යාපාර වල ප්‍රගතිය සමාලෝචනය කොට සහභාගීත්ව ජල කළමනාකරණය මගින් ක්ෂේත්‍රයේ ජල කළමනාකරණය කොට ඉඩම් හා ජලය කාර්යක්ෂමව භාවිතා කොට අස්වැන්න වැඩි කර ගැනීමට මග පෙන්වීම හා මෙහෙයවීමට කටයුතු කරනු ඇත.

### 2.1.3 2017/18 මහ කන්නය

පැවති වියළි කාලගුණය හේතුවෙන් ජලාශ වල අඩු ජල ධාරිතාවක් යටතේ මහ කන්නය ආරම්භ විය. 2017 ඔක්තෝම්බර් මුලවන විට ප්‍රධාන ජලාශ 73 හි ජල ධාරිතා ප්‍රතිශතය 16% පමණ විය. ඔක්තෝම්බර් මාසය තුළ ලැබුණු අඩු වර්ෂාපතනය නිසා ජලාශ වල ජල ධාරිතාවය 6% කින් ඉහළ යන ලදී. සැලකිය යුතු වර්ෂාපතනයක් නොවැම්බර් මස ලැබුණු හෙයින් බිම් සැකසීම වර්ෂාපතනයත් සමග ආරම්භ විය. ජලාශ වල ධාරිතාවය දෙසැම්බර් මස මුල වන විට 38% දක්වා ඉහළ ගිය අතර ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාර 86% ක් ද මධ්‍යම වාරිමාර්ග ව්‍යාපාර 71% ක් ද වගා කරන ලදී.

2018 ජනවාරි මස ආරම්භයේදී ජලාශ වල ජල ධාරිතාවය 42% දක්වා ඉහළ ගිය අතර වගා ජල අවශ්‍යතාවය වර්ෂාපතනය සමග සපුරා ගත හැකි විය. අම්පාර, බදුල්ල, හම්බන්තොට, නුවර, මොණරාගල, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි කුඹුරු ඉඩම් 90% පමණ වගා කිරීමට හැකි විය.

වගාවට අවශ්‍ය අවම ජල ප්‍රමාණයන් නිකුත් කරමින් ක්ෂේත්‍ර නිලධාරීන් දැක්වූ සහයෝගය මත වගා හානි වාර්තා නොවීය. ඒ අනුව 2018 පෙබරවාරි වන විට ජලාශයන්හි ජල ධාරිතාවය 34% රදවා ගැනීමට හැකි විය.

***වගුව 01 : 2017/18 මහකන්නය වගා කිරීමේ දත්තයන්***

| අංකය | දිස්ත්‍රික්කය | මුළු වපසරිය (අක්කර) | වගා කළ ප්‍රමාණය (අක්කර) | | | දිස්ත්‍රික්ක ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | වී | වෙනත් බෝග | එකතුව | |
| 1 | අම්පාර | 156,836 | 130,381 | 11,012 | 141,393 | 90% |
| 2 | අනුරාධපුර | 98,836 | 59,900 | 7,358 | 67,258 | 68% |
| 3 | බදුල්ල | 23,321 | 19,981 | 3,340 | 23,321 | 100% |
| 4 | මඩකලපුව | 56,240 | 47,344 | 6,073 | 53,417 | 95% |
| 5 | මාතලේ | 28,255 | 23,429 | 1,926 | 25,355 | 90% |
| 6 | මහනුවර | 7,221 | 6,064 | 821 | 6,885 | 95% |
| 7 | කොළඹ | 2,138 | 920 | 0 | 920 | 43% |
| 8 | ගාල්ල | 14,919 | 5,138 | 55 | 5,193 | 35% |
| 9 | ගම්පහ | 11,345 | 9,641 | 0 | 9,641 | 85% |
| 10 | හම්බන්තොට | 61,361 | 59,361 | 2,000 | 61,361 | 100% |
| 11 | කලුතර | 2,400 | 480 | 0 | 480 | 20% |
| 12 | කුරුණෑගල | 42,142 | 25,299 | 0 | 25,299 | 60% |
| 13 | මන්නාරම | 31,892 | 31,892 | 0 | 31,892 | 100% |
| 14 | මාතර | 20,522 | 15,622 | 0 | 15,622 | 76% |
| 15 | මොණරාගල | 19,412 | 16,716 | 110 | 16,826 | 87% |
| 16 | පොළොන්නරුව | 89,007 | 74,195 | 6,600 | 80,795 | 91% |
| 17 | පුත්තලම | 17,172 | 3,074 | 712 | 3,786 | 22% |
| 18 | රත්නපුර | 6,666 | 5,381 | 300 | 5,681 | 85% |
| 19 | ත්‍රිකුණාමලය | 56,351 | 52,450 | 0 | 52,450 | 93% |
| 20 | වවුනියා | 7,427 | 1,442 | 0 | 1,442 | 19% |
| | එකතුව | 753,462 | **588,710** | **40,307** | **629,017** | **83%** |

### 2.1.4 2018 යල කන්නය

2018 අප්‍රේල් ආරම්භයේදී ප්‍රධාන ජලාශ වල ජල ධාරිතාවය ඉතා සුළු වශයෙන් 38% දක්වා ඉහළ ගියද මධ්‍යම පරිමාණ ජලාශ වල ජල ධාරිතාව ඉතා අඩු මට්ටමක පැවති හෙයින් වගාවන් ආරම්භ නොකරන ලදී. බොහෝ ව්‍යාපාරයන්හි වගා කටයුතු ආරම්භ වූයේ අප්‍රේල් 15 පසුවය. මැයි මස මුල දී ප්‍රධාන ජලාශ වල ජල ධාරිතාවය ඉතා සුළු වශයෙන් 41% දක්වා ඉහළ යන ලදී.

මැයි මාසය තුළ ලැබුණු ඉහළ වර්ෂාපතනයත් සමග ජලාශ වල ජල ධාරිතාවය 49% දක්වා වැඩි විය. ඒ අනුව ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාර වල67% ද මධ්‍යම වාරිමාර්ග ව්‍යාපාර වල 55% ද ලෙස වගා කටයුතු ආරම්භ කරන ලදී. බදුල්ල, මඩකලපුව, හම්බන්තොට, කුරුණෑගල දිස්ත්‍රික්ක වල ජලාශයන්හි 75% දක්වා ජල ධාරිතාව වැඩි විය. අධික වර්ෂාපතනයෙන් වගා හානි කිසිවක් වාර්තා නොවිණි.

***වගුව 02 : 2018 යල කන්නය***

| අංකය | දිස්ත්‍රික්කය | මුළු වපසරිය (අක්කර) | වගා කළ ප්‍රමාණය (අක්කර) | | | දිස්ත්‍රික්ක ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | වී | වෙනත් බෝග | එකතුව | |
| 1 | අම්පාර | 156836 | 54,114 | 9,662 | 63,776 | 41% |
| 3 | බදුල්ල | 23321 | 10,870 | 8,810 | 19,680 | 84% |
| 2 | අනුරාධපුර | 98836 | 29,331 | 9,050 | 38,381 | 39% |
| 4 | මඩකලපුව | 56240 | 48,400 | 0 | 48,400 | 86% |
| 5 | මාතලේ | 28255 | 13,743 | 1,314 | 15,057 | 53% |
| 6 | මහනුවර | 7221 | 2,237 | 3,384 | 5,621 | 78% |
| 7 | කොළඹ | 2138 | 650 | 0 | 650 | 30% |
| 8 | ගාල්ල | 14919 | 1,963 | 0 | 1,963 | 13% |
| 9 | ගම්පහ | 11345 | 11,154 | 0 | 11,154 | 98% |
| 10 | හම්බන්තොට | 61361 | 61,353 | 0 | 61,353 | 100% |
| 11 | කලුතර | 2400 | 550 | 0 | 550 | 23% |
| 12 | කුරුණෑගල | 42142 | 27,231 | 2,488 | 29,719 | 71% |
| 13 | මන්නාරම | 31892 | 1,255 | 200 | 1,455 | 5% |
| 14 | මාතර | 20522 | 17,322 | 0 | 17,322 | 84% |
| 15 | මොණරාගල | 19411 | 14,544 | 170 | 14,714 | 76% |
| 16 | පොළොන්නරුව | 89007 | 84,160 | 4,585 | 88,745 | 100% |
| 17 | පුත්තලම | 17172 | 10,300 | 1,180 | 11,480 | 67% |
| 18 | රත්නපුර | 6665 | 5,650 | 243 | 5,893 | 88% |
| 19 | ත්‍රිකුණාමලය | 56351 | 50,368 | 402 | 50,770 | 90% |
| 20 | වවුනියා | 7427 | 470 | 0 | 470 | 6% |
| | **එකතුව** | **753462** | **445,665** | **41,488** | **487,153** | **65%** |

### 2.1.5 සහභාගීත්ව කළමනාකරණ වැඩසටහන්

- **ලෝක ජල දිනය 2018**

ලෝක ජල දිනය පිරිසිදු ජලයේ වැදගත්කම ඉස්මතු කරමින් වාර්ෂිකව පැවැත්වේ. 2018 වර්ෂයේ ලෝක ජල දිනය "සොබාදහම සඳහා ජලය" යන තේමාව යටතේ මාර්තු මස 21 වන දින කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. මෙම වැඩසටහනෙහි සංස්කෘතික අංග, දැනුවත් කිරීමේ වීඩියෝ දර්ශන යන ආදිය ඇතුළත් විය. බොහෝ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල විසින් වැඩසටහන් හා චිත්‍ර තරග පවත්වමින් ජලයේ වැදගත්කම හා එහි සුභාවිතය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.






- **දැදුරු ඔය ජල පාලන මෙහෙයුම් කමිටුව**

වර්ෂ 2017 දී ඔක්තෝම්බර් මස 07 වන දින කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක වල ජලය කළමනාකරණය පහසුවීම පිණිස දැදුරු ඔය ජල පාලන කමිටුව පිහිටුවන ලදී. පහත ආයතන ඉහත කමිටුවට සහභාගී වී ඇත.

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
2. කුරුණෑගල / පුත්තලම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
3. කුරුණෑගල/ පුත්තලම දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලය
4. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය

2018 වර්ෂය තුළ දී ජල පාලන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී.

- **ජල කළමනාකරණ උප දෙපාර්තමේන්තුව යටතේ වන ඉදිකිරීම් කටයුතු**



රුගම් කොට්ඨාශයේ වාහනේරි ව්‍යාපාරයේ පාලන නිර්මිතය ඉදිකිරීම



රුගම් කොට්ඨාශයේ කඩ්ඩුමුරිවු ව්‍යාපාරයේ හැරවුම් නිර්මිතය ඉදිකිරීම

## 2.2 වාරි හා ඵලදායිතා ප්‍රවර්ධන අංශය

**අරමුණ**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන යටතේ ස්ථාපිත අංශයකි. එම අංශයේ අරමුණ වන්නේ ගොවි ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම උදෙසා ඒකාබද්ධ ප්‍රවේශයක් මගින් ජල ඒකකයක් හා ඉඩම් ඒකකයක් සඳහා උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට වාරි කර්මාන්තය සූදානම් කිරීමයි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වගා බිම් අක්කර 756,000 ක් නඩත්තු කරන අතර එය මුළු මහා වාරිමාර්ග වපසරියෙන් 75% ක් වේ. නඩත්තු කරනු ලබන සම්පූර්ණ වාරි ව්‍යාපාර සංඛ්‍යාව 354 කි. එහෙත්, පසුගිය කන්න දෙකක් තුල අපේක්ෂිත වගා බිම් ප්‍රමාණය, නියඟය හා ගංවතුර හේතුවෙන් වගා කිරීමට නොහැකි විය. පසුගිය කන්න දෙක තුල ඉහත බලපෑම් හේතුවෙන් වගා කරන ලද්දේ 50% ක පමණ වපසරියක් වන අතර, වර්තමානය වන විට ජාතික ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල වී ඇත. මේ අතර කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති පුරෝකථන අනුව සුභදායී තත්ත්වයක් බලාපොරොත්තු වන බැවින් ඉදිරි 2018/ 2019 මහා කන්නය 90% වැඩි ප්‍රතිශතයක් වගා කිරීම සඳහා සැලසුම් කර ඇත.

ඉහත තත්ත්වයන් යටතේ ජාතික ආහාර සුරක්ෂිතතාවය සඳහා මෙන්ම ගොවි ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 2.2.1 ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP)

මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතිය මගින් වගා බිම් හෙක්ටයාර් 77,882 ක ඵලදායිතාවය ඉහළ නැංවීමත් ගොවි පවුල් 97,832 ක සමාජ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමත් ඉලක්ක කර ඇත. පහත සංරචක හතරක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

i. වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපන සංරචකය
ii. ගොවිපල සංවර්ධන සංරචකය
iii. කෘෂිකර්ම ඵලදායිතා ප්‍රවර්ධන සංරචකය
iv. වාරි කළමනාකරණ ධාරිතා ප්‍රවර්ධන සංරචකය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ ප්‍රධාන පදනම වන්නේ ඒකාබද්ධ කළමනාකරණ ප්‍රවේශය බැවින් කෘෂි කර්මාන්තයට සම්බන්ධ සියලු ආයතන එනම්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරි කළමනාකරණ අංශය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතන සියල්ල සාමුහික වගකීමෙන් යුතුව වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ මූලික කටයුතු ආරම්භ කරන ලදී. මෙම වර්ෂයේ බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කල අතර ඒවා,

- මූලික දත්ත සමීක්ෂණ වාර්තාව, ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම, පාද සමීක්ෂණය හා විගණන කමිටු පිහිටුවීමේ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සහ PEISEIP යටතේ 2017 හා 2018 වැඩසටහන් සඳහා තෝරා ගත් වාරි ව්‍යාපාර වල ක්‍රියාත්මක කිරීම.

- ව්‍යාපෘති චක්‍රය අනුව, සෑම වාරි ව්‍යාපාරයකම දත්ත එකතු කිරීම හා පාලනය කිරීම සඳහා නිවැරදි උපදෙස් ලබා දීම.

- ව්‍යාපෘති අධ්‍යක්ෂ (PEISEIP) හා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ක්ෂේත්‍රය පිළිබඳ දෙන ලද උපදෙස් හා මාර්ගෝපදේශ අනුව ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම.

- ප්‍රධාන සංරචක 04 අනුව, 2017 හා 2018 වාර්ෂික වැඩසටහන් වලට අදාළ වාරි ව්‍යාපාර 51 සඳහා ප්‍රතිපාදන නිකුත් කිරීම.

- මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ ප්‍රධාන කාර්යාලය, වාරිමාර්ග අධ්‍යක්ෂ (කලාප) සහ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල නිලධාරින් සඳහා දීමනා ලබාදීමේ දී සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.





## 2.2.2 වාරි ව්‍යාපාර වල ආක්‍රමණශීලි ආගන්තුක ශාක කළමනාකරණ ව්‍යාපෘතිය

- සැල්විනියා හා ජපන් ජබර ජෛව පාලනය කිරීම සඳහා අභිජනන මධ්‍යස්ථාන 25 ක් දිවයින පුරා පිහිටුවා පවත්වා ගෙන යෑම.

- 2018 ලෝක ජල දිනයට "වාරි ව්‍යාපාර වල ආගන්තුක ආක්‍රමණශීලි ශාක කළමනාකරණය" මැයෙන් දිනමිණ ජාතික පුවත්පතේ තිරසර කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පළ කිරීම.





- නිරීක්ෂණ හා අධ්‍යයන කටයුතු වලට අනුව කාර්යක්ෂම හා ඵලදායි ලෙස ජලජ ශාක (ජපන් ජබර හා සැල්වීනියා ඇතුළු) වාරි පද්ධතියෙන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය සුවිශේෂී යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා මෙම අංශයෙන් ඉදිරිපත් කල යොජනා අනුව, වාරිමාර්ග ජල සම්පත් කළමනාකරණ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමා මඟ පෙන්වීම යටතේ යන්ත්‍ර හා යාන්ත්‍රික අංශය මගින් සිදු කිරීම.





මෙම යන්ත්‍රය භාවිතා කර මහකන්දරාව වැවේ ආක්‍රමණශීලි ශාක ඉවත් කරන අකාරය.

### 2.2.3 මහකන්දරාව වැවේ ආගන්තුක ආක්‍රමණශීලි ශාකයක් වන නාජාස් මරීනා (කටු පෙඳ) පාලනය කිරීම

- පලමු පියවර ලෙස මෙය මිරිදිය ජලාශයක හඳුනා ගැනීම. (මහකනදරාව ජලාශය)
- වහාම ක්‍රියාත්මක වන පරිදි වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් පාර්ශවකරුවකු වන IAS ඒකක කළමනාකරුගෙන් ආගන්තුක ආක්‍රමණශීලි ශාකය හඳුනා ගැනීම හා NISSG සාමාජික මහාචාර්ය සිරිල් විජේසුන්දර මහතා සමඟ මහකනදරාව වැවේ ක්ෂේත්‍ර චාරිකාවේදි මෙමගින් ඇති විය හැකි අහිතකර බලපෑම් පැහැදිලි කිරීම.
- ගොවි සංවිධාන ප්‍රධානීන්, සාමාජිකයින් සහ ක්ෂේත්‍ර නිලධාරීන් මේ කටයුත්ත සඳහා සහභාගී වීම.
- මහාචාර්ය සිරිල් විජේසුන්දර මහතා විසින් නව ආක්‍රමණශීලි ආගන්තුක ශාකයක් ලෙස නාජාස් මරීනා හඳුනා ගැනීම.





- නව ආක්‍රමණශීලි ශාකය පිළිබඳ ගොවීන් හා නිලධාරීන් දැනුවත් කිරීම. IAS කළමනාකරණය හා නව ආක්‍රමණශීලි ශාකය පිළිබඳ මහකනදරාව වාරි ව්‍යාපාරයට අයත් සියලුම සමාන්තර ආයතන වල, ගොවි සංවිධාන ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ආක්‍රමණශීලි ශාකය ජලාශයෙන් ඉවත් කරන අකාරය





- ජලාශයේ පහල ස්ථර වලට හිරු එළිය පිවිසීම වැළැක්වීම සඳහා ජලය මතුපිට ආරක්ෂිත ආවරණයක් භාවිතා කිරීම පිළිබඳව





- වාරි පද්ධතිය තුළ ආගන්තුක ආක්‍රමණශීලි ශාක කළමනාකරණය - 2019

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සම්පාදනය කරන ලද ජෛව විවිධත්ව පාලන ක්‍රම හා පැතිරීම පාලනය කිරීම පිළිබඳ අවසන් වාර්තාවේ පිටපතක් සියලුම වාරිමාර්ග අධ්‍යක්ෂකවරුන් වෙත බෙදා දීම.

### 2.2.4 ජාතික ප්‍රදර්ශන හා අනෙකුත් උත්සව

පාසල් ළමයින් හා සාමාන්‍ය ජනතාව සඳහා අපගේ කාර්යභාරය හා වාරිමාර්ග තාක්ෂණය ප්‍රදර්ශනය කිරීම විස්තර කිරීම සඳහා පාසල් වලින් හා ජාතික උත්සව වලින් බොහෝ ඉල්ලීම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලැබෙනු ඇත. එවැනි ප්‍රදර්ශන දෙකකට සම්බන්ධ විය. මෙහි දී සියලු අංග ඇතුළත් සම්පූර්ණ කුටියක් නිර්මාණය කරන ලදී.





- “Harvest -2018” Agriculture Modernization ප්‍රදර්ශනය බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී.

### 2.2.5 “ව්‍යාපාර කළමනාකරණ කමිටු හා ගොවි සංවිධාන වල තොරතුරු” ඇතුලත් අත් පොතක් නිර්මාණය කිරීම

වප් හවුල වැඩසටහන යටතේ ව්‍යාපාර කළමනාකරණ කමිටු සහ ගොවි සංවිධාන වල ව්‍යාපාරවල විස්තර ඇතුලත් නව අත් පොතක් සකස් කිරීම. එහි වාරි ව්‍යාපාරයේ නම එක් එක් වාරි ව්‍යාපාරය යටතේ පවත්නා ගොවි සංවිධාන සංඛ්‍යාව, ඔවුන්ගේ මුල්‍යමය ධාරිතාව, ගොවි පවුල් සංඛ්‍යාව, යල හා මහ කන්න වල ව්‍යාපාරය ආවරණය වන අක්කර ප්‍රමාණය, ව්‍යාපාර කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන් සහ ව්‍යාපාර කළමනාකරණ කමිටු පිළිබඳ විස්තර මෙම අත් පොතට ඇතුලත් කර ඇත.





### 2.2.6 ලෝක ජල දිනය සැමරීමේ වැඩසටහන

ලෝක ජල දිනය සෑම වසරකම මාර්තු 22 දින සමරන අතර ප්‍රධාන කාර්යාලයේ උත්සවය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විය. අනෙක් දැනුවත් කිරීමේ උත්සව පාසැල් ළමයින් හා මහජනතාව සඳහා දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල දී පැවැත්විය.







### 2.2.7 සම්පාදායික වී වගා වැඩසටහන සහ කාබනික පොහොර වැඩසටහන

අනුරාධපුරය, පොළොන්නරුව, මොනරාගල, ගාල්ල, හම්බන්තොට හා මහනුවර මෙම වැඩසටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක කිහිපයකි. සුළු ප්‍රමාණයක නියමු ව්‍යාපෘතියක් හැටියට සාර්ථක ප්‍රතිඵල ලබා ගත්තා. එබැවින් නවීන වී ප්‍රභේද සමඟ කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩි අවධානය යොමු වී ඇත. කාබනික පොහොර නිෂ්පාදනය ජාතික අවශ්‍යතාවයක් බවට පත්ව ඇත අතර ගොවින් පුහුණු කිරීම සහ අනෙකුත් මූලික අවශ්‍යතා සැපයීම දිරිමත් කර ඇත. වර්තමානයේ ඉල්ලුම වැඩිවීම හා තවත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේ බලාපොරොත්තු වේ.

## 3.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල වර්තමාන තත්වය

2018 වර්ෂය මූලධන වියදම් සඳහා රුපියල් මිලියන 11,475.20 ක ප්‍රතිපාදන ඇති අතර වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට වියදම රුපියල් මිලියන 8,263.125 කි. එක් එක් අයිතමය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදනය හා දෙසැම්බර් මස අවසානය වන විට ප්‍රගතිය පහත දැක්වේ.

### මූලධන වියදම්වල සාරාංශය

| ව්‍යාපෘතියේ නම | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මිලියන) | 2018 දෙසැම්බර් අවසාන විට වියදම (රු.මිලියන) |
|---|---|---|
| **ව්‍යාපෘති 01**<br>පරිපාලන හා ආයතනික සේවා | 47.000 | 41.318 |
| **ව්‍යාපෘති 02**<br>වාරි ව්‍යාපාරවල පරිපාලන හා නඩත්තුව | 2,994.50 | 2454.677 |
| **ව්‍යාපෘති 03**<br>මහා පරිමාණ වාරි ව්‍යාපාර | 7878.700 | 5373.685 |
| **ව්‍යාපෘති 04**<br>මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපාර | 555.00 | 393.445 |
| **මුළු එකතුව** | **11475.20** | **8263.125** |

### පුනරාවර්තන වියදම්වල සාරාංශය

| ව්‍යාපෘතියේ නම | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මිලියන) | 2018 දෙසැම්බර් අවසාන විට වියදම (රු.මිලියන) |
|---|---|---|
| **ව්‍යාපෘති 01**<br>පරිපාලන හා ආයතනික සේවා | 659.960 | 647.241 |
| **ව්‍යාපෘති 02**<br>වාරි ව්‍යාපාරවල පරිපාලන හා නඩත්තුව | 2455.710 | 2184.140 |

## මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

1) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය
2) මැණික් ගඟ ජලාශය (වෙහෙරගල)
3) රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය
4) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය
5) ගල්ඔය නවෝදය ව්‍යාපෘතිය
6) මොරාණ ජලාශ ව්‍යාපෘතිය
7) කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය
8) කුඹුක්කන් ඔය ජලාශය
9) රුගම් කිතුල් ජලාශ ව්‍යාපෘතිය
10) පොළොන්නරු දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය
11) තෝරාගත් අත්‍යාවශ්‍ය මහා වාරි ව්‍යාපාර ප්‍රතිසංස්කරණය
12) ඌව වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය
13) කැළණි ගඟ ගංවතුර ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
14) මඩුල්ල බිංගොඩ කොලැල්ලැවත්ත ජලාශය ප්‍රතිස්ථාපනය කිරීම
15) ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම
16) කැළණි, මුන්දෙණි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය
17) කවුඩුල්ල පියවර 11 දම්සෝපුර දක්වා වම් ඉවුර ඇල දිගුව
18) මහගල්ගමුව වැව ප්‍රගුණවත් කිරීම
19) ගිංගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම

## 3.1 දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි. 13,540 |
| සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි. 12,289.363 |

**2018 වර්ෂය තුළ**

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම | : රු.මි. 750 |
| 2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන්කිරීම | : රු.මි. 550 |
| ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි. 474.36 |

**තාක්ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක |
| ජලාශ ධාරිතාවය | : ඝන මීටර මිලියන 75 |
| වගා කල හැකි භූමි ප්‍රමාණය | : පැරණි - අක්කර 21,000 නව - අක්කර 150<br>**එකතුව** - අක්කර 21,150 |
| ප්‍රතිලාභ ලබන පවුල් ගණන | : පවුල් 11,500 |
| බීමට ගතහැකි ජල ප්‍රමාණය | : පවුල් 10,000 |
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි. 10,540 |

වාරියපොල සිට 18km දුරින් දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය පිහිටා ඇත. වගා කිරීමට හා බීමට ජලය ලබා දීම මඟින් මෙම ප්‍රදේශයේ ජනතාවට විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය මඟින් ලැබේ. මීට අමතරව රතඹලේ ඔය ද්‍රෝණි සංවර්ධන සහ දැදුරු ඔය වම් ඉවුරෙහි උස්සාන වාරිමාර්ග ක්‍රමය සංවර්ධනය සම්පූර්ණ කර ඇත.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 99%

**2018 වර්ෂය සඳහා**

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම | : රු.මි. 310 |
| ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි. 268.612 |

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| වම් ඉවුරේ සහ දකුණු ඉවුරේ ඉතුරු වැඩ | 80 |
| ස්ටොප්ලොග් ගේට්ටු ස්ථාපනය කිරීම | 35 |
| ශාකා ඇළ මාර්ග ඉදිකිරීම | 90 |
| ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම | 75 |
| යටිතල පහසුකම් දියුණු කිරීමේ ඉතුරු වැඩ | 66 |



දැදුරු ඔය පිටවාන



දැදුරු ඔය වම් ඉවුරු ඇල මාර්ගය

**පහල දැදුරු ඔය (සෙංගල් ඔය) ව්‍යාපෘතිය**

**තාක්‍ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : පුත්තලම දිස්ත්‍රික්කය |
| වගා කල හැකි භූමි ප්‍රමාණය | : පැරණි–අක්කර 1,500 |
| ප්‍රතිලාභ ලබන පවුල් ගණන | : පවුල් 1,000 |
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි. 3000 |

පහල දැදුරු ඔය (සෙංගල් ඔය) ව්‍යාපෘතිය දැදුරු ඔය ව්‍යාපෘතියේම කොටසකි. පවතින සෙංගල් ඔය අමුණ, ප්‍රධාන ඇල මාර්ගය සහ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. යකඩ ටැම් ඉදිකිරීම මඟින් අමුණෙහි ඉවුරු සංවර්ධනය කරගෙන යන අතර ඉදිරි වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 45%

**2018 වර්ෂය සඳහා**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි.240

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි.205.747

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| සෙංගල් ඔයෙහි පෝෂිත ඇලෙහි ඉතිරි ඉදිකිරීම් | 65 |
| මධ්‍යම ප්‍රමාණයේ වැව් සංවර්ධනය | 30 |
| අමුණ ඇතුළුව පවතින යටිතල පහසුකම් සංවර්ධනය | 46 |
| වම් ඉවුරෙහි යකඩ ටැම් ඉදිකිරීම | 45 |
| දකුණු ඉවුරෙහි යකඩ ටැම් ඉදිකිරීම | 50 |



අපවාහන පිවිසුම



යකඩ ටැම් ස්ථාපනය

## 3.2 මැණික් ගඟ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කය |
| වාරි පහසුකම් ලබන ඉඩම් ප්‍රමාණය | : පවතින - අක්කර 10,000 නව - අක්කර 100 |
| | **මුළු එකතුව** - අක්කර 10,100 |
| ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව | : පවුල් 6,000 |
| මුළු ව්‍යාපෘති පිරිවැය | : රු.මි.2,900 |

ලුනුගම්වෙහෙර ජලාශ යෝජනා ක්‍රමයේ ඇතිවන ජල හිඟතාවය වැලක්වීම සඳහා මැණික් ගඟ ජලාශය ඉදිකිරීමට යෝජනා විය. එමෙන්ම මැණික් ගඟ ව්‍යාපෘතියේ ප්‍රධානතම කොටසක් ලෙස වෙහෙරගල ජලාශය මැණික් ගඟ හරහා ඉදිකරනු ලබයි.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**ව්‍යාපෘතියේ මුළු ප්‍රගතිය**

| | |
|---|---|
| 2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු භෞතික ප්‍රගතිය | : 98.4 % |
| 2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු මූල්‍ය ප්‍රගතිය | : 94.76 % |
| 2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු වියදම | : රු.මි.2,747.98 |

**2018 වර්ෂය තුල,**

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අයවැය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය | : රු.මි. 130 |
| 2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය මූල්‍ය ප්‍රතිපාදනය | : රු.මි. 90 |
| 2018 වර්ෂයේ මුළු වියදම | : රු.මි. 61.51 |

**ප්‍රගතිය**

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය 2018 අවසානයේ දී පහත පරිදි වේ.

| 2018 වර්ෂය අවසානයේ භෞතික ප්‍රගතිය | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| **වාරිමාර්ග අධ්‍යක්ෂ (හම්බන්තොට)** | |
| වෙහෙරගල ජල හැරවුම් ඇල වැඩිදියුණු කිරීම | 100 |
| අට්ටික්කාව අමුණෙහි වම් හා දකුණු ඇල වල සංවර්ධන කටයුතු | 100 |
| ලුණුගම්වෙහෙර වම් හා දකුණු ඇල පද්ධතියේ සංවර්ධනය (නැවත ප්‍රතිපාදන යටතේ) | 99 |
| ලුණුගම්වෙහෙර වම් හා දකුණු ඇල පද්ධතියේ සංවර්ධනය | 99 |
| ඇල්ලගල ඇල පද්ධතියේ ප්‍රතිසංස්කරණ කටයුතු | 95 |
| කතරගම හන්ගුන් ආර පෝෂිත ඇලෙහි 3 වන කිලෝ මීටරය සංවර්ධනය කිරීම | 100 |
| කතරගම හන්ගුන් ආර පෝෂිත ඇලෙහි 4 වන කිලෝ මීටරය සංවර්ධනය කිරීම | 15 |
| මාලිංගම සිට දෙටගමුව දක්වා පෝෂිත ඇල සංවර්ධනය කිරීම | 5 |
| හන්ගුන්ආර අමුණ සංවර්ධනය කිරීම | - |
| වෙහෙරගම වැව සංවර්ධනය කිරීම | 70 |

## 3.3 රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : අම්පාර දිස්ත්‍රික්කය

ජලාශ ධාරිතාව : ඝන මීටර් මිලියන 48

වගා කල හැකි භූමි ප්‍රමාණය : පැරණි – අක්කර 3,500

ප්‍රතිලාභ ලබන පවුල් ගණන : පවුල් 1,000

මුළු ඇස්තමේන්තු මුදල : රු.මි. 3, 970

මුන්දෙනි ආරු ගංගාවෙහිඅතු ගංගාවක් වන රඹුක්කන් ඔය, අම්පාර දිස්ත්‍රික්කයේ මහ ඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දී හරස් කොට රඹුක්කන් ඔය ජලාශය ඉදිකෙරේ. මෙම ව්‍යාපෘතිය මඟින් කුඹුරු අක්කර 1178 සහවෙනත් වගා සඳහා ජලය සැපයේ. මීට අමතරව මහ ඔය ප්‍රදේශයේ සඳහා නල ජලය යෝජනා ක්‍රමයක් ඇති කරනු ලැබේ.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 99.2%

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි.3, 908.021

**2018 වර්ෂය සඳහා**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි.50

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි.35.09

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| කෙත් ඇල මාර්ග ඉදිකිරීම | 81 |
| රඹුක්කන් ඔය ඇළ මාර්ග පද්ධතිය හරහා ඇළ මාර්ග ඉදිකිරීම | 20 |



රඹුක්කන් ඔය වේල්ල



රඹුක්කන් ඔය පිටවාන

## 3.4 යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : අනුරාධපුර, ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක

ජලාශ ධාරිතාව : ඝන මීටර් මිලියන 169

වගා කල හැකි භූමි ප්‍රමාණය : පැරණි – අක්කර 19,525 නව – අක්කර1,605

එකතුව – අක්කර 21,130

ප්‍රතිලාභ ලබන පවුල් ගණන : පවුල් 7,000

මුළු ඇස්තමේන්තු මුදල : රු.මි. 36,855

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පගුරුගස් වැව ප්‍රදේශයේ දී යාන් ඔය අමුණට ඉහලින් යාන් ඔය හරස් කොට වේල්ලක් ඉදිකිරීම සහ ගඟ පහල ප්‍රදේශයේ ජනතාවට වගා කටයුතු සඳහා පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ. කි.මි.2.35 දිග පස් බැම්ම කි.මි.3.5. දිග අමතර බැම් සහ කි.මි. 34 දිග වම් ඉවුරු සහ දකුණු ඉවුරු ඇල මාර්ග ඉදිකිරීම ද මෙම ව්‍යාපෘතියෙන් සිදුකෙරේ. පාදෙනිය වැව, වාහල්කඩ වැව, නීල පනික්කම් කුලම් සහ යාන් ඔය අමුණු වල ජල හිඟතාවයට ව්‍යාපෘතිය මඟින් පිළියම් සැපයේ. මීට අමතරව අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වල ජනතාවට වගා තීව්‍රතාවය දෙගුණයකින් වැඩි කිරීමටසහ පානීය ජල පහසුකම සැපයේ.

**මූල්‍යමය තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 74%

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 23, 909.353

**2018 වර්ෂය සඳහා**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි. 3,000
2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන් කිරීම : රු.මි. 5,038
ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 3,098.302

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| වේල්ල ඉදිකිරීම | 100 |
| වම් ඉවුරු ඇල පද්ධතිය ඉදිකිරීම | 107 |
| දකුණු ඉවුරු ඇල පද්ධතිය ඉදිකිරීම | 112 |
| නැවත පදිංචි කිරීම සහ වන්දි ගෙවීම | 72 |
| පවතින යාන් ඔය අමුණ සංවර්ධනය | 84 |


යාන් ඔය පළමු පැති වේල්ල


යාන් ඔය පිටවාන



යාන් ඔය දෙවන පැති වේල්ල

## 3.5 ගල් ඔය නවෝදය ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කය
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 42,000
ප්‍රතිලාභ ලබන පවුල් : පවුල් 30,000
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 1,260

මෙය වසර 25කට පෙරාතුව USAID වැඩසටහන යටතේ පුනරුත්ථාපනය කරන ලද දැනට පවතින ගල්ඔය ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සඳහා පුනරුත්ථාපන ව්‍යාපෘතියකි.70,000කට වාරිමාර්ග පහසුකම් සපයයි.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**ව්‍යාපෘතියේ මුළු ප්‍රගතිය**

2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු භෞතික ප්‍රගතිය : 94.4 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු මූල්‍ය ප්‍රගතිය : 92.2 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු වියදම :රු.මි.1,161.65

**2018 වර්ෂය තුල**

2018 වර්ෂය සඳහා අයවැය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය :රු.මි.132
2018 වර්ෂයේ මුළු වියදම : රු.මි.97
2018 වර්ෂයේ මුළු වියදම : රු.මි. 53.18

**ප්‍රගතිය**

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය 2018 අවසානයේදී පහත පරිදිවේ

| භෞතික ප්‍රගතිය 2018 අවසානය දක්වා | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| අම්පාර පාදක වැඩ කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 90 |
| වැඩමුළුව අලුත්වැඩියා කිරීම,අම්පාර | 45 |
| වව්නියා ඒකක කාර්යාලයේ ආදර්ශ ගොවිපල අලුත්වැඩියා කිරීම | 100 |
| අක්කරපත්තුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම | 100 |





## 3.6 මොරාණ ජලාශ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : බදුල්ල දිස්ත්‍රික්කය
ජලාශ ධාරිතාව : ඝන මීටර් මිලියන 16
වගා කල හැකි භූමි ප්‍රමාණය : පැරණි – අක්කර 1,500 නව – අක්කර 500
එකතුව – අක්කර 2,000
ප්‍රතිලාභ ලබන පවුල් ගණන : පවුල් 1,000
මුළු ඇස්තමේන්තු මුදල : රු.මි.1,700 (සංශෝධනය කිරීමට නියමිත මුදල)

මොරාණ ප්‍රදේශයේ දී උල්හිටිය ඔය හරස් කොට මොරාණ ජලාශය ඉදිකෙරේ. මෙමඟින් රොටගොල්ල වැවට ජලය හරවා නාගදීප ව්‍යාපාරයෙහි ඇති ජල හිඟතාවයට පිළියම් සැපයේ. නාගදීප ජලාශය, රොටගොල්ල ජලාශයේ යටිගංමුවාවේ පිහිටා ඇත. රොටගොල්ල ජලාශය සහ නාගදීප ප්‍රධාන ඇල මඟින් අක්කර 1,500 වගා කිරීමට ජලය සැපයේ. පවතින නාගදීප වාරිමාර්ග ව්‍යාපාරයේ ජල කළමනාකරණ සහ අපවාහන පහසුකම් සංවර්ධනය කෙරේ. මීට අමතරව මොරාණ ජලාශයේ වම් ඉවුරු සහ දකුණු ඉවුරු ඇල මාර්ග මඟින් නව ඉඩම් අක්කර 500 වගා කිරීමට යෝජිතය.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 71%

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 2,068.032

**2018 වර්ෂය සඳහා**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි. 471.00

2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන් කිරීම : රු.මි. 571.00

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 441.206

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| වැඩ කොටස් | 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|---|
| | ක්‍රියාකාරකමේ නම | ප්‍රගතිය (%) |
| මූලස්ථායී වැඩ ඉදිකිරීම | පස් බැම්ම ඉදිකිරීම | 100 |
| | වම් ඉවුරු සොරොව් කුළුණ ඉදිකිරීම | 95 |
| | දකුණු ඉවුරු සොරොව්ව සමඟ අරිය දොරටු සහිත පිටවාන ඉදිකිරීම | 100 |
| ඇලමාර්ග පද්ධතිය | නිර්මිත ඇතුළුව වම් ඉවුරු ප්‍රධාන ඇල මාර්ගය ඉදිකිරීම | 100 |
| | කුඩා වැව් 02ක් සහ රොටගල වැව සංවර්ධනය | 0 |
| | බෙදාහැරීමේ ඇල මාර්ගය සහ ක්ෂේත්‍ර ඇල මාර්ගය ඇතුළුව වාරිමාර්ග ක්ෂේත්‍ර පහසුකම් ඉදිකිරීම | 85 |
| ඉඩම් සංවර්ධනය සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය | ඉඩම් අත්පත් කර ගැනීම සහ මැනීමේ කටයුතු සඳහා ගෙවීම | 73 |
| | නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල ප්‍රවේශ මාර්ග සහ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | 95 |
| පාරිසරික පහසුකම් | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ නැවත වන වගාව ස්ථාපනය කිරීම | 34 |



මොරාන සොරොව්ව



මොරාන වේල්ල ඉදිකිරීම



මොරාන පිටවාන

## 3.7 කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : අම්පාර දිස්ත්‍රික්කය

ජලාශ ධාරිතාව : ඝන මීටර් මිලියන 10

වගා කල හැකි භූමි ප්‍රමාණය : පැරණි – අක්කර 1,500

ප්‍රතිලාභ ලබන පවුල් ගණන : පවුල් 1,100

මුළු ඇස්තමේන්තු මුදල : රු.මි. 1,517 (සංශෝධිත විය යුතු අගය – රු.මි 2,350)

කළුගල් ඔය හරස් කර මී.300 දිග වේල්ලක් ඉදිකර කළුගල් ඔය ජලාශය ඉදිකෙරේ. මෙමඟින් උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවකිරි ජලාශයේ ඉහත්තෑවේ බදරදූව ප්‍රදේශයේ කුඹුරු අක්කර 1,500 වගා කිරීමට ප්‍රධාන ඇල මාර්ගය මඟින් පහසුකම් සැලසේ. මෙමඟින් ප්‍රදේශයේ වී වගාව සහ අනෙකුත් බෝග වගාව වැඩි දියුණු වන අතර ප්‍රදේශයේ ජනතාවගේ ජීවන මට්ටම ඉහල නැංවීමට දායක වේ.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 80%

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි.1, 527.094

**2018 වර්ෂය සඳහා**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි.513

2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන් කිරීම : රු.මි. 813

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිත වියදම : රු.මි.452.733

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| වේල්ල ඉදිකරීම | 71 |
| පිටවාන ඉදිකිරීම | 32 |
| සොරොච්ච ඉදිකිරීම | 51 |
| ඇල මාර්ග පද්ධතිය ඉදිකිරීම | 83 |
| පාරිසරික හානිය අවම කිරීම | 14 |
| ඉඩම් කැබලි කිරීම සහ ඉඩම් මට්ටම් කිරීම | 26 |



කළුගල් ඔය වේල්ල



කළුගල් ඔය සොරොච්ච

## 3.8 කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : මොණරාගල දිස්ත්‍රික්කය |
| ඛංඩාංක | : නැගෙනහිර - 256,390 මීටර් උතුර - 192,870 මීටර් |
| ජලාශ ධාරිතාව | : ඝන මීටර් මිලියන 48 |
| වගා කල හැකි භූමි ප්‍රමාණය | : පැරණි – අක්කර 10,000 |
| ප්‍රතිලාභ ලබන පවුල් ගණන | : පවුල් 5,000 |
| ජල විදුලි බලය | : 16.1ගිගා වොට් |
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි.32,397.3 |

නව බහුකාර්යය ජලාශයක් ඉදිකිරීමට කුඹුක්කන් ඔය යෝජිත සංවර්ධන වැඩසටහනට ඇතුලත්ය.මෙමගින් ප්‍රදේශයේ ගංවතුර අඩුකර වගා කිරීමට හැකි ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම, දෛනික හා කර්මාන්ත සඳහා ප්‍රදේශයේ ජනතාවට ජලය සැපයීම සිදු කෙරේ. මීට අමතරව භූගත ජල මට්ටම ඉහල නැංවීම ද මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තුවේ.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**මුළු ව්‍යාපෘතිය සඳහා**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 0.7%

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 151.861

**2018 වර්ෂය සඳහා**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි.90

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි.62.499

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| **2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය** | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| කුඩා වැව් සංවර්ධනය | 18 |
| කුඹුක්කන් ඔය අමුණු ව්‍යාපෘතියේ අමුණ, ඇල පද්ධතිය, දොරටු, පාලම් සංවර්ධනය | 0 |
| නුගමන්දෙනිය අමුණ ඉදිකිරීම | 0 |
| නැවත පදිංචිකරුවන් සඳහා නිවාස ඉදිකිරීම | 0 |
| නැවත පදිංචි කරන ප්‍රදේශයේ යටිතල පහසුකම් ඉදිකිරීම | 0 |
| ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම | 0 |
| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු පරිශ්‍රයේ සංචාරක බංගලාවක් සහ ශ්‍රවණාගාරයක් ඉදිකිරීම | 8 |
| නුගමන්දෙනිය අමුණ සඳහා මැනීම් කිරීම | 100 |
| කුඹුක්කන් ජලාශයේ වාන් මට්ටම ගල් තබා සලකුණු කිරීම | 100 |
| වාන් මට්ටම සලකුණු කිරීමට මායිම් ගල් 2,000ක් නිෂ්පාදනය | 100 |

## 3.9 රුගම් - කිතුල් (මුන්දෙනි ආරු) ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : මඩකලපුව, අම්පාර දිස්ත්‍රික්කය |
| ජලාශ ධාරිතාව | : රුගම්-කිතුල් - ඝන මීටර් මිලියන 55.9<br>මහ ඔය – ඝන මීටර් මිලියන 80 |
| වගා කල හැකි භූමි ප්‍රමාණය | : පැරණි – අක්කර 9,756 නව – අක්කර 6,756<br>**එකතුව** – අක්කර 16,672 |
| බීමට ගතහැකි ජල ප්‍රමාණය | : රුගම්-කිතුල් -ඝන මීටර් මිලියන 12<br>මහ ඔය – ඝන මීටර් මිලියන 2 |
| ප්‍රතිලාභ ලබන පවුල් ගණන | : පවුල් 12,000 |
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි.4,500 |
| සංශෝධනය කිරීමට නියමිත අගය | : රු.මි. 20,000 |

නව බහුකාර්ය ජලාශයක් වන රුගම්-කිතුල් සහ මහ ඔය ජලාශ ඉදිකිරීම මෙම යෝජිත සංවර්ධන ක්‍රියාවලියට ඇතුලත් ය. මෙමඟින් අම්පාර හා මඩකලපු දිස්ත්‍රික්ක වල ජනතාවගේ වගා තීව්‍රතාවය දෙගුණයක් දක්වා වැඩි කරන අතර ගෘහස්ත සහ කර්මාන්ත සඳහා ජලය සැපයීම සිදුකෙරේ. මීට අමතරව ප්‍රදේශයේ ගංවතුර පාලනය සහ භූගත ජල මට්ටම ඉහල නැංවීමට දායක වේ.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා**

| | |
|---|---|
| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | : 0.6% |
| ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර්අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි.61.675 |

**2018 වර්ෂය සඳහා**

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම | : රු.මි.60 |
| 2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන් කිරීම | : රු.මි. 65 |
| ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි.23.622 |

**ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| වෙන්කලඩි වල ව්‍යාපෘති අධ්‍යක්‍ෂක කාර්යාලය ඉදිකිරීම | 100 |
| මුන්දෙනි ආරු ජලාශ ව්‍යාපෘතිය පටන් ගැනීම සඳහා වියදම් | 100 |
| මහ ඔය ජලාශයේ ගංවතුර මට්ටම ලකුණු කිරීම | 60 |

## 3.10 පොළොන්නරු දිස්ත්‍රික් වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

මෙහි අරමුණ වන්නේ, නිවැරදි ජල කළමනාකරණය හා ගං වතුර හානි අලුවැඩියා මඟින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගංවතුර හානි අවම කර ගොවි ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම.

මෙම ව්‍යාෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ, ගසේරුගොල්ල වැව ඉදිකිරීම, පේකුලම වැව ඉදිකිරීම, හීරටිඔය හා රතුපාලම ඇළ වැඩි දියුණු කිරීම, කවුඩුල්ල වැවේන් ලැබෙන අතිරේක වාන් ජලය පේරමඩුව ප්‍රදේශයට ලබාදීම හා කවුඩුල්ල වාන් ඇළ වැඩි දියුණු කිරීමද සිදුවේ. මෙම ව්‍යාපෘතියට රු.මි. 7158.00ක ප්‍රතිපාදන ලබා දී ඇත. ව්‍යාපෘතියේ කාල සීමාව අවුරුදු 6කි.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතිය වියදම : රු.මි. 594.668
2018 වර්ෂය සඳහා ප්‍රතිපාදනය : රු.මි. 400.00
2018 දෙසැම්බර් මස මස අවසන් වන විට වියදම : රු.මි. 386.753

**භෞතික ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 10%

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| වර්ෂයේ දෙසැම්බර් 2018 අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| පරාක්‍රම සමුද්‍ර යෝජනා ක්‍රමයේ ඇළ පද්ධතියේ පුනරුත්ථාපන කටයුතු | 100 |
| මින්නේරිය සහ ගිරිතලේ යෝජනා ක්‍රමවල ඇළ පද්ධති පුනරුත්ථාපන කටයුතු | 100 |
| මින්නේරිය හා ගිරිතලේ ගංවතුර අලාභහානි පිළිසකර කිරීම සහ ගංවතුර වේලි වැඩි දියුණු කිරීම | 100 |
| කවුඩුල්ල පිටවාන ඇළෙහි වැඩි දියුණු කිරීම් | 100 |
| කවුඩුල්ල යෝජනා ක්‍රමයේ පුනරුත්ථාපන කටයුතු | 100 |
| ඇළ පද්ධතියේ "G" කලාපයේ පුනරුත්ථාපන කටයුතු | 100 |

## 3.11 තෝරාගත් විශාල වාරිමාර්ග ව්‍යාපාරයන්හි අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු

**හැඳින්වීම**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ තෝරාගත් විශාල වාරිමාර්ග ව්‍යාපාරයන්හි ඇළ පද්ධති වල අත්‍යවශ්‍යය උපාංගයන් පුනරුත්ථාපනය කරමින් කෘෂිකාර්මික ඵලදායීතාව ස්ථාවර කිරීම හා ඉහළ නැංවීම වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම 109ක් මඟින් අක්කර 586,323 සහ මධ්‍යම පරිමාණ යෝජනා ක්‍රම 254ක් මඟින් අක්කර 9,6333කට වඩා ජල පහසුකම් සපයනු ලබයි. විවිධ හේතු මත මෙම යෝජනා ක්‍රම බොහෝමයක් පුනරුත්ථාපනය කළ යුතු තත්වයක පවතී. තෝරාගත් අත්‍යවශ්‍ය මහා වාරි ව්‍යාපාර ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රමය යටතේ 2009දී වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් අත්‍යවශ්‍ය පුනරුත්ථාපනය කළයුතු යෝජනා ක්‍රම හඳුනා ගන්නා ලදී.

**ප්‍රගතිය**

2009 වසරේ සිට 2017 අගවන විට 150 කට වඩා වාරිමාර්ග යෝජනා ක්‍රම වල පුනරුත්ථාපන කටයුතු සිදුකර ඇත. එක් එක් වර්ෂ වල මූල්‍ය ප්‍රගතිය පහත වගු වල දක්වා ඇත.

| මූල්‍ය ප්‍රගතියේ සාරාංශය | |
|---|---|
| **වර්ෂය** | **වියදම / රු.මිලියන** |
| 2009 | 11.3 |
| 2010 | 102.04 |
| 2011 | 172.73 |
| 2012 | 1217.58 |
| 2013 | 657.42 |
| 2014 | 611.563 |
| 2015 | 596.607 |
| 2016 | 594.12 |
| 2017 | 610.015 |
| 2018 (දෙසැම්බර් දක්වා) | 412.711 |

මෙම වසරේදී අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු වාරිමාර්ග යෝජනා ක්‍රම 140ක් සිදුකිරීමට සැලසුම් කර ඇති අතර පහත දැක්වෙන ප්‍රගතීන් ලබා ගැනීමට සමත්ව ඇත.

| අයිතමය | භෞතික ප්‍රගතිය |
|---|---|
| 221 | 100% (නිමකර ඇත) |
| 30 | 100-50% |
| 8 | 50-25% |
| 18 | <25% |

පුනරුත්ථාපන කටයුතු සඳහා වූ වියදම හැරුණු විට නියඟයෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවන තත්වය නඟාසිටුවීමේ කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු .මි. 1,115ක් 2012/2013 වර්ෂයේදී වැය කිරීමට සිදුවන ලදී. එම නිසා ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් මස අග වනවිට සම්පූර්ණ වියදම් රු.මි. 4,986.082 ක් විය.

## 3.12 වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : ත්‍රිකුණාමලය, පොළොන්නරුව දිස්ත්‍රික්ක |
| වගා කල හැකි භූමි ප්‍රමාණය | : පැරණි – අක්කර 19,000 |
| ප්‍රතිලාභ ලබන පවුල් ගණන | : පවුල් 25,000 |
| බීමට ගතහැකි ජල ප්‍රමාණය | : ඝන මීටර් මිලියන 12 |
| ජල විදුලි බලය | : 16 ගිගා වොට් |
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි.2, 500 |

ඌව පලාතේ වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය මඟින් කෘෂිකර්මාන්ත සහ ගෘහස්ත ජල අවශ්‍යතා සඳහා ජලය සැපයීම වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. මීට අමතරව වෙනත් බෝග වගා වල වගා තීව්‍රතාවය 1 සිට 5 දක්වා වැඩි කරන අතර මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සහ ජල විදුලිය නිපදවීම සිදු කෙරේ.

**මූල්‍යමය තොරතුරු**

| | |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි. 226.173 |
| 2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම | : රු.මි.352.7 |
| ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම | : රු.මි.193.97 |

**භෞතික ප්‍රගතිය**

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය : 25.5 %

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වර්ෂය තුළ කාර්යය සාධනය පහතින් දක්වා ඇත.

| 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා භෞතිකමය ප්‍රගතිය | |
|---|---|
| **ක්‍රියාකාරකමේ නම** | **ප්‍රගතිය (%)** |
| වාරිමාර්ග කටයුතු පුනරුත්ථාපනය | 94 |
| නව කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග කටයුතු ඉදිකිරීම | 58 |
| යටිතල පහසුකම් සංවර්ධනය (දුෂ්කර සහ නාගරික) | 85 |
| දියුණු සහ නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම සඳහා නියාමක අධ්‍යනය ආදර්ශනය කිරීම | 30 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් (ඉංජිනේරු සහ පරිපාලන) | 100 |
| ජල සම්පත් සහ සංවර්ධන කටයුතු පිළිබඳ ශක්‍යතා අධ්‍යනය | 100 |
| අවිනිශ්චිත වියදම් | 62 |

## 3.13 කැළණි ගඟ ගංවතුර ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ස්ථානය : කොළඹ දිස්ත්‍රික්කය

ප්‍රතිලාභය : පවුල් 15,000 හා කර්මාන්ත ශාලා විශාල ප්‍රමාණයක් ගංවතුරින් ආරක්ෂා වීම

ඇස්තමේන්තුගත මුදල : රු. මිලියන 1,000.0

කැළණි ගඟේ ගංවතුර ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ගංවතුර ආරක්ෂණ බැම් ඉදිකර බොහෝ කල් ගතවී ඇති බැවින් දුර්වල තත්වයේ පවතින අතර කැළණිය සහ අවට නාගරික ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා ඉතා ඉක්මණින් ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වේ.

**මූල්‍යමය තොරතුරු**

2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම : රු.මි. 100.00

2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන් කිරීම : රු.මි. 42.00

ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 30.034

මෙම වර්ෂය තුල කාර්ය සාධනය පහත දැක්වේ.

| වැඩ කොටස | භෞතික ප්‍රගතිය(%) |
|---|---|
| කැළණි ගඟ උතුරු වේල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 1. කැළණි ගඟ උතුරු වේල්ල කෝන්ගහ මුල දිග මීටර 187 ක ප්‍රමාණයක් වැඩිදියුණු කිරීම සම්පූර්ණ කිරීම.<br>2. කැළණි ගඟ පෙතියාගොඩ ආසන්නයේ දිගින් මීටර 39 ක ශීට් ෂයිල් ගැසීම.90%<br>3. 7 වන සැතපුම අසල රතු පල්ලිය ආසන්නයේ දිග මීටර 450 ක ශීට් ෂයිල් ගැසීම. 80%<br>4. රන්වල මුත්තෙට්ටුපොල සුලු ගංවතුර පාලන නිර්මිතයේ වැඩිදියුණු කිරීම. සම්පූර්ණ කිරීම.<br>5. මල්වාන පහුරු ඔය ඉවුරේ මීටර 55ක ගැබියන් බැමමක් ඉදිකිරීම. 80% |
| ගංගා ඉවුරු සංරක්ෂණය කිරීම | 12% |

## 3.14 මඩුල්ල බිංගොඩ කොලැල්ලැවත්ත ජලාශය ප්‍රතිස්ථාපනය කිරීම

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : මොණරාගල දිස්ත්‍රික්කය
ජලාශ ධාරිතාව : 3.3 MCM
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 500
ප්‍රතිලාභ ලබන පවුල් : පවුල් 700
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 305

මොණරාගල දිස්ත්‍රික්කයේ උනිච්චයිආරු හරස් පාර මීටර් 350ක පස් බැම්මක් ඉදිකිරීම මගින් පවතින මඩුල්ල බිංගොඩ කොලැල්ලැවත්ත ජලාශය ප්‍රතිස්ථාපනය කිරීමට යෝජනා වීඇත. මෙම ව්‍යාපෘතියේ මූලික ප්‍රතිලාභය ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවීන් හට ජලය සැපයීම සිදුවේ.

**මූල්‍ය තොරතුරු**

අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂය සඳහා : රු.මි. 120

**භෞතික ප්‍රගතිය**

පාරිසරික අධ්‍යයන වාර්ථාව ලබා ගැනීමේ ප්‍රමාදය නිසා මෙම ව්‍යාපෘතිය 2018 වසර තුල ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

## 3.15 ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : නුවර දිස්ත්‍රික්කය
ජලාශ ධාරිතාව : 0.25 MCM
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 200
ප්‍රතිලාභ ලබන පවුල් : පවුල් 150
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 165.9

ගොඩිගමුව යනු අක්කර 35ක වාරි වපසරියක් ඇති පවතින ව්‍යාපෘතියක් වන අතර බැම්මේ දුර්වලතාවය නිසා ක්‍රියාත්මක නොවේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ පෝෂිත ඇල මාර්ගයකින් ජල සම්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම මගින් වගා වපසරිය අක්කර 165 දක්වා වැඩි කිරීමයි. එම ව්‍යාපෘතිය අක්කර 100ක බිලූණු හා අක්කර 65ක වී වගාව මගින් ඵලදායීතාවය ඉහල නැංවීමයි.

**මූල්‍ය තොරතුරු**

අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂය සඳහා : රු.මි.25

**භෞතික ප්‍රගතිය**

පාරිසරික අධ්‍යයන වාර්ථාව ලබා ගැනීමේ ප්‍රමාදය නිසා මෙම ව්‍යාපෘතියෙහි 2018 වසරට අපේක්ෂිත ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නොහැකි විය.

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය 2018 දෙසැම්බර් අවසානය වන විට පහත පරිදි වේ.

| භෞතික ප්‍රගතිය 2018 අවසානය දක්වා | |
|---|---|
| විස්තරය | ප්‍රගතිය (%) |
| පිවිසුම් මාර්ග ඉදිකිරීම | 100 |

## 3.16 කැළණි, මුන්දෙණි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගං වතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය

ස්ථානය : කොළඹ, මඩකලපුව, ගාල්ල, කළුතර, රත්නපුර, මාතර දිස්ත්‍රික්ක
ප්‍රතිලාභය : ගංගා ද්‍රෝණි වලට අයත් ජනතාව
ඇස්තමේන්තුගත මුදල : රු. මිලියන 1000.00

කැළණි, මුන්දෙණි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ශක්‍යතා අධ්‍යයන සිදුකර දිගුකාලීන ගංවතුර ආරක්ෂණ ක්‍රමෝපායන් සැලසුම් කරමින් පවතින අතර එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීමත් දැනට පවතින ගංවතුර හානි වළක්වා ගැනීමට අවශ්‍ය කෙටි කාලීන ක්‍රියාමාර්ග ගැනීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

**මූල්‍ය තොරතුරු**

අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂය සඳහා : රු.මි. 500.00
2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය වෙන් කිරීම : රු.මි. 80.00
ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා සමුච්චිතීය වියදම : රු.මි. 59.190

මෙම වර්ෂය තුල කාර්ය සාධනය පහත දැක්වේ.

| වැඩ කොටස | 2018 දෙසැම්බර් මස අවසානයේ භෞතික ප්‍රගතිය |
|---|---|
| ගංවතුර ආරක්ෂණය සඳහා කළු ගඟේ පහළ නිම්න පූර්ණ ශක්‍යතා අධ්‍යයනය හා ලවණ බාධක | ප්‍රසම්පාදන කටයුතු |
| ගිං ගඟේ, නිල්වලා ගඟේ හා කැළණි ගඟේ ගංවතුර අවම කිරීමේ වැඩ | 70% |
| පෙතියාගොඩ පොම්පාගාරය ඉදිකිරීම | ඇස්තමේන්තු අනුමත වී ඇත. |





## 3.17 කවුඩුල්ල දීර්ඝ කිරීම අදියර II - වම් ඉවුර ඇලෙහි දම්සෝපුර දක්වා කොටස

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : පොළොන්නරුව දිස්ත්‍රික්කය
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 580
ප්‍රතිලාභ ලබන පවුල් : පවුල් 300
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 150

කවුඩුල්ල යෝජනා ක්‍රමය යටතේ වම් ඉවුරු ඇල මාර්ගය දිර්ග කිරීම මෙම යෝජිත ව්‍යාපෘතියයි, දම්සෝපුර වැව, බබියවැව වැඩිදියුණු කිරීම මේ සමගම ඇලමාර්ග පද්ධතිය හා අදාල නිර්මිත ඉදිකිරීම හා සංවර්ධනය ඇතුලත්ය.

මෙමගින් අපේක්ෂිත කුඹුරු ඉඩම් ප්‍රමාණය 1,850ක් වන අතර කර නව ඉඩම් අක්කර 870ක් ඇතුලුව වාරිමාර්ග පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ. මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය නිම කිරීමත් සමඟම ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් ලබාගත හැකිය. එබැවින් ඉහත සඳහන් කරුණු සහ හදිසි අත්‍යවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මෙම යෝජනා ව්‍යාපෘති අදියර 02කින් සිදුකරනු ලැබේ.

**මූල්‍ය තොරතුරු**

අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂය සඳහා : රු.මි.60
ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා වියදම : රු.මි. 46.22
මුළු ව්‍යාපෘති වියදම් 2018 දෙසැම්බර් අවසානය දක්වා : රු.මි. 111.865

**භෞතික ප්‍රගතිය**

මෙම වර්ෂය තුල කාර්ය සාධනය පහත දැක්වේ.

| භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් දක්වා | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| පස් වැඩ | 95 |
| නිර්මිත ඉදිකිරීම | 90 |





## 3.18 මහගල්ගමුව වැව ප්‍රගුණවත් කිරීම

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : කුරුණෑගල දිස්ත්‍රික්කය
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 500
ප්‍රතිලාභ ලබන පවුල් : පවුල් 250
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 500

මහගල්ගමුව වැව වැඩි දියුණු කිරිමෙ ව්‍යාපෘතිය මගින් යල කන්නයේ සහ මහ කන්නයේ එක සමානව අක්කර 400ක කලාපයකට වාරි ජලය සැපයේ. මෙයට අමතරව එපිටින් පවතින පලුකඩවල යෝජනා ක්‍රමය මගින් හෙක්ටයාර් 800ක භූමි ප්‍රදේශයකට ජල සම්පාදන පහසුකම් සැපයේ. මෙම වැඩිදියුණු කිරීම නිසා පලුකඩවල ව්‍යාපෘතියට යාබදව පිහිටා ඇති නව ඉඩම් අක්කර 200කටද මෙමඟින් ජලය සැපයේ. සියඹලන්ගමුව ඔය හරහා හැරවුම් නිර්මිතයක් ඉදිකිරීම හා මහගල්ගමුව වැව දක්වා 15km දිග ඇල මාර්ගයක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත්වෙයි.

**මූල්‍ය තොරතුරු**

අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂය සඳහා : රු.මි. 70
2018 වර්ෂය තුල ව්‍යාපෘති වියදම : රු.මි. 60.145
මුළු ව්‍යාපෘති වියදම් 2018 දෙසැම්බර් අවසානය දක්වා : රු.මි. 291.124

**භෞතික ප්‍රගතිය**

මෙම වර්ෂය තුල කාර්ය සාධනය පහත දැක්වේ.

| භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් දක්වා | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| ඇලෙහි ඉදිකිරීම් | 80 |
| ව්‍යුහයන්හි ඉදිකිරීම් | 93 |

## 3.19 ගිං ගඟ පුනරුත්ථාපන ව්‍යාපෘතිය

ස්ථානය : ගාල්ල දිස්ත්‍රික්කය (අගලිය, කිරිබතාවිල, දිවිතුර, අකුරටිය, හල්පාතොට, ඉදිගස්කැටිය, ගනේගම හා හැගොඩ)
ප්‍රතිලාභය : පවුල් 10,000 (හෙක්ටයාර් 5000)
ඇස්තමේන්තුගත මුදල : රු. මිලියන 700.0

ගිං ගඟේහි මධ්‍ය හා අග කොටස තුල පිහිටුවා ඇති ගිංගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය කුඹුරු හෙක්ටයාර් 5,000 ක් ගංවතුරෙන් ආරක්ෂා කිරීමට පහසුකම් සපයන, වාර්ෂිකව සිදුවිය හැකි විශාල ගංවතුර හානියක් වලක්වන ප්‍රධාන ගංවතුර ආරක්ෂණ පද්ධතියක් වේ. පොම්පාගාර 10 කින් සමන්විත මෙම ගංවතුර ආරක්ෂණ පද්ධතියේ කොටස් (විශේෂයෙන්ම පොම්ප ද ඇතුලු යාන්ත්‍රික කොටස්) කල් ඉකුත්වීම නිසා අබලන් තත්වයටත් පත් වී ඇත. ගිංගඟ ගංවතුර පාලන පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අබලන් තත්වයේ පවතින මෙම ගංවතුර ආරක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමයි.

**මූල්‍ය තොරතුරු**

අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂය සඳහා : රු.මි. 400.00
2018 වර්ෂය තුල ව්‍යාපෘති වියදම : රු.මි. 287.084
මුළු ව්‍යාපෘති වියදම් 2018 දෙසැම්බර් අවසානය දක්වා : රු.මි. 411.501

මෙම වර්ෂය තුල කාර්ය සාධනය පහත දැක්වේ

| වැඩ කොටස | 2018 දෙසැම්බර් මස අවසානයේ භෞතික ප්‍රගතිය |
|---|---|
| පොම්ප මිල දී ගැනීම<br>පොම්ප සවිකිරීම | 100%<br>40% |
| පොම්පාගාර හා පරිපාලන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 60% |
| ඇතුලු ගේට්ටු, පිට ගේට්ටු, ගුරුත්ව ගේට්ටු හා ඔසවන පද්ධති | 40% |





# 4.0 අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ කරනු ලබන ව්‍යාපෘති

## 4.1 මහගෝන ජලාශය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : මාතලේ දිස්ත්‍රික්කය
ජලාශ ධාරිතාව : කියුබික් මීටර් මිලියන 0.78
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 450 නව - අක්කර 250
ප්‍රතිලාභ ලබන පවුල් : පවුල් 400
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 250

මහගෝන වැව යනු දඹුල්ල ප්‍රදේශයේ පවතින අබලන් වූ / පරිහානියට පත් වූ වැවකි. මෙම වැවෙහි බැම්ම මහගෝණා ඔයෙහි අතු ගංගාවක් වන කැකුළාගොඩ ඔය හරහා ඉදිකර ඇත. මෙම වැව අතීතයේ මහසෙන් රජුගේ අගභාගයේ ඉදිවූවකි.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**ව්‍යාපෘතියේ මුළු ප්‍රගතිය**
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු භෞතික ප්‍රගතිය : 72.1 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු මූල්‍ය ප්‍රගතිය : 62.4 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු වියදම : රු.මි. 156.1

**2018 වර්ෂය තුළ,**
2018 වර්ෂය සඳහා අයවැය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය : රු.මි. 50
2018 වර්ෂයේ මුළු වියදම : රු.මි. 24.709

**භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය 2018 අවසානයේදී පහත පරිදි වේ.

| භෞතික ප්‍රගතිය 2018 අවසානය දක්වා | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| ඇල පද්ධතියේ ඉදිකිරීම | - |
| පිටවාන් ඇලෙහි ඉදිකිරීම | 85 |
| වාන් ඇල ඉදිකිරීම | 80 |





## 4.2 ගෝනගලතැන්න වැව

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : නුවර දිස්ත්‍රික්කය
ජලාශ ධාරිතාව : ඝණ මීටර් මිලියන 0.16
වාරිමාර්ග ප්‍රදේශය : පවතින - අක්කර 146
ප්‍රතිලාභ ලබන පවුල් : ගොවි පවුල් 435
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 120

ගෝනගලතැන්න වැව යනු නුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රදේශයේ පවතින නව වැවකි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ජලය ගබඩා කිරීම සහ වෙන්දරුව හා පිටිගල අමුණු ඔස්සේ ජලය බැහැර කිරීම / මුදා හැරීමයි. ජලය හිඟ කාලයන්හි දී මෙයට අමතරව මෙම ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉහල නැංවීම සිදුවෙයි.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**ව්‍යාපෘතියේ මුළු ප්‍රගතිය**
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු භෞතික ප්‍රගතිය : 98.5 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු මූල්‍ය ප්‍රගතිය : 88 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු වියදම : රු.මි. 105.02

**2018 වර්ෂය තුල,**
2018 වර්ෂය සඳහා අයවැය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය : රු.මි. 28.39
2018 වර්ෂයේ මුළු වියදම : රු.මි. 23.06

**ප්‍රගතිය**

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය 2018 අවසානයේදී පහත පරිදිවේ.

| භෞතික ප්‍රගතිය 2018 අවසානය දක්වා | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| පස් වේල්ලේ ඉදිකිරීම | 100 |
| වම් ඉවුරු සොරොව්ව ඉදිකිරීම | 95 |
| දකුණු ඉවුරු සොරොව්ව ඉදිකිරීම | 90 |
| රලපනාව ස්ථාපනය කිරීම | 85 |
| පිඩලි ඇල්ලීම | 90 |




## 4.3 ගුරුගල්ඔය ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

පිහිටීම : නුවර දිස්ත්‍රික්කය
ජලාශ ධාරිතාව : 157 MCM
මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 780

මෙය මඟින් මුරපොල ඇල වාරිමාර්ග යෝජනාක්‍රමය සඳහා වර්ෂය අවසානයේ අඩුවන ජලය සැපයීම සිදුකරයි. ඊට අමතරව නුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක සම්බන්ධ කරමින් වේල්ල හරහා නව මාර්ගයක් ඉදිකිරීම සිදුවිය. තව ද වේල්ලට දෙල්තොට සිට වාඩියගොඩ දක්වා වන මාර්ග ගබඩාගම නම් ප්‍රදේශයේ දී සම්බන්ධ කරයි. මේ හේතුවෙන් එම ප්‍රදේශවාසීන්ට හා ගොවීන්ට මෙන්ම පාසල් ළමුන්ට ගමනාගමනයට තිබූ බාධාවන් ඉවත් කිරීම ද සිදුවිය.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**ව්‍යාපෘතියේ මුළු ප්‍රගතිය**
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු භෞතික ප්‍රගතිය :100 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු මූල්‍ය ප්‍රගතිය : 97.2 %
2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු වියදම : රු.මි. 758

**2018 වර්ෂය තුල,**
2018 වර්ෂය සඳහා අයවැය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය : රු.මි. 0.507
2018 වර්ෂයේ මුළු වියදම : රු.මි. 0.507

**ප්‍රගතිය**

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය 2018 අවසානයේදී පහත පරිදිවේ.

| භෞතික ප්‍රගතිය 2018 අවසානය දක්වා | |
|---|---|
| **විස්තරය** | **ප්‍රගතිය (%)** |
| ආරම්භක උළෙල | 100 |




ගුරුගල් ඔය ව්‍යාපෘතියේ මංගල දියවර නිකුත් කිරීම

## 4.4 මුතුකෙලියාව පෝෂිත ඇල අදියර II

මුතුකෙලියාව ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ 2004 වර්ෂයේදිය. මෙම ව්‍යාපෘතිය මගින් මැණික් ගඟ සිට කෝන්ගහ වැව දක්වා වන පෝෂිත ඇල මාර්ගය දීර්ඝ කිරීම සිදුකරනු ලබයි. තව ද මෙමගින් බුත්තල ප්‍රදේශයේ කුඩා වැව් 06ක් පෝෂණය කිරීම සිදුකරයි.

1. අමුණේ සිට කෝන්ගහ වැව දක්වා ඉදිකර තිබූ පෝෂිත ඇලෙහි සංවර්ධන කටයුතු ප්‍රගතිය - 100%
2. සේරුගස් වැව සිට කුණු ඇල දක්වා (කි.මී.3.5)ක් දිගින් යුතු පෝෂිත ඇල මාර්ගයේ ඉදිකිරීම් කටයුතු - 90%
3. කුණු ඇලෙහි සංවර්ධන කටයුතු (2.5 කි.මී) - 10%
4. කරවිලකනත්ත වැව සිට තම්මන්නාර වැව දක්වා (කි.මී.4)ක් දිගින් යුතු පෝෂිත ඇල මාර්ගයේ ඉදිකිරීම් කටයුතු - 100%
5. කෝන්ගහ වැව සිට සේරුගස් වැව දක්වා (කි.මී.2.2)ක් දිගින් යුතු පෝෂිත ඇල මාර්ගයේ ඉදිකිරීම් කටයුතු - 70%
6. සේරුගස් වැව ප්‍රතිසංස්කරණ කටයුතු - 0%

2016 දී සේරුගස් වැව පුනරුත්ථාපනය කිරීම දීර්ඝ කාලයක් තිස්සේ ඉඩම් නිෂ්කාශනය කිරීම මගින් අවසන් කරන ලදී.

| | |
|---|---|
| 2016දී නිකුත් කරන ලද අය වැය ප්‍රතිපාදන ප්‍රමාණය | - රු. 20,000,000.00 |
| 2016දී සිදු වූ වියදම | - රු. 19,363,000.00 |

| | |
|---|---|
| මුළු ඇස්තමේන්තු මුදල | : රු.මි. 122 |
| 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදන | : රු.මි. 30 |
| 2017 වර්ෂයේ වියදම | : රු.මි. 25.07 |
| 2017 වර්ෂයේ භෞතික ප්‍රගතිය | : 84% |
| 2018 වර්ෂය අවසානය දක්වා මුළු වියදම | : රු.මි. 90.89 |
| 2018 වර්ෂය අවසානය දක්වා මුළු මූල්‍ය ප්‍රගතිය | : 71% |

## 4.5 යක්අමුණ ව්‍යාපෘතිය

**තාක්ෂණික තොරතුරු**

| | |
|---|---|
| පිහිටීම | : පුත්තලම දිස්ත්‍රික්කය |
| මුළු ව්‍යාපෘති පිරිවැය | : රු.මි. 200 |

මෙම ව්‍යාපෘතිය පුත්තලම දිස්ත්‍රික්කයේ දුම්මලසූරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් ගිං ඔය දිගේ රට ඇතුලට ගලා එනු ලබන කරදිය වැලැක්වීම සිදුකරයි. එසේම ඉහල පිහිටි කුඹුරු සඳහා ජලය ලබාදීමද මූලික අරමුණකි.

**මූල්‍ය හා භෞතික තොරතුරු**

**ව්‍යාපෘතියේ මුළු ප්‍රගතිය**

| | |
|---|---|
| 2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු භෞතික ප්‍රගතිය | : 88.44 % |
| 2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු මූල්‍ය ප්‍රගතිය | : 84.7 % |
| 2018 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ මුළු වියදම | : රු.මි. 169.399 |

**2018 වර්ෂය තුල,**

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අයවැය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය | : රු.මි.35 |
| සංශෝධිත අය වැය ප්‍රතිපාදන ප්‍රමාණය | : රු.මි. 11.5 |
| 2018 වර්ෂයේ මුළු වියදම | : රු.මි. 10.629 |

## 5.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් මහා පරිමාණ ව්‍යාපෘති

### 5.1 උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත පිරිවැය : රු.මි. 9352

වාරි වපසරිය : අක්කර 3200

නව වාරි බිම් : අක්කර 11,000

ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත කාලය : 2020 වසර අග

**ව්‍යාපෘතියෙහි වර්තමාන ප්‍රගතිය පහත පරිදිවේ**

2018 වාර්ෂික ප්‍රතිපාදන - රු.මි. 2,300.00

මේ දක්වා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර ඇති ප්‍රතිපාදන - රු.මි. 2,300.00

2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වියදම - රු.මි. 1,153.65

2018 අවසානයට සමුච්චිත වියදම - රු.මි. 5,409.89

2018 අවසානයට සමුච්චිත භෞතික ප්‍රගතිය - 72.00%

2018 අවසානයට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය - 57.80%

වත්කම් - රු.මි. 711.03

මෙම ව්‍යාපෘතිය යටතේ පහත වැඩ සිදුකරමින් පවතී

| අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය % | ප්‍රගතිය % |
|---|---|---|---|
| 01 | අලිකොටආර ජලාශය ඉදිකිරීම | 100% | 99.5 % |
| 02 | කුඩා ඔය ජලාශය ඉදිකිරීම (ඝන මීටර මිලියන 40) (ප්‍රවේශ මාර්ගයද ඇතුලුව) | 72% | 65.0 % |
| 03 | හඳපානාගල වැවේ ධාරිතාවය වැඩිකිරීම | 100% | 88.0 % |
| 04 | කුඩා ඔයේ සිට සියබලායාගම වැව දක්වා ඇළ මාර්ගය ඉදිකිරීම. (කි.මී. 30) | 82% | 64% |
| 05 | හඳපානාගල වම් ඉවුර ඉදිකිරීම හා දකුණු ඉවුරු පද්ධතිය පුනරුත්ථාපනය කිරීම | 90% | 77 % |
| 06 | අලිකොට ආරේ සිට කුඩා ඔය දක්වා ඇළමාර්ගය ඉදිකිරීම (කි.මී. 34) | 40% | 36% |
| 07 | කුඩා වැව් හා වාරිමාර්ග යෝජනා ක්‍රම | 98% | 45 % |
| 08 | බණ්ඩාරවෙල හා තෙලුල්ල ප්‍රදේශ වල ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම සහ බලපෑමට ලක්වූ පවුල් සඳහා යටිතල පහසුකම් සැපයීම | 80% | 90 % |
| 09 | ව්‍යාපෘති කළමනාකරණය, සැලසුම් සුපරීක්ෂණය, බදු, ප්‍රවාහන පහසුකම්, කාර්යයන්, වාහන නඩත්තු කිරීම්, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | 78% | 60% |

## 5.2 වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියේ අරමුණ වන්නේ විශාල වේලිවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා දීර්ඝ කාලීනව අඛණ්ඩව පවත්වා ගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීම සහ ජල සම්පත් සැලසුම් වැඩි දියුණු කිරීමයි.මෙම ව්‍යාපෘතිය කොටස් හතරකට බෙදිය හැකිය.

පලමුවැනි කොටසනම් වේලි ආරක්ෂාව හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමයි.මෙම කොටසින් තෝරා ගත් වැඩි අවදානම් සහිත විශාල වේලි 32 ක මහජන ආරක්ෂාව උසස් මට්ටමකට ගෙන ඒම සහ වේලි 80 ක (ඉහත වේලි 32 ක් ඇතුළුව) මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ආයතනික ක්‍රියාකාරකම්, වේලි ආරක්ෂණ කළමනාකරණ සහ නඩත්තු හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීම සිදු කරයි. මෙය පහත උප කොටස් වලට බෙදේ.

I. වැඩි අවදානම් සහිත වේලි 32 සඳහා පිළියම් යෙදීම.
II. විශාල වේලි 80 ක් සඳහා මූලික ආරක්ෂණ පහසුකම් සැපයීම.
III. වේලි හිමිකම් සංවිධාන ශක්තිමත් කර පුහුණු කිරීම.
IV. විශේෂිත උපකරණ සැපයීම හා අධ්‍යනය.

වේලි ආරක්ෂණ හා ජල සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය 2008 සිට 2014 දක්වා වූ කාලය තුළ සාර්ථකව අවසන් වූ අතර ඉන් අනතුරුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ (අතිරේක මූල්‍ය) ව්‍යාපෘතිය මුල් ව්‍යාපෘතියේ දිගුවක් ලෙස ආරම්භ විය.

ඒ අනුව ශ්‍රී ලංකා රජය ඇමෙරිකානු ඩොලර් මිලියන 83 ක අමතර මූල්‍ය පහසුකම් ලෝක බැංකුවෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ (අතිරේක මූල්‍ය) ව්‍යාපෘතිය 2014 ජුනි මාසයේ දී ආරම්භ කරන ලදී. එය 2018 මැයි මස අවසන් කරන ලද අතර ඒ යටතේ මුල් අදියරේ ප්‍රතිසංස්කරණයට තෝරා ගත් වැව් 32 න් 14 ක් ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට නොහැකි වීම නිසා එම වැව්ත් ඇතුලත්ව මුල් අදියරේ ප්‍රතිසංස්කරණය කරන ලද ජලාශ ගනණාවක කාර්යක්ෂමතාව වැඩි කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ යෝජනා විය. වික්ටෝරියා ජලාශය සමඟ ජලාශ 31 ක් ප්‍රතිසංස්කරණ කටයුතු මෙම අතිරේක මූල්‍යන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ලංකා විදුලි බල මණ්ඩලය, උතුරු පළාත් සභාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන මෙම ව්‍යාපෘතියේ පාර්ශව කරුවන් වෙති.

වාරිමාර්ග වැඩ සඳහා මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු පිරිවැය | - | රු.මිලියන 1,976 |
| 2018 මැයි මස අවසානයට වියදම | - | රු.මිලියන 1,414 |

2018 මැයි මාසයේදී මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යෝජිත වැව් 18ම පුනරුත්ථාපනය කරන ලද අතර ඉතිරි ගෙවීම් ගෙවීමට ඇත.

## ආ. වාරිමාර්ග කළමනාකරණ අංශය

1984 වර්ෂයේ දී ආරම්භ කරන ලද වාරිමාර්ග කළමනාකරණ අංශය දැනට හෙක්ටයාර් 400ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54ක මහා වාරිමාර්ග ඒකාබද්ධ කළමනාකරණ වැඩ සටහන (INMAS) ක්‍රියාත්මක කිරීම මගින් සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ දැක්ම වනුයේ ස්වයං කළමනාකරණය සඳහා ආත්ම විශ්වාසය පදනම් කරගත් වාරිමාර්ග ජනාවාස ආශ්‍රිත ගොවි ප්‍රජාවක් බිහි කිරීමයි. ගොවි සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන ආයතන යන පාර්ශවයන්ගේ සහභාගිත්වය සහ දායකත්වය තුළින් මහා වාරිමාර්ග ව්‍යාපාර වල ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නංවමින් ඒකාබද්ධ ජල කළමනාකරණය තුළින් ගොවි ජනතාවගේ තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

මහා වාරිමාර්ග බල ප්‍රදේශවල විධිමත් කළමනාකරණයක් හරහා නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීමේ අරමුණෙන් ගොවි සංවිධාන බිහි කිරීම, පවත්වාගෙන යාම හා ශක්තිමත් කිරීම, වාරිමාර්ග උපපද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීම, කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකරණය, වාතාවරණය සැකසීම හා සම්බන්ධීකරණය තුළින් ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම මෙම අංශයේ වගකීම වේ.

### 1. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා බල ගැන්වීම

1.1) මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි ගොවි සංවිධාන 874ක් පිහිටුවා ඇති අතර එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කර ඒවායේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරු කිරීම සඳහා පහත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය පහසුකරණය හා මග පෙන්වීම් කර ඇත.

| කාර්යයන් | මිනුම් ඒකකය | ඉලක්ක | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ගොවි සංවිධාන අවසන් ගිණුම් සැකසීම | සංඛ්‍යාව | 888 | 804 | 91 |
| ගොවි සංවිධාන ගිණුම් කටයුතු යථාවත් කිරීම | සංඛ්‍යාව | 888 | 841 | 95 |
| ගොවි සංවිධාන ගිණුම් විගණනය සඳහා යොමු කිරීම | සංඛ්‍යාව | 864 | 634 | 73 |
| ගොවි සංවිධාන නිළවරණ පැවැත්වීම | සංඛ්‍යාව | 496 | 433 | 97 |
| ගොවි සංවිධාන මහා සභා රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 1,768 | 1,734 | 98 |
| ගොවි සංවිධාන මාසික කමිටු රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 10,608 | 7,394 | 70 |
| ගොවි සංවිධාන ව්‍යවස්ථාව සංශෝධනය හා සම්මත හා කාර්ය පරිපාටි හඳුන්වාදීම සහ ඒවා භාවිතය තහවුරු කිරීම | සංඛ්‍යාව | 436 | 190 | 43 |
| ගොවි සංවිධාන විෂය කමිටු පිහිටුවීම (කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය සඳහා) | සංඛ්‍යාව | 113 | 57 | 51 |
| ආදර්ශ ගොවි සංවිධාන ඇති කිරීම | සංඛ්‍යාව | 55 | 50 | 91 |
| පද්ධති මට්ටමේ ගොවි සංවිධාන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කිරීම | සංඛ්‍යාව | 15 | 6 | 40 |
| ගොවි සංවිධාන අරමුදල් වර්ධනය | රුපි (000) | 58,093 | 55,500 | 96 |

## ගොවි සංවිධාන මහසභා රැස්වීම්



පදවිය ව්‍යාපාරය



දේවහුව ව්‍යාපාරය



ගිරිතලේ ව්‍යාපාරය



මහවිලච්චිය ව්‍යාපාරය

## ගොවි සංවිධාන නිළවරණ රැස්වීම්



කිරිදිඔය ව්‍යාපාරය



රාජාංගනය ව්‍යාපාරය



රිදියගම ව්‍යාපාරය



නාච්චාදූව ව්‍යාපාරය

1.2) ගොවි සංවිධාන කටයුතු වල පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා ගොවි සංවිධාන කටයුතු පසු විපරම් කිරීමේ වැඩමුළු 4ක් කන්තලේ, අල්ල සහ අක්කරපත්තු ව්‍යාපාර වල පවත්වන ලදී. එම වැඩමුළු තුළින් හඳුනාගත් කරුණු නිවැරදි කර එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

**ගොවි සංවිධාන කටයුතු පසු විපරම් කිරීමේ වැඩමුළු**



අල්ල ව්‍යාපාරය



කන්තලේ ව්‍යාපාරය

එසේම ගිරිතලේ ව්‍යාපාරයේ මෙම පසු විපරම් වැඩමුළුවෙන් හඳුනාගත් තත්වයන් නිවැරදි කර තිබේ ද යන්න පිළිබඳව ගොවි සංවිධාන මට්ටමින් ක්ෂේත්‍රයට ගොස් පරීක්ෂා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

1.3) ගොවි සංවිධාන අතර තරගකාරීත්වය තුළින් කාර්යක්මතාව වර්ධනය කිරීම, ගොවි සංවිධාන නිළධාරීන්ගේ කටයුතු අගය කිරීම හා ගොවි සංවිධාන වර්ගීකරණය අරමුණු කරගෙන වාරිමාර්ග බල ප්‍රදේශ මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින් ගොවි සංවිධාන තරඟාවලියක් මෙම වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කළ අතර වර්ෂය ආරම්භයේ පැවති අයහපත් කාලගුණික තත්වය මත වාරි බල ප්‍රදේශ මට්ටමේ තරගය පමණක් මෙම වර්ෂයේ දී පවත්වන ලදී. ඒ අනුව ගිරිතලේ, මහකනදරාව, මීඔය, උස්ගල/සියඹලන්ගමුව, රිදියගම, බතලගොඩ, හක්වටුනාඔය, තබ්බෝව, බදුළුඔය/බත්මැඩිල්ල, මුරුතවෙල ව්‍යාපාර වල වාරිබල ප්‍රදේශ මට්ටමේ තරග පවත්වා අවසන් කර ඇති අතර අනිකුත් ව්‍යාපාර වල ගොවි සංවිධාන වල කොටසක පමණක් තරගය පවත්වා ඇත. ඉතිරි ගොවි සංවිධාන වල  තරග 2019 වර්ෂයේ පෙබරවාරි මස අවසන් වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

**ගොවි සංවිධාන තරග සඳහා තොරතුරු ලබා ගනිමින්**





ගිරිතලේ ව්‍යාපාරය

1.4) ගරු වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ හා අපදා කළමනාකරණ අමාත්‍යතුමා හා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව ඉඟිණිමිටිය ව්‍යාපාරයේ වාරි පද්ධතියේ නඩත්තු කටයුතු කඩිනම් කිරීම සඳහා ක්‍රියාත්මක වන දියවර නැදැයෝ වැඩසටහනට සමගාමීව පරිසර ළමා අනු කමිටු 24 ක් පිහිටුවීම, ඔවුන් අතර දැනුම මිණුම තරඟ පැවැත්වීම, ගොවි සංවිධාන අතර දැනුම මිණුම තරඟාවලියක් පැවැත්වීම, කෘෂිකාර්මික උපකරණ ප්‍රදර්ශනයක් පැවැත්වීම හා ජනතා ගැටළු විසඳීම සඳහා ජංගම සේවාවන් 03 ක් සංවිධානය කිරීම යනාදී කාර්යයන් ඉටු කරන ලදී.

1.5) ගොවි සංවිධාන වල යහපාලනය තහවුරු කිරීම හා සහභාගීත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ගොවි සංවිධාන නිලධාරීන් හා ගොවීන් පුහුණු කර ඇත.

| පුහුණු වැඩසටහන | ඉලක්කය (පුද්ගලයන් සංඛ්‍යාව) | ප්‍රගතිය (පුද්ගලයන් සංඛ්‍යාව) | % |
|---|---|---|---|
| මූල්‍ය කළමනාකරණය | 2,000 | 1,477 | 74 |
| නායකත්ව ගුණාංග වර්ධනය | 1,015 | 259 | 26 |
| ගොවි සංවිධාන ශක්තිමත් කිරීම | 350 | 282 | 59 |
| ආදායම් කළමනාකරණය | 1,690 | 359 | 15 |
| දේශගුණික වෙනස්වීම් පිළිබඳ දැනුවත් කිරීම | 320 | 198 | 57 |
| කෙත්ඇල කණ්ඩායම් ශක්තිමත් කිරීම | 260 | 118 | 43 |
| වෙනත් | 300 | 180 | 34 |
| **එකතුව** | **5,935** | **2,873** | **49** |

වර්ෂය ආරම්භයේ පැවති අයහපත් කාලගුණික තත්වය සහ සුදුසු සම්පත්දායකයින් සොයා ගැනීමට පැවති අපහසුව නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

**ගොවි සංවිධාන නායකයින් දැනුවත් කිරීම**



අක්කරපත්තුව ව්‍යාපාරය

**කෙත්ඇල නායකයින් දැනුවත් කිරීම**



නාච්චාදූව ව්‍යාපාරය

**මූල්‍ය කළමනාකරණ පුහුණුව**



කිරිඳිඔය ව්‍යාපාරය



ගිරිතලේ ව්‍යාපාරය

1.6) ගොවි සංවිධාන වල මූල්‍ය කළමනාකරණ පුහුණු කටයුතු වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පුහුණුකරුවන් ලෙස මෙම අංශයේ නිළධාරීන් 28 දෙනෙකු පුහුණු කරන ලදී.

**පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව**







2018.11.07 සිට 09 දක්වා අතුරුගිරිය ජාතික වැව්ළි කළමනාකරණ ආයතනය

1.7) මහා වාරි ප්‍රදේශ වල ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් සේවා කලට වේලාවට සැපයීම තහවුරු කිරීම සඳහා නියමිත වේලාවට පෙර කන්න රැස්වීම් පවත්වා කන්න රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය කර ඇත. එසේම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාරිමාර්ග කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා මාසිකව ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. ඉහත රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| රැස්වීම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 472 | 423 | 90 |
| පෙර කන්න රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 87 | 87 | 100 |
| කන්න රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 173 | 173 | 100 |

**ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම්**




අක්කරපත්තුව ව්‍යාපාරය



බතලගොඩ ව්‍යාපාරය

1.8) මහා වාරිමාර්ග ව්‍යාපාර වල නීරෝගී ජනතාවක් බිහි කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් ජනතාව මුදවා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳව ගොවීන්, ගොවි සංවිධාන නිලධාරීන් 37,890 ක් ද දෙමව්පියන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා සහ පාසල් සිසුන් 270 ක් ද දැනුවත් කර ඇත.

**මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳ දැනුවත් කිරීම්**



වේළිඔය ව්‍යාපාරය



බතලගොඩ ව්‍යාපාරය

## 2. සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩ සටහන

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54හි වාරිමාර්ග උප පද්ධතියේ බෙදුම් ඇල හා කෙත් ඇල) මෙහෙයුම් හා නඩත්තු කටයුතු ගොවි සංවිධාන වලට භාර දී ඔවුන් මගින් ඉටු කරවා ගනු ලබයි. මෙම කාර්යය ගුණාත්මයෙන් යුක්තව ඉටු කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙයවීම, මගපෙන්වීම හා ඒ සඳහා ගොවි සංවිධාන නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

2.1) මෙම අංශයේ මෙහෙයවීම මගපෙන්වීම හා පහසුකරණය යටතේ වාරිමාර්ග උප පද්ධති වල නඩත්තු කටයුතු සඳහා ගොවි සංවිධාන විසින් ලබා දෙන දායකත්වය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | ඉලක්කය (රු.පි.000) | ප්‍රගතිය (රු.පි.000) | % |
|---|---|---|---|
| බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් වල තණකොළ මට්ටමකට කැපීම හා රොන්මඩ ඉවත් කිරීම | 108,535 | 103,715 | 96 |
| ශ්‍රමදාන පැවැත්වීම (කැලෑ කැපීම, රොන් මඩ ඉවත් කිරීම හා වෙනත් කටයුතු) * | 68,558 | 72,000 | 105 |
| වාරිමාර්ග නිර්මිත හා උපාංග නඩත්තුව | 13,000 | 15,067 | 116 |
| කෘෂි මංමාවත් නඩත්තුව | 16,515 | 15,517 | 94 |
| දියබස්නා ඇලවල් නඩත්තුව | 12,195 | 10,502 | 99 |
| **එකතුව** | **218,803** | **216,801** | **99** |

* ශ්‍රමදාන වල මිනිස් දින එකක වටිනාකම රු.පි.800.00 ක් ලෙස ගණනය කර ඇත.

### දියබස්නා ඇලවල් නඩත්තුව



කන්තලේ ව්‍යාපාරය



පදවිය ව්‍යාපාරය

### කෘෂි මංමාවත් නඩත්තු කිරීම



පදවිය ව්‍යාපාරය



රාජාංගනය ව්‍යාපාරය

2.2) එසේම වාරිමාර්ග උප පද්ධතියේ සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩ සටහන ප්‍රවර්ධනය සඳහා මෙම අංශයේ මෙහෙයවීම හා මගපෙන්වීම යටතේ ගොවි සංවිධාන විසින් පහත වැඩ සටහන් ද ක්‍රියාත්මක කර ඇත. එසේම රටේම ප්‍රධාන ගැටළුවක්ව පවතින වාරි ඇලවල් වල රක්ෂිත වෙන් කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීම බාධක මධ්‍යයේ වුව ද කරගෙන යනු ලැබේ.

| ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් සැකසීම | සංඛ්‍යාව | 102 | 75 | 74 |
| ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් යථාවත් කිරීම | සංඛ්‍යාව | 570 | 297 | 52 |
| බෙදුම්ඇළ හා කෙත්ඇල රක්ෂිත මායිම් සලකුණු කිරීම හා ආරක්ෂා කිරීම | කි.මීටර් | 856 | 539 | 63 |
| මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ගොවි සංවිධාන වලට ගොවීන් විසින් ලබා දී ඇති අරමුදල් වර්ධනය කිරීම මූල්‍ය දායකත්වය | රුපි.(000) | 92,000 | 71,712 | 78 |
| දැන්වීම් පුවරු සවිකිරීම | සංඛ්‍යාව | 460 | 458 | 100 |
| ජලය ආශ්‍රිත පූජා කර්ම / චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීම හා ප්‍රවර්ධනය | සංඛ්‍යාව | 640 | 539 | 84 |

**නඩත්තු සැලසුම් සැකසීම හා සකස් කරන ලද නඩත්තු සැලසුම්**




පදවිය ව්‍යාපාරය



මහකනදරාව ව්‍යාපාරය

2.3) රජයේ වස විසෙන් තොර වගා ප්‍රතිපත්තිය ක්ෂේත්‍ර ගත කිරීම උදෙසා වස විස භාවිතය අවම කරමින් පරිසර හිතකාමී වගා වලට ගොවීන් යොමු කිරීම සහ වාරි ඇල වල ජලය පිරිසිදුව තබා ගැනීම සඳහා සංස්කෘතිමය හා සාම්ප්‍රදායික ක්‍රමවේදයන් යළි හඳුන්වා දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ මීඔය දඹරාව, මුරපොලඇල සහ බදුළුඔය/බත්මැඩිල්ල ව්‍යාපාර වල සෙත්පිරිත් සජ්ඣායනා සහ සර්වඥධාතු ප්‍රදර්ශනය කර ආශ්‍රිත පූජාවන් පවත්වන ලදී.

**සර්වඥධාතු ප්‍රදර්ශනය**



දඹරාව ව්‍යාපාරය



මුරපොලඇල ව්‍යාපාරය

2.4) 2018 සිරි දළදා යල් අස්වනු පූජාව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය හා මෙම අංශය මගින් මෙහෙයවනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර වල ගොවි සංවිධාන නායකයින් හා ගොවීන් 5,000ක පමණ සහභාගීත්වයෙන් 2018 ඔක්තෝම්බර් 08 දින සිරිදළදා මාලිගාවේ දී තෙවන වරටත් පවත්වන ලදී. මෙම උතුම් සංස්කෘතික මංගල්‍යය වාරිමාර්ග කළමනාකරණ අංශය, ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. දළදා මාලිගාවට අමතරව පුල්ලයාර් කෝවිල, මීරා මක්කම් පල්ලිය, ශාන්ත පාවුළු දෙව් මැදුරට යල් අස්වනු පූජා කිරීම මෙම යල් අස්වනු පූජාවේ විශේෂත්වයකි. සියළු ජාතීන් නියෝජනය කරමින් ගොවීන් සහභාගීවීම හා යල් කන්නයේ වගාකරණ ලද සියළු බෝග වල අස්වැන්නේ අග්‍රඵල පූජා කිරීම මෙම සංස්කෘතික මංගල්‍යයේ තවත් විශේෂත්වයකි.

**සිරි දළදා යල් අස්වනු පූජාව - මහනුවර**




2.5) උප පද්ධති නඩත්තු කටයුතු වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නවීන යන්ත්‍රසූත්‍ර භාවිතයට ගොවි සංවිධාන යොමු කිරීම හා ඒවා භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ආදර්ශයක් ලෙස වැඩි කාර්යක්ෂමතාවයෙන් යුත් තණකොළ කපන යන්ත්‍ර 4 ක් මිල දී ගෙන රිදීබැදිඇල, මින්නේරිය, ගල්ඔය වම් ඉවුර, ගිරිතලේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාල වලට ලබා දී ඇත. මෙම යන්ත්‍ර මුදල් අය කිරීමේ පදනම යටතේ ගොවි සංවිධාන වලට ලබා දී මෙම යන්ත්‍ර ගොවි සංවිධාන අතර ප්‍රචලිත කිරීමට කටයුතු යොදා ඇත. එසේම මෙම යන්ත්‍ර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා රාජාංගනය ව්‍යාපාරයේ ක්ෂේත්‍ර ආදර්ශනයක් පවත්වා නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් දැනුවත් කර ඇත.

**යන්ත්‍ර හඳුන්වා දීම**




2.6) මෙහෙයුම් නඩත්තු කටයුතු තවදුරටත් කාර්යක්ෂම ලෙස පවත්වාගෙනයාම අරමුණු කරගෙන දැනට ක්‍රියාත්මක උප පද්ධති මෙහෙයුම් නඩත්තු වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය සඳහා සියළුම නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන වැඩමුළුවක් පවත්වන ලදී.

2.7) නඩත්තු කටයුතු වල ගුණාත්මය ඉහල නැංවීම හා හා ජල කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ගොවීන් හා ගොවි සංවිධාන නිලධාරීන් ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා පහත පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

| පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන | ඉලක්කය (පුද්ගලයින් සංඛ්‍යාව ) | ප්‍රගතිය (පුද්ගලයින් සංඛ්‍යාව ) | % |
|---|---|---|---|
| නිරන්තර නඩත්තුව | 1,805 | 846 | 44 |
| ජල කළමනාකරණය | 940 | 289 | 31 |
| නීතිමය බලතල | 870 | 252 | 29 |
| ජල පාලකවරු පුහුණු කිරීම | 280 | 82 | 29 |
| තණකොල කපන යන්ත්‍ර අළුත්වැඩියාව | 155 | 69 | 45 |
| රක්ෂිත ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීම | 270 | 188 | 50 |
| **එකතුව** | **4,320** | **1,726** | **40** |

යල කන්නයේ පැවති ජල හිඟය නිසා අපේක්ෂිත පරිදි වගා කිරීමට නොහැකි වූ බැවින් පුහුණු ඉලක්ක සපුරා ගැනීමට ද නොහැකි විය.

**ජල කළමනාකරණ පුහුණුව**



හක්වටුනාඔය ව්‍යාපාරය



මහකනදරාව ව්‍යාපාරය

**නිරන්තර නඩත්තු පුහුණුව**



මහකනදරාව ව්‍යාපාරය



වේළිඔය ව්‍යාපාරය

2.8) මෙම අංශයේ මෙහෙයවීම, මඟ පෙන්වීම හා පහසුකරණය යටතේ මින්නේරිය සහ මුතුකණ්ඩිය ව්‍යාපාර වල මෑත කාලීන ඉතිහාසය ලේඛණ ගත කිරීම සඳහා “වාපි” නමින් සඟරාවක් සකස් කරමින් සිටී.

2.9) මාර්තු 21 දිනට යෙදෙන ලෝක ජල දිනය සමරා ගොවීන් ජලය කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සඳහා මහා වාරි බල ප්‍රදේශ වල පහත වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

| වැඩ සටහන | මිනුම් / ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ගොවි සංවිධාන නායකයින් දැනුවත් කිරීම | සංඛ්‍යාව | 2,597 | 1,485 | 57 |
| ගොවීන් දැනුවත් කිරීම | සංඛ්‍යාව | 7,085 | 4,069 | 57 |
| පාසල් සිසුන් දැනුවත් කිරීම | සංඛ්‍යාව | 6,575 | 4,102 | 62 |
| පාසල් සිසුන් අතර චිත්‍ර / රචනා / කථික තරග පැවැත්වීම | සංඛ්‍යාව | 1550 | 900 | 58 |
| දැනුම මිණුම තරඟ පැවැත්වීම | සංඛ්‍යාව | 30 | 30 | 100 |
| ජලධාරා ප්‍රදේශ සංරක්ෂණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම | සංඛ්‍යාව | 750 | 260 | 35 |
| ශ්‍රමදාන පැවැත්වීම | මිනිස් දින | 13415 | 9410 | 70 |

**ජලය සුරක්ෂිත ලෙස භාවිතා කිරීම හා අපවිත්‍ර කිරීම වැළැක්වීම පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම**



මුරුතවෙල ව්‍යාපාරය



තිසාවැව ව්‍යාපාරය

2.10) දේශගුණික වෙනස්වීම්වලට අනුගත වීම හා ජල ඒකකයක ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා කුඹුරු ඉඩම් හෙක්. 61,124ක වර්ෂා ජලයෙන් බිම් සකස් කිරීමට ගොවීන් යොමු කර ඇත. එසේම කෙත් ඇලවල් 2,559ක සහ බෙදුම් ඇලවල් 1,520ක ජල කාල සටහන් සකස් කිරීමට හා ඒ අනුව වාරි ජලය බෙදාදීම සඳහා ගොවි සංවිධාන වලට අවශ්‍ය පහසුකරණය හා මඟ පෙන්වීම කර ඇත.

2.11) දේශගුණික වෙනස්වීම් හමුවේ ජලය කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සඳහා බතලගොඩ සහල් පර්යේෂණායතනය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව ආදර්ශයක් ලෙස මින්නේරිය හා නාච්චාදුව ව්‍යාපාර වල ඒකාන්තර තෙත් හා වියළි ජල සම්පාදන ක්‍රමය හඳුන්වාදීම සඳහා කටයුතු කරන ලදී. ඒ පිළිබඳව ගොවීන් හා රජයේ නිලධාරීන් 200ක් දැනුවත් කර ඇත. මෙම දැනුවත් කිරීම් වල දී ගොවීන් මේ සඳහා උනන්දුවක් නොදක්වන ලද බැවින් බතලගොඩ සහල් පර්යේෂණායතනය සමඟ එක්ව බතලගොඩ ව්‍යාපාරයේ අක්කර 18ක හා නුවර වැව ව්‍යාපාරයේ අක්කර 50ක ඒකාන්තර තෙත් වියළි ජල සම්පාදන ක්‍රමය හඳුන්වාදීම හා භාවිත කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය සිදු කරන ලදී.

2.12) දේශගුණික වෙනස්වීම් වලට අනුගතවීම පිළිබඳව ශ්‍රී ලංකා ජල සංසදය සමඟ එක්ව ගොවීන්, ගොවි සංවිධාන නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් කිරිඳිඔය, අල්ල, යෝධ වැව ව්‍යාපාර වල පවත්වන ලද අතර, මේ යටතේ ගොවීන් 170ක පමණ දැනුවත් කරන ලදී. විශේෂයෙන්ම දෙමළ භාෂාව කථා කරන බහුතර ජනතාවක් වෙසෙන අල්ල හා යෝධවැව ව්‍යාපාර වල මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලදී.



යෝධවැව ව්‍යාපාරය





කිරිඳිඔය ව්‍යාපාරය

2.13) ජලය උපරිම ඵලදායිතාවයකින් යුක්තව භාවිතයට හුරු කිරීම සඳහා මහකනදරාව ව්‍යාපාරයේ ගොවීන් 15 දෙනෙකුට බිංදු ජල සම්පාදන ක්‍රමය භාවිත කිරීම පිළිබඳ දෙදින විශේෂ පුහුණුවක් ලබාදෙන ලදී.

## 3. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාව ඉහල නැංවීම.

3.1) මෙම අංශයේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි කෘෂිකාර්මික නිෂ්පාදනය හා ඵලදායීතාවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | ඒකකය | 2017/18 මහ | 2018 යල | 2018 |
|---|---|---|---|---|
| වී වගා කළ බිම් ප්‍රමාණය (හෙක්) | හෙක්. | 135,622 | 105,332 | 240,954 |
| වෙනත් ආහාර බෝග වගාව හා එළවළු වගාව | හෙක් | 4,516 | 5,379 | 9,895 |
| බහු වාර්ෂික බෝග වගාව (කෙසෙල්, උක්) | හෙක් | 4,100 | 4,100 | 4,100 |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | හෙක් | 144,238 | 114,811 | 254,949 |
| වගා තිව්‍රතාවය | | | | 154% |
| මුළු වී නිෂ්පාදනය | ටොන් මිලියන | 0.614 | 0.415 | 1.029 |
| වී නිෂ්පාදනයේ වටිනාකම | රුපි. මිලියන | 23,348 | 16,584 | 39,932 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවලු නිෂ්පාදනයේ වටිනාකම | රුපි. මිලියන | 879 | 1,054 | 1951 |
| බහු වාර්ෂික බෝග නිෂ්පාදනයේ වටිනාකම | රුපි. මිලියන | | | 2,440 |
| වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවලු හා බහු වාර්ෂික බෝග නිෂ්පාදනයේ මුළු වටිනාකම | රුපි. මිලියන | 24,245 | 17,638 | 44,323 |

වර්ෂය ආරම්භයේ දී පැවති ජල හිඟය නිසා අපේක්ෂිත වී වගාව ඉලක්ක හා වෙනත් ආහාර බෝග වගා ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

**වී වගාව**



නීලබැම්ම ව්‍යාපාරය



කිරිදිඔය ව්‍යාපාරය

**වෙනත් ආහාර බෝග වගාව**

**බඩඉරිඟු වගාව**



අල්ල ව්‍යාපාරය



නාගදීප ව්‍යාපාරය

**සෝයා වගාව** **රටකජු වගාව**



දේවහුව ව්‍යාපාරය



ගිරිතලේ ව්‍යාපාරය

3.2) වී වගාවේ සාමාන්‍ය අස්වැන්න ඉහල නැංවීම හා කෘෂි රසායන භාවිතය අවම කිරීම අරමුණු කරගෙන හෙක්ටයාර් 538ක පැල විසුරුම් තාක්ෂණය (Parachute Method) ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය පහසුකරණය හා සම්බන්ධීකරණය සිදු කරන ලදී. එසේම, හෙක් 85 යන්ත්‍ර මගින් පැල සිටුවීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව ගොවීන් යොමු කර ඇත. හෙක් 15,200ක් කාබනික පොහොර භාවිත කර වී වගා කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකර ඇත. එසේම හෙක් 26,057ක ගුණාත්මක බීත්තර වී භාවිතය සඳහා ගොවීන් යොමු කිරීමට පහසුකරණය හා සම්බන්ධීකරණය සිදු කර ඇත.

**යන්ත්‍ර මගින් පැළ සිටුවීම**



නීලබැම්ම ව්‍යාපාරය



දම්බරාව ව්‍යාපාරය

3.3) ගොඩ ඉඩම් සංවර්ධනය කිරීම තුළින් ගොවි පවුලේ ආදායම ඉහළ නැංවීම අරමුණු කරගෙන වාරිමාර්ග කළමනාකරණ අංශයේ සම්බන්ධීකරණය යටතේ කිරිදිඔය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවීන් 180 දෙනෙකු සම්බන්ධ කරගෙන TOM EJC අඹ පැල 4,500ක් වගා කරන ලදී. මෙම අඹ ප්‍රභේදය අපනයන අඹ ප්‍රභේදයක් වන අතර පැවති නියං තත්වය යටතේ වුව ද වගා කරන ලද පැල වලින් 63%ක් පමණ ආරක්ෂා කර ගැනීමට ගොවීන්ට හැකිවිය. මෙම වර්ෂයේ සිට මේ වනවිට ගොවීන් මෙම වගාවෙන් විශාල ආදායමක් ලබාගනිමින් සිටී.

**TOM EJC අඹ වගාව**



කිරිදිඔය ව්‍යාපාරය



අල්ල ව්‍යාපාරය

මෙම ව්‍යාපෘතියේ අත්දැකීම් පදනම් කරගෙන ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය එක්ව රිදීබැදිඇල, නීලබැම්ම, තබ්බෝව, මහකනදරාව, මුතුකණ්ඩිය, රිදියගම, රාජාංගනය, අල්ල මහා මාර්මාර්ග ව්‍යාපාර වල TOM EJC අඹ වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගොවි පවුල් 790 කට අඹ පැල 19,750 ක් බෙදා දී ඇත. මෙම පැල මේ වන විටත් ක්ෂේත්‍රයේ සිටුවා ඇති අතර දැඩි නියං තත්වය යටතේ වුව ද පැල ආරක්ෂා කිරීම සඳහා ගොවීන් කැප වීමෙන් කටයුතු කරනු ලබයි.

3.4) "නීරෝගීමත් ජනතාවක් වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක්" තේමාව යටතේ වස විස භාවිතය අවම කර කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම අරමුණු කරගෙන මෙම අංශයේ සම්බන්ධීකරණය, මගපෙන්වීම සහ පහසුකරණය යටතේ ගොවි සංවිධාන මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ වේළිඔය ව්‍යාපාරයේ ඇත්දත්ගල හා රිදියගම ව්‍යාපාරයේ ප්‍රගති ගොවි සංවිධාන වල 2016 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කල අතර 2018 වර්ෂය වන විට කාබනික පොහොර නිෂ්පාදනය කරන ගොවි සංවිධාන සංඛ්‍යාව 176 ක් දක්වා වර්ධනය කිරීමට සැළසුම් කළ නමුත් රජයේ නව පොහොර ලබා දීමේ ප්‍රතිපත්තිය යටතේ මුදල් වෙනුවට පොහොර ලබා දිම නිසා කාබනික පොහොර භාවිතා කිරීමට ගොවීන් තුළ පැවති උනන්දුව අඩුවීම නිසා අපේක්ෂිත පරිදි මේ සඳහා ගොවි සංවිධාන යොමු කිරිමට නොහැකි විය. එහෙත් ගොවි සංවිධාන 62 ක් පමණ කාබනික පොහොර නිෂ්පාදනයට යොමු කිරීමට හැකි වූ අතර එම සංවිධාන විසින් කාබනික පොහොර මෙ.ටොන් 546 ක් පමණ නිෂ්පාදනය කර ගොවීන් වෙත ලබා දී ඇත. එසේම කාබනික ද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීම සඳහා ග්ලිරිසීඩියා පැල 63,678 ක් සිටුවීම සඳහා අවශ්‍ය පහසුකරණය හා සම්බන්ධීකරණය කරන ලදි.

**කාබනික පොහොර නිෂ්පාදනය**



බදුළුඔය/බත්මැඩිල්ල ව්‍යාපාරය



බතලගොඩ ව්‍යාපාරය

එසේම වස විස භාවිතය අවම කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය (SEMA) සමඟ එක්ව ජෛව විද්‍යාත්මක බෝග වගාව ව්‍යාප්ත කිරීම සඳහා වැඩ සටහනක් සංවිධානය කළ අතර ඒ යටතේ රිදීබැදිඇල, කවුඩුවවැව, අල්ල හා කන්තලේ ව්‍යාපාර වල හෙක්ටයාර් 136 ක වී වගාව ව්‍යාප්ත කිරීම සඳහා පහසුකරණය හා සම්බන්ධීකරණය කරන ලදි. මෙම වැඩසටහනට ගොවි පවුල් 488 ක් සහභාගී විය. තව ද වස විසෙන් තොර වගාව ප්‍රචලිත කිරීම සඳහා හන්තාන මූලික අධ්‍යයන ආයතනය සමඟ එක්ව බයෝ ෆිල්ම් පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා රිදීබැදිඇල ව්‍යාපාරයේ අක්කර 01 ප්‍රමාණයේ ආදර්ශන 21 ක් පැවැත්වීම සඳහා කටයුතු සම්බන්ධීකරණය කරන ලදි. එසේම 2018/19 යල කන්නයේ අක්කර 40 පමණ බිම් ප්‍රමාණයක බයෝ ෆිස්ම් ජෛව පොහොර භාවිතා කිරීමට ගොවීන් යොමු කර ඇත.

**බයෝෆිල්ම් පොහොර භාවිතය ප්‍රචලිත කිරීම**






ගිරිතලේ ව්‍යාපාරය

3.5) කිරි නිෂ්පාදනය ඉහල නැංවීම සහ එමගින් ගොවි පවුලේ ආදායම ඉහල නැංවීම අරමුණු කර ගෙන අල්ල, කන්තලේ, මොරවැව, මහදිවුල්වැව, බතලගොඩ, හක්වටුනාඔය, තිසාවැව, මහකනදරාව මහා වාරිමාර්ග ව්‍යාපාර වල සත්ව පාලන කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා පහසුකරණය හා මග පෙන්වීම කර ඇති අතර එහි ප්‍රගතිය පහත දැක්වේ.

| කාර්යයන් | මිනුම් ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| කිරි ගවයන් ලබා ගැනීම සඳහා පහසුකරණය | සංඛ්‍යාව | 99 | 79 | 80 |
| විධිමත් ගවගාල් ඉදිකිරීම සඳහා පහසුකරණය | සංඛ්‍යාව | 67 | 50 | 75 |
| CO3 තෘණ වගාව ව්‍යාප්ත කිරීම සඳහා පහසුකරණය | හෙක්. | 24 | 10 | 43 |

එසේම මූල්‍ය ආයතන සම්බන්ධීකරණය තුළින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 5.6ක පමණ මූල්‍ය පහසුකම් ලබා දීමට අවශ්‍ය පහසුකරණය කර ඇත.

**විධිමත් ගව ගාලක් තුළ සත්ව පාලනය**





කන්තලේ ව්‍යාපාරය

3.6) ගෙවතු වගා සංවර්ධනය තුළින් ගොවි පවුලේ ආදායම ඉහළ නැංවීම සඳහා අඹ පැල 5,875ක් ද, ගම්මිරිස් පැල 2,040ක් ද, දොඩම් පැල 1,750ක් ද, පොල් පැල 13,785ක් ද, දෙළුම් පැල 2,025ක් ද සිටුවීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත. බතලගොඩ ව්‍යාපාරයේ තන්තිරිගම ගජබා ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ගෙවතු 40ක් සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකරණය හා සම්බන්ධීකරණය කරන ලදි.

3.7) ගොවි පවුලේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොඩ ඉඩම් වල කෙසෙල් හෙක්ටයාර් 183 ක් ද, පැපොල් වගාව හෙක්ටයාර 47 ක් ද වගා කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පහසුකරණය කර ඇත.

3.8) රිදීබැඳි ඇල, හක්වටුනා ඔය, මීඔය, රාජාංගනය, පදවිය, හුරුළු වැව, නුවරවැව, ගිරිතලේ, දඹරාව, අල්ල, කිරිඳිඔය, අක්කරපත්තුව මහා වාරිමාර්ග බල ප්‍රදේශ වල ගොවීන් 1,256 දෙනෙකුට ගොවි සංවිධාන අරමුදලින් රු.මි. 17ක වගා ණය ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම හා පහසුකරණය කර ඇත.

3.9) ගොවි පවුලේ ආදායම ඉහළ නැංවීම අරමුණු කරගෙන වාරිපුබුදුව චක්‍රීය ණය වැඩසටහන යටතේ වයඹ සංවර්ධන බැංකුව හා රජරට සංවර්ධන බැංකුව එක්ව ආදායම් උත්පාදන කටයුතු සඳහා ගොවීන් 114 කට රු. මිලියන 16.9 ක මූල්‍ය පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත.

3.10) කෘෂි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන ගොවීන්ගේ දැනුම හා කුසලතා වර්ධනයට පහත පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

| පුහුණු වැඩ සටහන | ඉලක්කය (පුද්ගලයින් සංඛ්‍යාව) | ප්‍රගතිය (පුද්ගලයින් සංඛ්‍යාව) | % |
|---|---|---|---|
| 1. ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරුව | 1,500 | 1,023 | 41 |
| 2. පැළ විසුරුම් තාක්ෂණය | 490 | 147 | 29 |
| 3. වෙනත් ආහාර බෝග වගා කිරීම | 3,175 | 1,191 | 37 |
| 4. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය | 1,000 | 174 | 18 |
| 5. ගොවි පොළ ජල කළමනාකරණය | 305 | 173 | 58 |
| 6. පසු අස්වනු තාක්ෂණය | 175 | 62 | 40 |
| 7. බහු වාර්ෂික බෝග වගාව | 105 | 60 | 57 |
| 8. TOM EJC අඹ වගාව | 325 | 225 | 67 |
| 9. ගොඩ ඉඩම් සංවර්ධනය | 140 | 128 | 91 |
| 10. ගෙවතු වගාව | 155 | 70 | 45 |
| 11. වෙනත් පුහුණු හා දැනුවත් කිරීම් | 1390 | 868 | 62 |
| **එකතුව** | **8,760** | **4,121** | **47** |

පැවති වියළි කාලගුණික තත්වය නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

**ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව**





ගිරිතලේ ව්‍යාපාරය

3.11) කෘෂිකාර්මික යන්ත්‍ර උපකරණ භාවිතය කාර්යක්ෂම කිරීම හා ඉඩම් ඒකකයක හා ජල ඒකකයක ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගෙන ගොවිපළ ඒකාබද්ධ කිරීමේ අධ්‍යයන නියමු ව්‍යාපෘතියක් නාච්චාදූව ව්‍යාපාරයේ ඉසුරු ගොවි සංවිධානයේ LLB 6 බෙදුම් ඇළේ FC 8 සහ 9 කෙත් ඇලවල් වල ක්‍රියාත්මක කරමින් සිටී. මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය අමාත්‍යාංශය හා ජපානයේ වාරිමාර්ග හා ජල අපවහන ආයතනය (Japanese institute of Irrigation and Drainage - JIID) සමඟ එක්ව ක්‍රියාත්මක කරනු ලැබේ.

වාරිමාර්ග කළමනාකරණ අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, මිනින්දෝරු ජනරාල් දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉසුරු ගොවි සංවිධානය එක්ව ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

ව්‍යාපෘතියේ කටයුතු වල ප්‍රගතිය පහත දැක් වේ.

- ❖ නාච්චාදුව ව්‍යාපාර කළමනාකරණ කමිටුව, ඉසුරු ගොවි සංවිධානය, ඉසුරු ගොවි සංවිධානයේ FC 8 සහ 9 කෙත් ඇලවල් වල සියළු ගොවීන් ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කර ඔවුන්ගේ එකඟතාව ලබාගෙන ඇත
- ❖ JIID ආයතනයේ නිළධාරීන් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක ක්‍රියාත්මක කිරීමට නියමිත සියළු ආයතන සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන වැඩමුළු 3 ක් පැවැත්වීම
- ❖ FC 8 සහ 9 කෙත් ඇලවල් වල ඉඩම් මැණුම් කිරීම හා සමෝච්ඡ රේඛා සිතියම සකස් කිරීම
- ❖ පාංශු ජල වහන සිතියම හා පසේ ගැඹුර සිතියම්ගත කිරීම
- ❖ ඉඩම් අයිතිය පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ඉඩම් හිමිකරුවන් හඳුනා ගැනීම
- ❖ ව්‍යාපෘතියේ සංකල්ප පත්‍රිකාව සහ අවබෝධතා ගිවිසුම සකස් කිරීම
- ❖ ව්‍යාපෘතියේ වියදම් ඇස්තමේන්තුව සකස් කිරීම
- ❖ FC 8 සහ 9 කෙත් ඇලවල් වල ජල මාපක සවිකර ජල භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනීම




ඉඩම් මිණුම්ගත කිරීම

## 4. පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය

මෙම අංශයේ මැදිහත්වීම, මග පෙන්වීම හා සම්බන්ධීකරණය යටතේ මහා වාරිමාර්ග ව්‍යාපාර වල පරිසර ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

4.1) වාරිමාර්ග රක්ෂිත වල හා තෝරාගත් විශේෂිත ස්ථාන වල පැල 9,826ක් සිටුවා ඇත.

4.2) පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය පිළිබඳව ගොවීන් සහ පාසල් සිසුන් 1,200ක් දැනුවත් කර ඇත.





රාජාංගනය ව්‍යාපාරය

4.3) කෘෂි රසායන ඇසුරුම් ඇළ මාර්ග වලට හා පරිසරයට දැමීම වැලැක්වීම සඳහා කෘෂි රසායන ඇසුරුම් එකතු කිරීමේ ටැංකි 29ක් කෙත් ඇල හා බෙදුම් ඇලවල ස්ථාපිත කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙයවා ඇත.

**කෘෂි රසායන ඇසුරුම් එකතු කිරීමේ බඳුන් ස්ථාපිත කිරීම**



කිරිදිඔය ව්‍යාපාරය



මින්නේරිය ව්‍යාපාරය

4.4) මුතුකණ්ඩිය ජලාශයේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සඳහා නියමු වැඩසටහනක් දිස්ත්‍රික් ලේකම්, ප්‍රදේශීය ලේකම්වරු, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන්, වාරිමාර්ග දෙපාර්මේන්තු නිලධාරීන් සහ ගොවි සංවිධාන නිලධාරීන් මුතුකණ්ඩිය ජල පෝෂක ප්‍රදේශයේ වගා කටයුතු වල නිරත ගොවීන් සහභාගි කරගෙන ක්‍රියාත්මක කරමින් සිටි. මේ යටතේ මුතුකණ්ඩිය ජල පෝෂක ප්‍රදේශයේ වගාකරුවන් 600ක් පමණ දැනුවත් කර ඇති අතර තිරසර වැඩ සටහනක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සියළු පාර්ශව වල සහභාගිත්වයෙන් සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමවේද අනුගමනය කර ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර ඇත.

ඒ යටතේ ලෝක ජල දිනයට සමගාමීව සියළු පාර්ශව වල සහභාගීත්වයෙන් මුතුකණ්ඩිය වැව් රක්ෂිත මායිමේ පැල සිටුවීමේ වැඩසටහනක් මාර්තු මස 28 දින ක්‍රියාත්මක කරන ලද අතර, මේ යටතේ පැල 2,500ක් සිටුවන ලදී. මෙම පැල මේ වනවිට හොඳින් වැඩී ඇත. මෙම ව්‍යාපෘතියේ අත්දැකීම් පදනම් කරගෙන අනෙකුත් මහා වාරිමාර්ග ව්‍යාපාර වල ජල පෝෂක ප්‍රදේශ වලට ද මෙම වැඩසටහන ක්‍රමානුකූලව ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

**මුතුකණ්ඩිය වැව් රක්ෂිතයේ පැල සිටුවීම**





## 5. නිලධාරීන්ගේ හැකියා වර්ධනය

මෙම අංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල වල නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා පහත පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

| පුහුණු වැඩ සටහන | ඉලක්කය | සහභාගි වූ සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| කාර්යාල කම්කරුවන් සඳහා පරිගණක පුහුණුව | 35 | 30 | 86 |
| කළමනාකරණ සහකරුවන් සඳහා කාර්යාල ක්‍රම, ගිණුම් කටයුතු හා ප්‍රසම්පාදන පුහුණුව | 7 | 7 | 100 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 2 | 2 | 100 |
| කාර්යාල කාර්යය සහකරුවන් සඳහා දුරකථන නිපුණතාව හා ආචාරධර්ම පිළිබඳ පුහුණුව | 3 | 3 | 100 |
| සංවර්ධන නිළධාරී හැකියා වර්ධනය | 25 | 20 | 80 |

**කාර්යාල කම්කරුවන් සඳහා පරිගණක පුහුණුව**





## 6. ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්වීම

2018 ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් සඳහා වැඩමුළුවක් 2018.08.15,16,17 දින තෙදින තුළ කොත්මලේ වාරිමාර්ග කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. එසේම ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රගතිය සමාලෝචන සඳහා ප්‍රධාන කාර්යාලයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 3 ක් පවත්වන ලදී.





නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ගේ ප්‍රගති සමාලෝචන වැඩමුළුව

## 7. මහජන දුක් ගැනවිලි හා පැමිණිලි වලට විසඳුම් ලබා දීම

මෙම අංශයේ ප්‍රධාන කාර්යාලයට හා නේවාසික ව්‍යාපාර කාර්යාල වලට ලැබුණු මහජන දුක් ගැනවිලි හා පැමිණිලි වලට විසඳුම් ලබා දීම පහත පරිදි වේ.

- ❖ මහජන දුක් ගැනවිලි/පැමිණිලි ලැබුණු සංඛ්‍යාව 4371
- ❖ ඉන් විසඳුම් ලබාදුන් සංඛ්‍යාව 4167
- ❖ විසඳුම් ලබා දීමේ ප්‍රතිශතය 95

**8.** මෙම අංශයේ කවුඩුළුවැව හා කිරිදිඔය ව්‍යාපාරවල අළුතින් ඉදි කරන ලද නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල මෙම වර්ෂයේ දී විවෘත කරන ලදී. එසේම අල්ල ව්‍යාපාරයේ සහ වෙලිඔය වාරි බල ප්‍රදේශ වල ද නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල අළුතින් ඉදිකර ඇත.

**නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය විවෘත කිරීම**





කවුඩුළුවැව ව්‍යාපාරය

# ඉ. ජල සම්පත් මණ්ඩලය

## 1. භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල නිමාන ව්‍යාපෘති සහ අධ්‍යයන

### 1.1) භූගත ජල කළමනාකරණයට අවශ්‍ය දිගු කාලීන දත්ත එක් රැස් කිරීම සඳහා වූ වැඩසටහන (රු. 7.5 මිලියන)

මූලික ක්‍රියාකාරකම් අවසන් කොට ඇති ව්‍යාපෘති 08 ක් ඒකාබද්ධව කොට මෙම දිස්ත්‍රික්කයේ සිදු කරගෙන යනු ලබන අතර මෙහි දී අදාල ව්‍යාපෘති ප්‍රදේශ තුල දීර්ඝකාලීන භූගත ජල අධ්‍යයනය සිදු කෙරේ. මූලික ව්‍යාපෘති ආරම්භයේ දී, එම ව්‍යාපෘති වලට අදාල ප්‍රදේශ වල පවතින භූගත ජල ගැටළු හඳුනාගනිමින් දීර්ඝකාලීන නිමාන පද්ධතිය භූගත ජල අධීක්ෂණ දත්ත එක් රැස් කිරීමේ ජාලය නල ළිං සහ වල ළිං ජාලය සකස් කිරීම සඳහා පරීක්ෂණ නල ළිං ඉදිකරන ලදී. එම ඉදිකරන ලද නල ළිං වල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රදේශය | ඉදි කරන ලද පරීක්ෂණ නල ළිං ගණන |
|---|---|---|---|
| 01. | කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වැලි සහිත නොගැඹුරු ජල ධරය පිළිබඳව සිදු කරන සවිස්තරාත්මක භූජල විද්‍යාත්මක අධ්‍යයනය | කොළඹ සිට මීගමුව දක්වා වෙරල ආශ්‍රිතව ඇති වැලි තීරුව | 78 |
| 02. | පුත්තලම ආශ්‍රිතව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය | කැළණිගංගා ද්‍රෝණිය | 14 |
| 03. | කැළණි ගංගා ද්‍රෝණිය | කැළණි ගංගා ද්‍රෝණිය | 25 |
| 04. | අනුරාධපුර දිස්ත්‍රික්කය තුල සිදු කරන දීර්ඝ කාලීන භූ ජල විද්‍යා අධ්‍යයනය | අනුරාධපුර දිස්ත්‍රික්කය | 32 |
| 05. | වව්නියා - කිලිනොච්චි ප්‍රදේශ ආවරණය කරමින් සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය | වව්නියා-කිලිනොච්චි ප්‍රදේශය | 35 |
| 06. | මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින හුණු ගල් සහිත ජලධරය පිළිබඳව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය | මන්නාරම දිස්ත්‍රික්කය | 55 |
| 07. | කිරිඳි ඔය ජල ද්‍රෝණියේ පහළ ජල ධර ප්‍රදේශය භූ ජල අධ්‍යයනය | කිරිඳි ඔය ද්‍රෝණිය | 25 |

මෙම ව්‍යාපෘතියේ වත්මන් ක්‍රියාකාරකම් වනුයේ ජල සාම්පල එක්රැස් කිරීම, භූගත ජල මට්ටම් පරීක්ෂා කිරීම හා ජල සාම්පල රසායනික විශ්ලේෂණය සිදු කිරීමය.

2018 වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්කය හා සමස්ත ප්‍රගතිය පහත පරිදි වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම | 2018 වර්ෂයේ ඉලක්කය | 2018 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | ජල සාම්පල එක්රැස් කිරීම හා ජල මට්ටම් මිනුම් ගැනීම | 1000 | 100% |
| 02. | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 500 | 100% |




රූප සටහන 1: අධ්‍යයන ප්‍රදේශ



රූප සටහන 2: භූගත ජල නිමනය හා
ජල සාම්පල එක්රැස් කිරීම

## 1.2) කාලගුණික විපර්යාස නිසා භූගත ජලයට ඇති විය හැකි සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳ අධ්‍යයනය (රු. 4.2 මිලියන)

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ගෝලීය කාලගුණික හා දේශගුණික වෙනස් වීම නිසා දිවයිනෙහි මුහුදු බඩ ජල ධරයන්හි ගුණාත්මක බව විචලනය වීම සහ ලවණ සහිත ජලය ගොඩබිමට ඇතුළු වීමේ ප්‍රවණතාවය දීර්ඝ කාලීනව නිරීක්ෂණය කොට එම ජල ධරයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය භූගත ජල දත්ත එක්රැස් කිරීම. මෙම ඉහත අරමුණ සපුරාලීම පිණිස පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම වර්ෂයේදී සිදු කරන ලදි.

- **වෙරළාසන්න භූගත ජලධර - කොළඹ සිට වැලිගම දක්වා හා ඊසාන දිග වෙරළ තීරය**

මෙම අධ්‍යයනය 2014 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය දක්වා නිරිත දිග ප්‍රදේශ ආශ්‍රිතව වැලිගම සිට කළුතර දක්වා මුහුදු බඩ ජල ධරයන්හි පර්යේෂණ නල ළිං 10ක් පමණ ද, ත්‍රිකුණාමලය හා මුලතිව් දිස්ත්‍රික්කයේ නල ළිං 25ක් පමණ ද ඉදිකරන ලද අතර ඒවා ආශ්‍රිතව භූගත ජල මට්ටම් මිනුම් ගත කිරීම, ජල සාම්පල එක් රැස් කිරීම, ඒවා රසායනිකව විශ්ලේෂණය කිරීම සිදු කරන ලදි. මෙහි දී කොග්ගල වෙළඳ කලාපය සහ ගුවන් තොටුපලෙහි ඉදි කොට ඇති පැරණි නල ළිං උපයෝගී කොට ගන්නා ලදි. බටහිර වෙරළ තීරයෙහි දත්ත එක්රැස් කිරීමස්ථාන රූපය තුන 3 – 1 මඟින් දැක්වෙන අතර ත්‍රිකුණාමල හා මුලතිව් දිස්ත්‍රික්කයේ උපයෝගි කර ගන්නා නල ළිං 3 – 2 මඟින් දැක්වේ. දත්ත එක්රුැස් කිරීම මෝසම් වැසි වලට පෙර සහ පසු ලෙස වසර තුල අවස්ථා 4කදි දත්ත එක්රැස් කරන ලස අතරඒ අනුව 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරකම්සම්පූර්ණයෙන් අවසන් කරන ලදි.

මේ අනුව කොළඹ සිට වැලිගම දක්වා දිවෙන බස්නිහිර වෙරළ තීරයේ දීර්ඝ කාලීන අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලද නොගැඹුරු ළිං 46කදිර්සාන දිග වෙරළ තීරයේ දීර්ඝ කාලීන අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලද නොගැඹුරු ළිං 25 ජල මට්ටම් මැනීම හා ජල නියැදි එකතු කිරීම අවස්ථා සිදු කරන ලදි. ( මුළු නියැදි ගණන 58) එකතු කරන ලද ජල නියැදි රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදි. එහිදි අවස්ථා දෙකකදි ක්ෂේත්‍රයේදි ජලයේ ගුණාත්මකභාවයත් පරාමිතින් හතරක් (PH, TDS, Salinity) මනින ලදි. අවස්ථා දෙකකදි ජල සාම්පල රසායනික පරීක්ෂණ සඳහා එක්රැස් කරන ලදි.




රූප සටහන3 - 1කොළඹ සිට වැලිගම දක්වා : භූගත ජලය එක්රැස් කිරීමේ ස්ථාන




රූප සටහන3 - 2 කොළඹ සිට ත්‍රිකුණාමලය දක්වා භූගත ජලය එක්රැස් කිරීමේ ස්ථාන

## 1.3) වකුගඩු ආශ්‍රිත රෝග පවතින දිස්ත්‍රික්ක වල ජලයේ ගුණාත්මක අධ්‍යයනය (රු. මිලියන 4.9)

මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කොට වකුගඩු රෝග ආශ්‍රිත මොනරාගල, කුරුණෑගල, අම්පාර, අනුරාධපුර, පුත්තලම සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක ආවරණය කරන පරිදි භූගත ජලයේ ගුණාත්මක තත්වයන් අධ්‍යයනය කොට පානීය ජලය ලෙස භාවිතා කොට හැකි ජල ප්‍රභව නල ළිං ඉදිකිරීම මඟින් වැඩි දියුණු කොට සිදු කෙරේ.

මෙම වර්ෂයේ අගෝස්තු මස දක්වා පහත ක්‍රියාකාරකම් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම් | වාර්ෂික ඉලක්කය | 2018 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | භූගත ජලපරීක්ෂණ සිදු කිරීම. | 20 | 16 |
| 02. | පරීක්ෂණ නල ළිං ඉදි කිරීම සහ පොම්ප සවි කිරීම. | 20 | 16 |
| 03. | ජල සාම්පලරැස් කිරීම හා විශ්ලේෂණය. | 500 | 100% |



රූපසටහන 4 : නල ළිං ඉදි කිරීම

## 1.4) හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය කිරීම (රු. මිලියන 3.5)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වියළි කාලගුණික නිසා ජල හිඟය පවතින ප්‍රදේශයන්හි හදිසි අවශ්‍යතාවයන්ට භූගත ජලය සම්පාදනය කිරීම. 2018 වර්ෂයේ පහත සඳහන් ක්‍රියාකාරකම් වවුනියාව, මොනරාගල, පුත්තලම, මහනුවර, ගම්පහ, පොළොන්නරුව, අනුරාධපුර, හම්බන්තොට සහ මාතලේ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරන ලදි.

| අනු අංකය | ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2018 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | භූ සමීක්ෂණ සිදු කිරීම | 15 | 15 |
| 02. | නල ළිං ඉදි කිරීම | 15 | 15 |
| 03. | පොම්ප පරීක්ෂණ පැවැත්වීම | 05 | 03 |
| 04. | ජල රසායනික විශ්ලේෂණය | 15 | 15 |
| 05. | දත්ත විශ්ලේෂණය සහ වාර්තා කිරීම | අවසන් කර ඇත | |





රූප සටහන් 5සහ :6 මාතලේ නගරයේ ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම

## 1.5) වියළි කලාපයේ ප්‍රදේශ වල පැරණි අත් පොම්ප නල ළිං පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන (රු. මිලියන 2.0)

බදුල්ල, මොනරාගල, පුත්තලම, කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල පවතින පැරණි නල ළිං පුනරුත්ථාපනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සිදු කෙරේ.

2018 වර්ෂයේ පහත සඳහන් ක්‍රියාකාරකම් නිමවා ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2018 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | අත්පොම්ප අලුත්වැඩියා කිරීමහා විදුලි යන්ත්‍ර යොදවා පැරණි නල ළිං පිරිසිදු කිරීම | 100 | 100 |



රූප සටහන7 : ප්‍රතිසංස්කරණය කරන ලද නල ළිං භාවිතා කිරීම

### 1.6) භූගත ජලයට අදාල පාරිසරික ගැටළු විසඳීමට අවශ්‍ය ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම (රු. මිලියන 5.0)

පස්, බොරළු, මැටි, වැලි කැණීම හා ගල් කැඩීම නිසාත්, භූගත ජලය අධික ලෙස ළිං වලින් පොම්ප කිරීම නිසාත් ඇතිවන භූගත ජල මට්ටම්වල අඩුවීම හා ජල දූෂණය යන පාරිසරික වෙනස්වීම් අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය හා අනෙකුත් සම්බන්ධිත ආයතනයන් හා මනා සම්බන්ධීකරණය සහිතව මෙම අධ්‍යයන හා නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

මේ යටතේ පුත්තලම, කොළඹ, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුරය, මොණරාගල, කෑගල්ල හා කළුතර දිස්ත්‍රික්ක වල සමීක්ෂණ කටයුතු 85ක් සිදු කරන ලදී.



රූප සටහන 8: ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

### 1.7) කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් (රු. මිලියන 5.0)

ජල සම්පත් මණ්ඩලයේ කාර්යය මණ්ඩලයේ හැකියාව වර්ධනය කිරීම නව දැනුමක් ලබාදීම සඳහා 2018 වර්ෂයේ දි විවිධ ක්ෂේත්‍ර වල නිරත කාර්යය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් 13ක් සංවිධානය කරන ලදි. ඒ සඳහා ජල සම්පත් මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් 81 දෙනෙකු සහභාගී විය.

## 2. අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සිදු කරන භූගත ජල සංවර්ධන ව්‍යාපෘතිය

### 2.1) යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල කළමනාකරණ හා සංරක්ෂණ සැලැස්ම සකස් කිරීම (රු.මිලියන 10.0)

යාපනය දිස්ත්‍රික්කය සඳහා භූගත ජල කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණ ඇතිව ක්‍රමවත් විද්‍යාත්මක භූ ජල අධ්‍යයනයක් ජල සම්පත් මණ්ඩලය මගින් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ යාපනය දිස්ත්‍රික්කයේ පවතින සියලුම ළිං ඉන්වෙන්ට්‍රි ගත කිරීම ආරම්භ කරන ලදි.





රූපසටහන 9: වැඩමුළුවක් පවත්වන අවස්ථාවක හා දත්ත රැස් කිරීම

යාපන අර්ධද්වීපයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සිදුකරන ලද නිමාන කටයුතු ළිං සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | නිමාන කටයුතු කළ ළිං සංඛ්‍යාව | අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | නිමාන කටයුතු කළ ළිං සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. | ඩෙල්ෆ් දූපත | 450 | 08. | උඩුවිල් | 3,680 |
| 02. | සන්දිලිපෙයි | 1,020 | 09. | වෙලනෙයි | 460 |
| 03. | කොපෙයි | 1,425 | 10. | වන්කනායි | 469 |
| 04. | පොයින් පේද්රු | 1,020 | 11. | තෙලිප්පලායි | 1,505 |
| 05. | මරුත්තන්කනෙයි | 400 | 12. | කරෙයිනගර් | 560 |
| 06. | කරවෙඩෙයි | 355 | 13. | නල්ලූර් | 1,440 |
| 07. | වාවකච්චේරි | 1,200 | 14. | යාපනය | 1,071 |
| | | | | | |
| එකතුව | | | **15,055** | | |

පළමුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් උසස් අධ්‍යාපන අවසන් කරන ලද සිසුන් 60දෙනෙකු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරි මහතුන් 23 දෙනෙකු සහභාගි කරගනු ලැබූ අතර එයට අදාල දැනුවත් කිරීම් හා භාවිතා කරනු ලබන ක්ෂේත්‍ර කටයුතු සඳහා භාවිතා කරන උපකරණ පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදී.

ඉන්පසු පහත පරිදි යාපන අර්ධද්වීපයේ සියළුම ළිං ආවරණය පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14ක දත්ත රැස් කරන ලදි.

## 2.2) යාන් ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශ වල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය (රු.මිලියන 2.0)

යෝජිත යාං ඔය හා මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රදේශ වල නොගැඹුරු භූගත ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම හා ප්‍රමාණාත්මකභාවය අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම් | වාර්ෂික ඉලක්කය | 2018 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | දත්ත එකරැස් කිරීම | 100% | 100% |
| 02. | භූජල සමීක්ෂණ සිදු කිරීම | 20 | 20 |
| 03. | නල ළිං ඉදිකිරීම | 20 | 20 |
| 04. | ජල ධාරිතා පරීක්ෂණ | 05 | සිදු කිරීමට ඇති |
| 05. | සාම්පල ලබා ගැනීමේ ස්ථාන වල උස මට්ටම් ලකුණු කිරීම | 50 | සිදු කිරීමට ඇති |
| 06. | ජල මට්ටම් මැණීමේ උපකරණ (Water Level Recorder) මිල දී ගැනීම | 03 | සම්පූර්ණ කර ඇත |
| 07. | රසායනික සංඝටක මැණීමේ උපකරණ මිලදී ගැනීම | 01 | සම්පූර්ණ කර ඇත |
| 08. | ජල සාම්පල එක් රැස් කිරීම හා විශ්ලේෂණය | 100 | 50 |
| 09. | දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම | 02 | 01 |
| 10. | දත්ත විශ්ලේෂණය හා වාර්තා සැකසීම | සිදු කරමින් පවති | |

## 2.3) මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශ වල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය (රු.මිලියන 2.0)

යෝජිත යාං ඔය හා මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රදේශ වල නොගැඹුරු භූගත ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම හා ප්‍රමාණාත්මකභාවය අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම් | වාර්ෂික ඉලක්කය | 2018 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | දත්ත එකරැස් කිරීම. | 100% | 100% |
| 02. | භූජල සමීක්ෂණ සිදු කිරීම. | 25 | 25 |
| 03. | නල ළිං ඉදිකිරීම. | 25 | 25 |
| 04. | ජල ධාරිතා පරීක්ෂණ. | 05 | සිදු කිරීමට ඇති |
| 05. | සාම්පල ලබා ගැනීමේ ස්ථාන වල උස මට්ටම් ලකුණු කිරීම | 50 | සිදු කිරීමට ඇති |
| 06. | ජල මට්ටම් මැණීමේ උපකරණ (Water Level Recorder) මිල දී ගැනීම | 03 | සම්පූර්ණ කර ඇත |
| 07. | ජල සාම්පල එක් රැස් කිරීම හා විශ්ලේෂණය. | 100 | 50% |
| 08. | දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. | 02 | සිදු කිරීමට ඇති |
| 09. | දත්ත විශ්ලේෂණය හා වාර්තා සැකසීම. | සිදු කරමින් පවතී | |

## 2.4) නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා නල ළිං ඉදි කිරීම (රු. මිලියන 1.5)

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ආපදා කළමනාකරණ සහා රැස්වීමේ දී ගන්නා ලද තීරණයට අනුව අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ නියඟයෙන් පීඩාවට පත් ප්‍රදේශ වල ජනතාවට සහන සැලසීම සඳහා නල ළිං ඉදි කරන ලදි. එසේ ඉදිකරන ලද නල ළිං විස්තර සංක්ෂිප්තව පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | භූ ජල සමීක්ෂණ | නල ළිං ගණන |
|---|---|---|---|
| 01. | පුත්තලම | 10 | 09 |
| 02. | ගම්පහ | 10 | 04 |
| 03. | වවුනියාව | 01 | 01 |
| 04. | මොනරාගල | 01 | 01 |
| එකතුව | | **22** | **15** |

## 3. උපපාදිත අරමුදල් ඉපැයීම සඳහා සිදු කරන ලද වාණිජ්‍ය ක්‍රියාකාරකම්

පහත සඳහන් වාණිජ්‍ය ක්‍රියාකාරකම් මණ්ඩලය මගින් 2018 වර්ෂයේ සිදු කොට ඇත. මෙම ක්‍රියාකාරකම් රජය සහ රජය නොවන ආයතන ද ජනතාවගේ පෞද්ගලික ඉල්ලීම් මත මණ්ඩලය මගින් ඇස්තමේන්තු කොට වාණිජ්‍ය මට්ටමින් සිදු කරනු ලැබේ.

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|---|
| 01. | භූ සමීක්ෂණ | 403 |
| 02. | නල ළිං ඉදි කිරීම | 122 |
| 03. | අත් පොම්ප ඉදි කිරීම | 71 |
| 04. | පොම්ප පරීක්ෂණ සිදු කිරීම | 290 |
| 05. | නල ළිං පිරිසිදු කිරීම | 16 |
| 06. | ජල රසායනික විශ්ලේෂණය | 669 |

## 4. වෙනත් ක්‍රියාකාරකම්

2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් භූගත ජලය භාවිතය නියාමනය කිරීමට අදාල ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇති වගකීම ඉටු කිරීමට 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකරකම් වල වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | පුද්ගලික නල ලිං ආයතන ලියාපදිංචි කිරීම. | 22 |
| 02. | පුද්ගලික විදුම් යන්ත්‍ර සඳහා ලියාපදිංචි සහතික ලබාදීම. | 151 |
| 03. | වාණිජමය වශයෙන් භූගත ජලය භාවිතා කරන ආයතන ලියාපදිංචි කිරීම. (ගැඹුරු හා නොගැඹුරු නල ලිං හා වල ලිං භාවිතයෙන් වාණිජ කටයුතු සඳහා ජලය ලබා ගන්නා ආයතන) | 153 |
| 04. | වාණිජමය වශයෙන් නල ලිං හා වල ලිං භාවිතා කරමින් වාණිජමය වශයෙන් ජලය ලබා ගන්නා ලිං සඳහා ජල මනු සවි කිරීම. මෙමගින් භූගත ජල පරිභෝජනය නිමානය කිරීම සිදු කරනු ලැබේ. | 53 |
| 05. | පුද්ගලික භූ ජල සමීක්ෂණ වාර්තා ලබාදෙනු ලබන භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීම. (භූ ජල විද්‍යාවෙහි වෘත්තීමය නිපුණතාවයන් ඇති පුද්ගලික භූජල විද්‍යාඥයින් නිසි සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගෙන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කිරීම සිදු කරන ලදි. එම ලියාපදිංචි භූ ජල විද්‍යාඥයින් ලබාදෙන වාර්තා පමණක් ජල සම්පත් මණ්ඩලය මගින් ලිං ඉදිකිරීම සඳහා අනුමත කිරීම සිදු කරනු ලැබේ) | 13 |
| 06. | භූගත ජලය වාණිජමය හා අනෙකුත් කටයුතු සඳහා ලබා ගැනීම මගින් ඇතිවන ගැටළු පිළිබඳ පැමිණෙන පැමිණිලි පිළිබඳ විමර්ශන කිරීම සඳහා ඒකාබද්ධ ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම. | 26 |
| 07. | ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති පුදගලික භූ ජල විද්‍යාඥයින් මගින් ජල සම්පත් මණ්ඩලය වෙත එවන ලද වාර්තා අනුමත කිරීම. | 1391 |

# අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ප්‍රගතිය 2018 - වාරිමාර්ග අංශය

| විගණන ක්‍රියාකාරකම් සඳහා වෙන්කරන ලද අංශයන් | නිකුත් කල විගණන විමසුම්/ වෙනත් | විගණන ක්‍රියාකාරකම් |
|---|---|---|
| අමාත්‍යාංශය | 02 | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - ප්‍රවාහන අංශයට අදාල |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - පහල මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය |
| | | වවුචර් පරීක්ෂාව |
| වාරිමාර්ග කළමනාකරණ අංශය | 05 | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - ඉඟිනිමිටිය රදවි බැඳිඇල නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - වාරිමාර්ග කළ. අංශ ප්‍රධාන කාර්යාලය |
| | | වාහන පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - මුරුතවෙල නේවාසික ව්‍යාපාර කළ. කාර්යාලය |
| | | 10/3/3/24-Sub (P) Lunu අංක දරන ලිපිගොනුවට අදාලව සිදුකල විගණන පරීක්ෂණය |
| | | වවුචර් පරීක්ෂාව |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 11 | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - නිකවැරටිය ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - ඉඟිනිමිටිය ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - ගිංගහ ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - වීරකැටිය ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - සමන්තුරේ ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කළුගල්ඔය ජලාශ ව්‍යාපෘතිය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - නාච්චදූව ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කන්දකැටිය ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - මහනුවර ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කුඩාඔය නේවාසික ඉංජිනේරු කාර්යාලය (උමාඔය පහල නිම්න සංවර්ධන ව්‍යාපෘතිය) |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කන්තලේ යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය |

| | | |
|---|---|---|
| **ජල සම්පත් මණ්ඩලය** | 02 | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - පුත්තලම ජල සම්පත් මණ්ඩල පලාත් කාර්යාලය |
| | | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - ප්‍රධාන කාර්යාලය |
| **කොත්මලේ පුහුණු ආයතනය** | - | වවුචර් පරීක්ෂාව |
| **මල්වතු ඔය ව්‍යාපෘතිය** | 01 | අභ්‍යන්තර විගණන පරීක්ෂණය - මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය |
| **CRIP ව්‍යාපෘතිය** | 02 | මොනරාගල කලාපයේ CRIP ව්‍යාපෘතියට අදාලව සිදුකල අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | | හසලක වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ CRIP ව්‍යාපෘතියට අදාලව සිදුකල අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| **රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම** | ක්‍රියාකර ඇත. | රජයේ විගණන අංශය මගින් නිකුත් කල විගණන විමසුම් 24 ක් සඳහා පිළිතුරු අමාත්‍යාංශ විගණන අංශය හරහා ඉදිරිපත් කර ඇත. |
| **පෙත්සම්වලට අදාලව සහ අනෙකුත් විමර්ෂණ කටයුතු** | 05 (විමර්ෂණ වාර්තා) | රුගම් වාරිමාර්ග කාර්යාලය යටතේ සිදුකල මාවඩිඔඩෙයි අමුණ ඉදිකිරීම් සම්බන්ධ විමර්ෂණ කටයුතු |
| | | කොත්මලේ පුහුණු ආයතනයට අදාලව සිදුකල විමර්ෂණ කටයුතු |
| | | රත්මලාන මධ්‍යම යාන්ත්‍රික වැඩපලේ සිදුකල විමර්ෂණ කටයුතු |
| | | බඳගිරිය වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධ විමර්ෂණ කටයුතු |
| | | කන්තලේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ සිදුකල විමර්ෂණ කටයුතු - වාරිමාර්ග කළමනාකරණ අංශය |
| **විගණන කමිටු රැස්වීම් පැවැත්වීම** | 04 (පවත්වන ලද විගණන කමිටු රැස්වීම්) | 2018-03-27, 2018-06-28, 2018-09-21, 2018-12-27 යන දිනයන් වල විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇත. |

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

**கமத்தொழில், கிராமிய பொருளாதார அலுவல்கள், கால்நடை அபிவிருத்தி, நீர்ப்பாசனம், மீன்பிடி மற்றும் நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு**

**Ministry of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries & Aquatic Resources Development**

PRINTEC | 0112 815 816